# පෙරදිග සංගීතය

# 11 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශය

(2016 සිට ක්‍රියාත්මක වේ)



සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# පෙරදිග සංගීතය

## ගුරු මාර්ගෝපදේශය

## 11වන ශ්‍රේණිය

(2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)


සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විiා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk          විද්‍යුත් තැපැල : info@nie.lk

# පෙරදිග සංගීතය

**11වන ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

**ප්‍රථම මුද්‍රණය 2015**

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපැල** : info@nie.lk

*මුද්‍රණය* : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදී.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2016 වර්ෂයේ දී හත් වන සහ එකොළොස් වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශ්වයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදී. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශය උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශ්වයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමි**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# හැඳින්වීම

අපේ මාතෘභූමියටත්, සංස්කෘතියටත්, සොබාදහම හා සමස්ත ජීව, අජීව විශ්ව ධාතුවටත් හිතකාමී පුරවැසියකු නිර්මාණය කිරීමේ පුළුල් ජාතික පරමාර්ථයෙන් පාසල් පද්ධතිය තුළ දරුවන්ට ඉගෙනීමට ලැබෙන සුවිශේෂතම විෂයය සෞන්දර්ය විෂයයයි. එය ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව ලෙස අප විසින් හඳුනා ගන්නා ලද පහත දැක්වෙන සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම කියැවීමෙන් ඔබට මැනවින් අවබෝධ වනු ඇත.

සෞන්දර්යයෙන් සංස්කෘතිකමය ළැදියා පුබුදුවා, එමඟින් නිර්මාණශීලී බව, සංවේදීතාව, දරා ගැනීම, ශ්‍රී ලාංකේය අනන්‍යතාව හා දේශානුරාගය වඩවා මාතෘ භූමිය කෙරෙහි සංවේදී වූ දරු කැලක් හා සමාජයක් බිහි කිරීම.

("To sensitize students and the community through Aesthetics to the Mother Land, endowed with cultural pride, creativity, Sensitivity, tolerance, partriotism and a sense of national identity")

දේශය ගොඩනැංවීමේ දී විශ්වය සමඟ යහ සබඳතා පවත්වා ගනිමින් පෙරට යන අනාගත පුරවැසියා කෙසේ විය යුතු ද යන්න ගැඹුරින් විමසා බැලීමත් සමඟ මෙතෙක් පැවති සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම අතික්‍රමණය කොට මෙම 2015 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය දෙස නවමු දෘෂ්ටියක් හෙළා ඇති බව එනයින්ම ඔබට පැහැදිලි වනු ඇත.

උසස් රසඥතා ඥානයකින් යුතු මානව හිතවාදී චින්තනයෙහි හෙබි ක්‍රියාශීලී සමාජානුයෝගී පුරවැසියකු ලෙස වැඩලෝකයට පිවිසීමට සෞන්දර්ය අධ්‍යාපනයෙන් ලබන ආධ්‍යාත්මික හා ශාරීරික ප්‍රබෝධය ඉවහල් කර ගැනීම අද්‍යතන සමාජ අවශ්‍යතාවකි.

සෞන්දර්ය අධ්‍යාපනයෙන් දරුවකු තුළ සොඳුරු මෙන් ම නිර්මාණශීලී හැකියාවන් හා චින්තනය ප්‍රවර්ධනය කිරීම ද විනය ගරුක, සදාචාරවත් අභිමානවත් පුරවැසියකු තැනීමේ වගකීම ඉටු කිරීම ද දෙවැනි වන්නේ ආගමෙන් මිනිසාට සැලසෙන සේවාවට පමණි.

එබැවින් විද්‍යා, ගණිත, වාණිජ, තාක්ෂණ හා භාෂා විෂයයන්ගෙන් ඥානනය වන මිනිස් සත්ත්වයාට මිනිස් ගුණ උරුම කර දෙන සෞන්දර්ය අධ්‍යාපනික විෂයයන් ඉගෙනීම එදාටත් වඩා අදට සහ හෙටට අත්‍යවශ්‍ය ම බැව් තරයේ ම කිව යුතු ව ඇත.

මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණයත් සමඟ අභිනවයෙන් 6 ශ්‍රේණියට පැමිණෙන දරුවන් නවමු චින්තනයක් ඇති අළුත් පරපුරක් ලෙස තැනුම උදෙසා පළමු ක්‍රියාකාරකමින්ම ස්වයං පෙලඹවීමක් ඇති වන පරිදි කැමැත්ත හා විශ්වාසය ගුරුවරයා විසින් දිනා ගත යුතු ය. ඒ සඳහා ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන් අතින් විරචිත "ප්‍රාර්ථනාව" නම් වූ කුඩා ළමා ගීයක් දරුවාගේ ජීවන ප්‍රතිඥාවක් ලෙස දිනපතා පාඩම ඇරඹුමට පෙර ගැයුමට අප යෝජනා කරමු.

| | | | |
|---|---|---|---|
| ස ස ස - | ස ස ස - | රි රි රි - | රි රි රි - |
| හො ඳ දේ ඍ | හි ත මී ඍ | හි තු දේ ඍ | කි ය මී ඍ |
| ස රි ස රි | ස ස රි - | රි ස රි ස | ස ස ස - |
| කි යු දේ ඍ | ක ර මී ඍ | ක ර මි න් | හැ දෙ මී ඍ |

මෙම ප්‍රවේශයත් සමඟ ඇරඹෙන සෞන්දර්යයේ වින්දනාත්මක ඉගෙනුම ජාතික, සංස්කෘතික අනන්‍යතා හා විවිධ සම්ප්‍රදායයන් ස්පර්ශ කරමින් විශ්ව චින්තනයක් කරා දරුවාගේ දැනුම, හැකියා හා ආකල්ප පුළුල් කර ගැනීමට හැකි වන පරිදි විෂය කරුණු අප අධ්‍යාපනික හා මනෝ විද්‍යාත්මක පදනමින් යුතු ව ක්‍රමිකව පෙළ ගස්වා ඇත.

එහි දී නායකත්වය, සහභාගිත්වය, ඉදිරිපත් වීම, සුහදත්වය, සාමූහිකත්වය, ඇගැයීම, සවන්දීම, පිළිගැනීම, බෙදාහදා ගැනීම, අන්‍යයන්ට ගරු කිරීම ආදී ආකල්ප සෑම සිසුවකු තුළ ම වර්ධනයට අවස්ථාව සැලසෙන පරිදි අප විසින් යෝජිත ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කරමින් ඉගෙනුම් ඉගැන්වීම් පරිසරය සකසා ගැනීමට ගුරුවරයා වශයෙන් ඔබට ද ඉඩකඩ ඇත.

තවද දෛනික ජීවිතයේ දී මුහුණ දෙන විවිධ ගැටලුවලට සාර්ථකව මුහුණ දී තර්කානුකුල ව හා නිර්මාණාත්මකව චින්තනය මෙහෙයවා ඒවා විසඳා ගැනීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා වර්ධනය කිරීමට ද අප විසින් වත්මන් පරපුරට දායකත්වය සැපයිය යුතු ව ඇත.

එබැවින් ගුරු භවතුන් ලෙස ඔබ මෙම ගුරු මාර්ගෝපදේශය පෙරට වඩා හොඳින් පරිශීලනය කරන්නේ නම් ඔබගේ ද චින්තනයට අලුත් ආලෝකයක් හා ප්‍රබෝධයක් ලැබෙනු ඇත. ඒ ආලෝක කිරණ ජාතියේ දරු කැල මත පතිතව ඔවුන් ද ඉමහත් ප්‍රබෝධයෙන් මෙම විෂයය ඉගෙනීමට යොමු වනු නො අනුමානය.

එසේ ම කායික හා මානසික සමබරතාවෙන් හෙබි සෞඛ්‍ය සම්පන්න මෙන් ම නීරෝගී දිවිපෙවතක් ගත කිරීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා සංවර්ධනය කිරීම හා යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනංවා ගනිමින් ජාතික හා ජාත්‍යන්තර තලයේ නොසැලී කටයුතු කිරීමට විචාරශීලී මනසකින් හෙබි පුද්ගලයකු බිහි කිරීමට වගවීම සෞන්දර්ය අධ්‍යාපන විෂය භාර ව කටයුතු කරන ඔබ අප සැමගේ වගකීම වේ.

ඒ සඳහා 2015 වසරේ සිට 6 ශ්‍රේණියෙන් ඇරඹී ක්‍රියාත්මක වන මෙම නව ප්‍රතිසංස්කරණය දරුවන් හරහා අපි සැම නවමු ලොවකට පිවිසීමේ වැදගත් අවස්ථාවක් ලෙස දකිමින් උද්යෝගයෙන් හා කැපවීමෙන් වඩාත් ඵලදායි සේවාවක් සැලසීමට කැප වෙමු.

**අධ්‍යක්ෂ (සෞන්දර්ය)**
**ජාතික අධ්‍යාපන ආයතනය**

# විෂයමාලා කමිටුව

| | |
|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **විෂය සම්බන්ධීකරණය** | ජානකී පතිරණගේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

## ලේඛක මණ්ඩලය

**බාහිර සම්පත් දායකත්වය**

| | |
|---|---|
| ඩබ්. වී. ජී. විතානගේ | අතිරේක කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර. |
| කපිල මැද්දෙගොඩ | කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පානදුර. |
| කේ. කේ. එස්. ජයවික්‍රම | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික),<br>කලාප අධ්‍යාපන කාර්යාලය, පිළියන්දල. |
| ශාන්තා රමණී ඩයස් | ගුරු උපදේශක (විශ්‍රාමික),<br>කලාප අධ්‍යාපන කාර්යාලය, ගම්පහ |
| ආර්. ඩී. පෙරේරා | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, මහනුවර. |
| ඊ. ඒ. ප්‍රේමසිරි | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කළුතර. |
| කපිල වීරසිංහ | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල. |
| රංජිත් ප්‍රියන්ත සිල්වා | ගුරු සේවය, ජනාධිපති විද්‍යාලය, මීනුවන්ගොඩ. |

**අභ්‍යන්තර සම්පත් දායකත්වය**

| | |
|---|---|
| සුදත් සමරසිංහ | අධ්‍යක්ෂ, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව. |
| ජානකී පතිරණගේ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව. |

**භාෂා සංස්කරණය**

| | |
|---|---|
| අමරසිරි වික්‍රමරත්න | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>භාෂා අධ්‍යයනාංශය<br>අග්නිදිග විශ්ව විද්‍යාලය, ඔළුවිල්, අඩ්ඩාලච්චේන. |

| | |
|---|---|
| **පරිගණක යතුරු ලියනය** | ඩබ්ලිව්. එම්. ධම්මිකා |
| **පිටකවර නිර්මාණය** | රවීන්ද්‍ර තේනුවර |
| **විවිධ සහය** | ඊ. එම්. වික්‍රමනායක<br>ප්‍රේමරත්න පෙරේරා |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

සෞන්දර්ය අධ්‍යාපනය යටතේ පෙරදිග සංගීතය විෂයයක් වශයෙන් හැදෑරීමෙන් දරුවාට පාසල් ජීවිතය තුළ පමණක් නොව පසු කාලීනව ද තම ජීවිත පැවැත්ම සඳහා අවශ්‍ය වන සංවේදී අධ්‍යාත්මයක් හා නිපුණතා වර්ධනය කර ගැනීමට හැකි වනු ඇත. උක්ත කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙවර ප්‍රධාන නිපුණතා 9ක් හඳුන්වා දී ඇති අතර එම නිපුණතා කරා ළඟා වීමට අත්‍යවශ්‍ය නිපුණතා මට්ටම් පෙළක් ද හඳුන්වා දී ඇත. එම නිපුණතා මට්ටම්වල ඉහළ නිපුණතා මට්ටම් කරා සිසුවා ළඟා කරවීම 11වන ශ්‍රේණියේ දී අපේක්ෂිත ය.

මෙම නව විෂය නිර්දේශය සැකසීමේ දී, පෙරදිග සංගීත ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලවලින් ලබා ගත් දත්ත, ජාතික මට්ටමේ විභාග පරීක්ෂකවරුන්ගේ වාර්තා ඇසුරෙන් සිසුන් තුළ විශේෂයෙන් සංවර්ධනය විය යුතු විෂය කොටස් පිළිබඳ තොරතුරු පාදක කර ගන්නා ලදී එසේ ම පළාත් බද සේවාස්ථ අධ්‍යයන සැසි, විෂය නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පාසල් නියාමන පර්යේෂණ වාර්තා, කලාප මට්ටමෙන් පවත්වන ලද කාර්ය බද්ධ පරීක්ෂණ දත්ත, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ගේ හා විද්‍යාර්ථීන්ගේ අදහස්, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයන්හි තූර්ය වාදක කණ්ඩායම්වල අදහස්, සංගීත විෂය හදාරන ලද විද්වතුන්ගේ අදහස්, විද්‍යුත් මාධ්‍යයන්හි විකාශය වූ සාකච්ඡා හා වැඩසටහන් ඇසුරෙන් ලබා ගත් තොරතුරු මෙන් ම පාසල් පද්ධතියේ පෙරදිග සංගීත විෂය ඉගැන්වීම් කරන ගුරුභවතුන්ගේ හා දෙමව්පියන්ගේ අදහස් ද විෂය නිර්දේශ සම්පාදනයේ දී විශේෂයෙන් අවධානයට ලක් කරන ලදී.

විෂය නිර්දේශය ප්‍රායෝගික නැඹුරුතාවයකින් යුතු ව ගොඩනගා ඇති අතර ක්‍රියාකාරකම් සඳහා හඳුන්වා දී ඇති ගුණාත්මක යෙදවුම් හැකිතාක් යොදා ගනිමින් පාඩම සංවර්ධනය කිරීම ගුරුභවතාගේ වගකීමයි. පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ හඳුන්වා දී ඇති නිදර්ශක ඇගයීම් උපකරණ ග්‍රන්ථය ඇසුරු කර ගනිමින් දරුවන්ගේ ඇගයීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට ඔබට සක්‍රීයව දායක වීමට සිදු වේ. එසේ ම ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසු වන ආකාරයට ඉතා දක්ෂ ලෙස ප්‍රායෝගික කොටස්වල නිපුණත්වයට දරුවා ළඟා කරවීම ද, පෙළඹවීම ද ගුරුභවතාගේ වගකීම වේ.

ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී හඳුන්වා දී ඇති ප්‍රවේශවලට අමතර ව වෙනත් සුදුසු ක්‍රමවේද නිර්මාණශීලීව යොදා ගැනීමේ හැකියාව හා නිදහස ඔබට ඇත. ක්‍රියාකාරකමෙහි දක්වා ඇති ඉගෙනුම් පල ළඟා කර ගත හැකි වන අයුරින් වඩාත් ඵලදායි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සැලසුම් කර ගැනීම තුළින් සාර්ථක ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට ඔබට හැකි වනු ඇත.

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්හිමිගේ පණිවිඩය | iv |
| හැඳින්වීම | v-vi |
| විෂයමාලා කමිටුව | vii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | viii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | x-xiii |
| වාර සටහන | xiv-xv |
| ක්‍රියාකාරකම් සන්තතිය | 01-74 |

# 11 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | 1.1 රාගධාරී සංගීතයට අදාළ ව අධ්‍යයනය කළ ගායන සහ වාදන හැකියා ප්‍රසංගාත්මකව ප්‍රදර්ශනය කරයි.<br>1.2 රාගධාරී සංගීතයට අදාළ ව අධ්‍යයනය කළ තාල හැකියා ප්‍රදර්ශනය කරයි. | • බිලාවල්, භූපාලි, කාෆි, භෛරවී, යමන් යන රාගවල මධ්‍යලය ගීත නැවත අභ්‍යාසය<br>• එම රාගවලින් තෝරාගත් රාග දෙකකට අදාළ තානාලංකාර<br>• දාදරා, ත්‍රිතාල්, කෙහෙර්වා, ජප්තාල්, දීප්චන්දි, ඛෙම්ටො, රූපක් ප්‍රස්තාර කිරීම අතින් තාල නිරූපණය සහ තබ්ලාවෙන් හඳුනා ගැනීමේ අභ්‍යාස | 1. බිලාවල්, භූපාලි, කාෆි, භෛරවී, යමන් යන රාගවල මධ්‍යලය ගීත සහ තානාලංකාර ගායන වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.<br>2. නිර්දේශිත තාල අතින් නිරූපණය කර වෙන් කොට දක්වයි. | 16 |
| 2.0 වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 2.1 වාදන දක්ෂතා ප්‍රසංගාත්මකව ප්‍රදර්ශනය කරයි. | • ස්වර පුවරු භාණ්ඩ වාදනය<br>• තෝරා ගත් සංගීත භාණ්ඩ වාදනය | 1. ශිල්පීය තත්වයෙන් ස්වර පුවරු භාණ්ඩ වාදනයේ ප්‍රායෝගික දක්ෂතා ප්‍රදර්ශනය කරයි. | 08 |
| 3.0 සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරුවෙයි. | 3.1 ව්‍යවහාරික සංගීත අංග ලෙස නිර්මාණය වී ඇති ගායන වාදන පිළිබඳ සාකච්ඡා කරමින් ප්‍රායෝගික රසාස්වාදයක යෙදෙයි. | • රාගාශ්‍රිත සරල ගී<br>• නාට්‍ය ගී ඇසුරින් (අන්දරේලා, කුසපබාවතී, තාරාවෝ ඉගිලෙති, රතුහැට්ටකාරී, මී පුර වැසියෝ, විකෘති, තටු, අබුද්දස්ස කෝළම, මධුර ජවනිකා, අංගාරා ගඟ ගලාබසී යන නාට්‍යවලින් එක් නාට්‍යයක ඇතුළත් ගීතයක්) | 1. සරල ගීවල ඇති රාගාශ්‍රිත ස්වභාවය පිළිබඳ තාලානුකූලව අදහස් දක්වයි.<br>2. තෝරාගත් නාට්‍ය ගී ගයමින් රස විඳියි. | 04 |

# 11 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.2 බටහිර සම්භාව්‍ය සංගීතයේ සංධ්වනිවල ස්වභාවය විමසමින් රසාස්වාදයේ යෙදෙයි.<br><br>3.3 ලබාගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසංගිකව ඉදිරිපත් කරමින් සතුට ලබයි. | • බිතෝවන් සහ මොසාර්ට් යන සංගීතඥයින් පිළිබඳ තොරතුරු සහ නිර්මිත සංධ්වනි<br>• යානි සංගීතඥයාගේ නිර්මාණ ඇසුරින්<br>• වාර්ෂික විවිධ ප්‍රසංගය | 3. බටහිර සම්භාව්‍ය සංගීතඥයින් අතරින් බිතෝවන්, මොසාට් සහ යානි යන සංගීතඥයින්ගේ නිර්මාණ රසවිඳිමින් අගය කරයි.<br><br>4. උගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසංගික ව ඉදිරිපත් කරයි. | 09 |
| 4.0 දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි. | 4.1 සබරගමු සහ පහතරට සම්ප්‍රදායන්ට අයත් වන්නම්වල ස්වභාවය විමසමින් ගායනා කරයි. අගය කරයි. | • සබරගමු වන්නම් (කෝකිල)<br>• පහතරට සින්දු වන්නම් (නලු ගීතිකා තාලය) | 1. කෝකිල වන්නම සහ පහතරට සින්දු වන්නම් ප්‍රායෝගික ව ප්‍රදර්ශනය කරමින් වෙනස පැහැදිලි කරයි.<br>2. දේශීය සංස්කෘතිය රැක ගැනීමට පෙළඹෙයි. | 04 |
| 5.0 සරල සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි. | 5.1 ශ්‍රී ලංකාවේ චිත්‍රපට ගීතවල නිර්මාණාත්මක අගය තර්කානුකූලව විමසමින් තෝරාගත් ගීත ගායනය කරයි.<br><br>5.2 මව් පිය ගුණවරුණ සඳහන් ගීත ගායනා කරයි. රසවිඳියි. | • රේඛාව චිත්‍රපටයේ සංගීතය හා ගීතයක් ගායනය<br>• සත්සමුදුර චිත්‍රපටයේ සංගීත නිර්මාණය<br>• තෝරා ගත් ගීතයක් ගායනය (අශෝකමාලා, සැඩසුළං, රන්මුතු දූව, ගැටවරයෝ, නිල්ල සොයා, හුලවාලි, රැන ගිරව්)<br><br>• අන්දරයාගේ, අම්මාවරුනේ | 1. තෝරා ගත් ශ්‍රී ලාංකික චිත්‍රපටවල ඇතුළත් ගීත ගයා වයා රසවිඳියි.<br>2. මුල් යුගයේ චිත්‍රපටවල සංගීත නිර්මාණය සහ සත්සමුදුර චිත්‍රපටයේ සංගීත නිර්මාණය අතර ඇති වෙනස පිළිබඳ තර්කානුකූල ව අදහස් දක්වයි.<br>3. 60-70 දශකවල ප්‍රචලිත ශ්‍රී ලාංකීය චිත්‍රපට ගීත ගයමින් අගය කරයි.<br>4. අද්‍යතන මව්පිය ගුණ වරුණ ඇතුළත් ගී ගයමින් රස විඳියි. | 05 |

# 11 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි. | 6.1 නාඩගම් සහ නූර්ති සංගීතයේ ඇති වෙනස සන්සන්දනාත්මකව ප්‍රායෝගිකව දක්වයි.<br>6.2 සොකරි රංග සම්ප්‍රදාය හඳුනා ගනිමින් ගීත ගායනය. | • නූර්ති ගීත සහ නාඩගම් ගීත අතර සංගීතයේ වෙනස<br>• නූර්ති සංගීතයේ රාගධාරී පසුබිම<br>• සොකරි සංස්කෘතික පසුබිම<br>• සොකරි ගීත ගායනය | 1. නූර්ති සහ නාඩගම් අතර සංගීතමය වෙනස ප්‍රායෝගික ව පැහැදිලි කරයි.<br>2. සොකරි රංග සම්ප්‍රදාය අධ්‍යයනය කරමින් ගීත ගයයි. | 10 |
| 7.0 සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදා බැලීම් කරයි. | 7.1 ව්‍යවහාරික සංගීතයේ ස්වභාවය හඳුනා ගනිමින් ඒ හා සම්බන්ධ සරල නිර්මාණයක යෙදෙයි. | • කෝඩ්ස් සංකල්පය (Chords)<br>• C.Major, F.Major, G.Major ගොඩනැගෙන අයුරු සහ ඒ ආශ්‍රිත නිර්මාණ<br>• C.Minor, F.Minor, G.Minor ගොඩනැගෙන අයුරු සහ ඒ ආශ්‍රිත නිර්මාණ<br>• Harmony සිද්ධාන්තය මත නිර්මාණ කිරීම<br>• පෙරදිග ස්වර ප්‍රස්තාරයක් අපර දිග ක්‍රමයට ප්‍රස්තාර කිරීම | 1. සංගීත නිර්මාණය සඳහා අවශ්‍ය බටහිර සංගීත සංකල්පවල සිද්ධාන්තමය තොරතුරු ප්‍රායෝගික ව භාවිත කරයි.<br>2. පෙරදිග හා අපරදිග ස්වර ප්‍රස්තාර කිරීමේ විධි සංසන්දනය කරයි. | 06 |
| 8.0 සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමුකිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි. | 8.1 විවිධ ස්වර ශ්‍රැති කර ගනිමින් ප්‍රස්තාරකරණයේ යෙදෙයි. | • කෝමළ නිෂාදය ශ්‍රැති කර ගනිමින් ආරෝහණ අවරෝහණ ස්වර පිහිටන අයුරු සහ ප්‍රස්තාරකරණය (B flat Major/B flat Minor Scale)<br>• මධ්‍යමය ශ්‍රැති කර ගනිමින් ආරෝහණ අවරෝහණ ස්වර පිහිටන අයුරු සහ ප්‍රස්තාරකරණය (F Major/Minor Scale) | 1. පංචමය හා මධ්‍යමය ශ්‍රැති කර ගනිමින් ගීත ප්‍රස්තාර කරයි.<br>2. Major/Minor සිද්ධාන්තය ප්‍රායෝගික ව දක්වයි. | 06 |

# 11 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • පංචමය ශ්‍රැති කර ගනිමින් ආරෝහණ අවරෝහණ ස්වර පිහිටන අයුරු සහ ප්‍රස්තාරකරණය ( G. Major/Minor Scale) | | |
| 9.0 සංගීතයේ තාක්ෂණික මෙවලම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි. | 9.1 සංගීතය පටිගත කිරීමේ ක්‍රමශිල්ප හඳුනා ගනිමින් සංසන්දනාත්මක විචාරයක යෙදෙයි.<br><br>9.2 පරිගණකය උපයෝගී කර ගනිමින් විශ්ව සංගීත ක්ෂේත්‍ර ඇසුරු කිරීමේ හුරුව ලබයි. | • Audio Cassette සහ කැසට් වාදන යන්ත්‍ර<br>• Video Cassette • CD, DVD, Blue Ray<br>• Music Recording using Multy Track<br>• Audio & Video Format<br>• Internet<br><br>• Internet & Music<br>• Web site for Indian Music<br>• Web site for world Music | 1. සංගීතය සංරක්ෂණය කිරීම සඳහා යොදා ගෙන ඇති නූතන තාක්ෂණික මෙවලම් වෙන් කොට දක්වයි.<br><br>2. පරිගණකය භාවිතයෙන් සංගීත පටිගත කිරීමේ ක්‍රම අත්හදා බලයි.<br><br>3. අන්තර්ජාලය ඇසුරෙන් සංගීතය අධ්‍යයනයට පෙලඹෙයි. | 04 |

# 11 ශ්‍රේණිය - පෙරදිග සංගීතය
## වාර සටහන

| පළමු වාරය | | | |
|---|---|---|---|
| නිපුණතා මට්ටම | අනුක්‍රමික පාඩම් අංකය | විෂය මාතෘකාව/ ක්‍රියාකාරකම | කාලච්ඡේද |
| 1.1 රාගධාරී සංගීතයට අදාළව අධ්‍යයනය කළ ගායන සහ වාදන හැකියා ප්‍රසංගාත්මකව ප්‍රදර්ශනය කරයි | 01<br>02 | ● බිලාවල්, භූපාලි, කාෆි යන රාගවල මධ්‍යලය ගීත නැවත අභ්‍යාස<br>● එම රාගවලින් එක් රාගයකට අදාළ තානාලංකාර | 04<br>02 |
| 1.2 රාගධාරී සංගීතයට අදාළව අධ්‍යයනය කළ තාල හැකියා ප්‍රදර්ශනය කරයි. | 03<br>04 | ● දාදරා, ත්‍රිතාල්, කෙහෙර්වා, ජප්තාල්, දීප්චන්දි, බෙමටෝ යන තාල පද ප්‍රස්තාර කිරීම<br>● එම තාල පද අතින් තාල පද නිරූපණය සහ තබ්ලාවෙන් හඳුනා ගැනීමේ අභ්‍යාස | 02<br>02 |
| 4.1 සබරගමු සහ පහතරට සම්ප්‍රදායන්ට අයත් වන්නම් වල ස්වභාවය විමසමින් ගායනය කරයි. අගය කරයි. | 05 | ● සබරගමු වන්නම් (කෝකිල) | 02 |
| 2.1 වාදන දක්ෂතා ප්‍රසංගාත්මකව ප්‍රදර්ශනය කරයි | 06<br>07 | ● ස්වරපුවරු භාණ්ඩ වාදනය.<br>● තෝරා ගත් සංගීත භාණ්ඩ වාදනය | 04<br>04 |
| | දෙවන වාරය | | |
| 1.1 රාගධාරී සංගීතයට අදාළව අධ්‍යයනය කළ ගායන සහ වාදන හැකියා ප්‍රසංගාත්මකව ප්‍රදර්ශනය කරයි | 08<br>09 | ● භෛරවී යමන් යන රාගවල මධ්‍යලය ගීත නැවත අභ්‍යාස<br>එම රාගවලින් එක් රාගයකට අදාළ තානාලංකාර | 04<br>02 |
| 3.1 ව්‍යවහාරික සංගීතාංග ලෙස නිර්මාණය වී ඇති ගායන වාදන පිළිබඳ සාකච්ඡා කරමින් ප්‍රායෝගිකව රසාස්වාදයේ යෙදෙයි. | 10 | ● රාගාශ්‍රිත සරල ගී | 02 |
| 4.1 සබරගමු සහ පහතරට සම්ප්‍රදායන්ට අයත් වන්නම් වල ස්වභාවය විමසමින් ගායනය කරයි. අගය කරයි. | 11 | ● පහතරට හින්දු වන්නම් (නලුගීතිකා තාලය) | 02 |
| 3.1 ව්‍යවහාරික සංගීතාංග ලෙස නිර්මාණය වී ඇති ගායන වාදන පිළිබඳ සාකච්ඡා කරමින් ප්‍රායෝ-ගිකව රසාස්වාදයේ යෙදෙයි. | 12 | ● නාට්‍ය ගී ඇසුරින් පහත නාට්‍යවලින් අනුමත එක් ගීතයක් (අන්දරේලා) | 02 |

| | | | |
|---|---|---|---|
| | <br><br><br><br><br><br><br>13 | කුසපබාවතී<br>(තාරාවෝ ඉගිලෙති, සෝබාව දේ)<br>(රතුහැට්ටකාරී, යස ඉසුරු)<br>(මීපුර වැසියෝ, කාටත්බැරි කුණුකන්දල්)<br>(තටු - අපි කිරිල්ලියෝ)<br>(අබුද්දස්ස කෝළම -<br>(මධුර ජවනිකා, නෙයිනගෙ සූදුව) | 02<br><br><br><br><br>) |
| 3.2 බටහිර සම්භාව්‍ය සංගීතයේ සංධ්වනි වල ස්වභාවය විමසමින් රසාස්වාදයේ යෙදෙයි. | 14<br><br><br>15 | ● බීතෝවන් සහ මොසාර්ට් යන සංගීතඥයින් පිළිබඳ තොරතුරු නිර්මිත සංධ්වණි<br>යානී සංගීතඥයාගේ නිර්මාණ ඇසුරින් | 02<br><br><br>01 |
| 7.1 ව්‍යවහාරික සංගීතයේ ස්වභාවය හඳුනා ගනිමින් ඒ හා සම්බන්ධ සරල නිර්මාණයක යෙදෙයි. | 16<br><br><br>17<br><br><br>18<br><br>19 | ● කෝඩ්ස් සංකල්පය (Chords)<br>● C. Major, F. Major, G. Major, ගොඩ නැගෙන අයුරු සහ ඒ ආශ්‍රිත නිර්මාණ<br>● C. Major, F. Major, G. Major, ගොඩ නැගෙන අයුරු සහ ඒ ආශ්‍රිත නිර්මාණ<br>● Harmony සිද්ධාන්ත මත නිර්මාණ කිරීම පෙරදිග ස්වර ප්‍රස්තාරයක් අපරදිග ක්‍රමයට ප්‍රස්තාර කිරීම | 01<br><br>01<br><br><br>01<br><br><br>02 |
| 6.1 නාඩගම් සහ නූර්ති සංගීතයේ ඇති වෙනස සංසන්දනාත්මකව ප්‍රායෝගිකව දක්වයි. | 20<br><br>21 | ● නූර්ති ගීත සහ නාඩගම් ගීත අතර සංගීතයේ වෙනස<br>● නූර්ති සංගීතයේ රාගධාරී පසුබිම | 04<br><br>02 |
| | තෙවන වාරය | | 02 |
| 5.1 ශ්‍රී ලංකාවේ චිත්‍රපට ගීතවල නිර්මාණාත්මක අගය තර්කානුකූලව විමසමින් තෝරාගත් ගීත ගයයි. | 22<br><br>23<br>24 | ● රේඛාව චිත්‍රපටියේ සංගීතය සහ තෝරාගත් ගීත ගායනය (සුදුසඳ එළියේ)<br>● සත්සමුදුර චිත්‍රපටියේ සංගීත නිර්මාණය<br>● තෝරාගත් චිත්‍රපටි ගීතයක් ගායනය<br>(සැඩසුළං - ඉදිරියටා යමු සැවොමා)<br>(රන්මුතු දූව - පිපී රේණු නටන)<br>(ගැටවරයෝ - ආරිච්චි බෝරිච්චි)<br>(සත්සමුදුර - සිනිඳු සුදුමුතු)<br>(එක්ටැම් ගේ - උන්මාද සිතුවම්)<br>(හුලවාලි - කුල ගෙදරින්) | 01<br><br>01<br><br>02 |
| 5.2 මව්පිය ගුණවරුණ සඳහන් ගීත ගායනය කරයි රසවිඳියි. | 25 | ● අන්දරයායේ - අම්මාවරුනේ යන ගී වලින් එක් ගීතයක්. | |

| | | | |
|---|---|---|---|
| 6.2 සොකරි රංග සම්ප්‍රදාය හඳුනා ගනිමින් ගීත ගායනය | 25 | | 01<br>01 |
| 9.1සංගීතය පටිගත කිරීමේ ක්‍රම ශිල්ප හඳුනා ගනිමින් සංසන්දනාත්මක විචාරයක යෙදෙයි. | 29<br>30 | | |
| 9.2 පරිගණකය උපයෝගී කරගනිමින් විශ්ව සංගීත ක්ෂේත්‍ර ඇසුරුකිරීමේ හුරුව ලබයි. | 31 | | |
| 3.3 ලබා ගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසාංගිකව ඉදිරිපත් කරමින් සතුට ලබයි | 32 | | |
| | | | |
| | | | |

**ක්‍රියාකාරකම් 01**

# බිලාවල්, භූපාලි, කාෆි යන රාගවල මධ්‍යලය ගීත
# නැවත අභ්‍යාස

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන /වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : රාගධාරී සංගීතයට අදාළ ව අධ්‍යයනය කළ ගායන සහ වාදන හැකියා ප්‍රසංගාත්මකව ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** : බිලාවල්, භූපාලි, කාෆි යන රාගවල මධ්‍යලය ගීත නැවත අභ්‍යාස කිරීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :
- මධ්‍යලය ගීත ඉදිරිපත් කිරීමේ දී රාගයට අදාළ ආරෝහණ අවරෝහණ ගායන/වාදන හැකියාව අත්‍යවශ්‍ය බව පිළිගනියි.
- රාගවලට අයත් විකෘති ස්වර, විවාදි ස්වර, වර්ජිත ස්වර අවධානයෙන් යුතුව භාවිත කරයි.
- මධ්‍යලය ගීත නිවැරදිව ගායන / වාදන කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- තාම්පුරාව, ශ්‍රැති මංජුසාව, හාර්මෝනියම්, තබ්ලාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

- බිලාවල් රාගයට අදාළ ආරෝහණ සහ අවරෝහණ නියමිත ශ්‍රැතිමත පිහිටුවමින් ගායනය/වාදනය කිරීමේ හැකියාව වර්ධනය කිරීම සහ මධ්‍යලය ගීතය, ස්ථායි අන්තරා වශයෙන් නිවැරදිව ගායනය/ වාදනය කිරීමේ කුසලතාවය වර්ධනය කරවීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂා කෙරේ. භූපාලි, කාෆි රාගවල මධ්‍යලය ගීත නැවත අභ්‍යාස කිරීම සඳහා මිනිත්තු 40 බැගින් යොදා ගන්න. ඉතිරි මිනිත්තු 40 මෙම රාග 03 පිළිබඳ පුනරීක්ෂණ සඳහා යොදා ගන්න.

**පියවර 01**
- මීට පෙර ශ්‍රේණිවලදී බිලාවල් රාගයේ ඉගෙන ගත් මධ්‍යලය ගීතය සිසුන් සමග ගායනය/වාදනය කරන්න. නියමිත ශ්‍රැතියෙහි නිවැරදිව පිහිටුවමින්, ආරෝහණ අවරෝහණ ඉදිරිපත් කිරීමට අවස්ථාව සලස්වන්න.

(මිනිත්තු 05)

**පියවර 02**
- ගීතයේ ස්ථායී සහ අන්තරා කොටස්, නිවැරදිව රසවත්ව ගායනයට යොමු කරවමින් රාගධාරී සංගීතයේ ශිල්ප ක්‍රම, එනම් මූර්කි, ගමක්, කණ්, මීන්ඩ් ස්වර පිළිබඳව රාගයට උචිත වන පරිදි යෙදෙන අයුරු දැනුවත් කරවමින් ප්‍රාසංගිකව ඉදිරිපත් කිරීමට මග පෙන්වන්න. තාලයට අනුගතවන සේ විවිධ ශිල්ප ක්‍රම යොදා ගනිමින් "සම්" එකට ළඟාවන අයුරු උදාහරණ මගින් පෙන්වා දෙන්න.

(මිනිත්තු 25)

**පියවර 03**
- සමස්ත ගීතය සිසුන් ලවා කණ්ඩායම් වශයෙන් ඒකල වශයෙන් ගායනයට/වාදනයට යොමු කරවන්න. සදොස් තැන් නිදොස් කරන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

- නිවැරදි ශ්‍රැතියේ පිහිටා ආරෝහණ, අවරෝහණ සහ ගීතයේ නිවැරදි තනුව ස්ථායි, අන්තරා වශයෙන්, ස්වර ස්ථාන නිවැරදිව හා ලය පවත්වා ගනිමින්, ඒකලව, සාමූහිකව හා කණ්ඩායම් වශයෙන් අගයන්න.
- දක්ෂතා ඇති සිසුන්ට විශේෂ ඇගයීමක් කරන්න. සෙසු කණ්ඩායම් වලද ප්‍රබලතා හා දුබලතා අගයන්න.

පැවරුම - මෙතෙක් උගත් රාගයන්ට අදාළ මධ්‍යලය ගීත, සිංහල හා හින්දි වශයෙන් එකතුවක් කරවන්න.

අතිරේක උදව් - 2008 - 11 ශ්‍රේණිය - ගුරුමාර්ගෝපදේශය.

# බිලාවල්, භූපාලි, කාෆි යන රාගවලින් එක් රාගයකට අදාළ තානාලංකාර ගායනය/වාදනය

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායනය/වාදනය ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** : රාගධාරී සංගීතයට අදාළව අධ්‍යයනය කළ ගායන සහ වාදන හැකියා ප්‍රසංගාත්මකව ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** : බිලාවල්, භූපාලි, කාෆි යන රාගවලින් එක් රාගයකට අදාළ වනසේ තානාලංකාර ගායනය/වාදනය කිරීම. (බිලාවල් රාගය)

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- බිලාවල් භූපාලි, කාෆි යන රාගවලින් එක් රාගයකට අදාළ තානාලංකාර නිවැරදිව ගායනය/වාදනය කරයි..
- තානාලංකාර, තාලානුකූලව ඉදිරිපත් කරයි.
- ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- හාර්මෝනියම්, තබ්ලාව, ශ්‍රැතිමංජුසාව.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

11 ශ්‍රේණිය සඳහා කැමති රාග දෙකකට අයත් තානාලංකාර සිසුන් අධ්‍යයනය කළ යුතු වේ. මෙහිදි බිලාවල් භූපාලි, කාෆි යන රාගවලින් එක් රාගයක් පළමු වාරයේදීත්, භෛරවී, යමන් යන රාගවලින් එක් රාගයක 11 වන වාරයේදීත් අධ්‍යයනය කළයුතුය.

**පියවර 01**
- ඔබ කැමති රාගයකට අදාළ ස්වර අභ්‍යාස කිහිප වරක් ගායනා කරවන්න. ස්වර සංගති මතුකර දක්වමින් ස්වර අභ්‍යාස තුළින් තානාලංකාරයක් ගොඩ නගා ගන්නා ආකාරය උදාහරණ සහිතව පෙන්වන්න. මීට පෙර ඉගෙන ගත් තාන වර්ග පිළිබඳව මතකයට නංවමින් "අ" කාරයෙන්, ස්වර වලින්, ගීතයේ වචන වලින්, තානාලංකාර ගොඩනගා ගැනීමට අවස්ථාව සලස්වන්න

(මිනිත්තු 15)

**පියවර 02**
- කෙටි සහ දීර්ඝ වශයෙන් ගුරු භවතා විසින් නිර්මාණය කරන ලද තානාලංකාර 4 ක් සිසුන් ලවා ගායනයට/වාදනයට යොමු කරවන්න. මධ්‍යලය ගීතයට අලංකාරයක් එක්වන පරිදි විවිධ තාන ක්‍රම, තාලයේ විවිධ තාලස්ථාන වලින් ආරම්භ කර ගීතයේ මුඛඩා කොටස උද්දීපනය වන පරිදි සමස්ථානයට පිවිසීම වැනි ශිල්ප ක්‍රම ප්‍රසංගාත්මකව ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරවන්න. රාගයේ ආරෝහණ අවරෝහණ විදහා දැක්වීමට වඩා රාගයේ භාවය ප්‍රකාශවන පරිදි සිසුන්ට ගායනය වාදනය කළ හැකි තාන නිර්මාණය කිරීමට මග පෙන්වන්න.

(මිනිත්තු 25)

**පියවර 03**
- මධ්‍යලය ගීතය තානාලංකාර සහිතව ගායනයට / වාදනයට යොමු කරවන්න.
- ඒකලව, සාමුහිකව හා කණ්ඩායම් වශයෙන් ගායනයට / වාදනයට යොමු කරවන්න. විවිධ ක්‍රම ශිල්ප භාවිතා කරන්න.

(මිනිත්තු 40)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- රාග සංගති මතු කරමින්, ගොඩනැගූ තානාලංකාර ගායනයේදී එහි තානාලානුකූල බව, ස්වර ස්ථානවල නිවැරදි බව, නිර්මාණශීලී බව හා ශ්‍රැතිය පවත්වා ගැනීම, පිළිබඳව අගයන්න.

**පසුවැඩ** - අනෙකුත් රාග සඳහා නිර්මාණය වී ඇති තානාලංකාර පිළිබඳව අවබෝධය ලබා ගැනීමට හැකි වන ක්‍රියාකාරකම් වල යොදවන්න.

**අතිරේක උදව්** - 2008 - 11 ශ්‍රේණිය - ගුරුමාර්ගෝපදේශය.

**ක්‍රියාකාරකම් 03**

# තාල පද ප්‍රස්තාර කිරීම

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන හැකියා ප්‍රායෝගිකව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.2** : රාගධාරී සංගීතයට අදාළ අධ්‍යයනය කළ තාල හැකියා ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** : දාදරා, ත්‍රිතාල්, කෙහෙර්වා ජප්තාල්. දීප්චන්දි, බෙම්ටෝ, ලාවනී යන නිර්දේශිත තාල පද ප්‍රස්තාර කිරීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 02 යි

**ඉගෙනුම් පල** :
- නිර්දේශිත තාල පද ප්‍රස්තාර කරයි.
- තාල පද හා තාල සංසන්දනය කරයි.
- තාල පදට ගැළපෙන ගී පද තෝරයි.
- ගී පදයන්ට අනුගත තාල පද නම් කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- තබ්ලාව, තාල පද ලියන ලද දෘශ්‍යාධාරයක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම් සඳහා උපදෙස් :**

ප්‍රස්තාර කිරීම පිළිබඳව මේ වන විට 11 ශ්‍රේණියේ සිසුන් ට ප්‍රමාණවත් අවබෝධයක් ඇත. තව දුරටත් නිර්දේශිත තාල පද ප්‍රස්තාර කිරීමේ නිවැරදි පිළිවෙල හා ශිල්ප ක්‍රම හඳුනා ගැනීම මෙම පාඩමෙන් අපේක්ෂිතය.

**පියවර 01**
- තාල පද ප්‍රස්තාර කරන ලද පත්‍රිකා ප්‍රදර්ශනය කරන්න.
- තාල පද ප්‍රස්තාර කිරීමේ දී යොදා ගන්නා සංඥා හා සංකේත පිළිබඳ සිසුන් සමග සාකච්ඡාවක යෙදෙන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- නිර්දේශිත තාලපද එකින් එක මාත්‍රා අංකනය කරමින් විභාග වලට බෙදා දක්වන්න.
- ප්‍රස්තාර කිරීමේ දී සැලකිලිමත් වියයුතු විවිධ අංග පිළිබඳ නැවත සාකච්ඡා කරන්න. (මාත්‍රා, විභාග, තාල සංඥා)

(මිනිත්තු 30)

**පියවර 03**
- නම් කරන ලද තාලපද ප්‍රස්තාර කිරීමට සිසුන් යොමු කරන්න.
- තනි තනිව හෝ සාමූහික වශයෙන් උච්චාරණයට යොමු කරන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සිසුන්ට තාල පද ප්‍රස්තාර කිරීමට අවස්ථා ලබා දී සදොස් තැන් නිදොස් කරන්න.

(මිනිත්තු 10)

**පැවරුම** නිර්දේශිත තාල පද වගුවක් සකස් කරන්න.

අතිරේක උදව් :- • 8, 11 ශ්‍රේණි - ගුරු මාර්ගෝපදේශ - 2008

**ක්‍රියාකාරකම් 0 4**

# නිර්දේශිත තාලපද අතින් නිරූපණය හා තබ්ලාවෙන් හඳුනා ගැනීමේ අභ්‍යාස

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.2** : රාගධාරී සංගීතයට අදාළව අධ්‍යයනය කළ තාල හැකියා ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** : දාදරා, ත්‍රිතාල්, කෙහෙර්වා ජප්තාල්. දීප්චන්දි, බෙම්ටෝ . ලාවනී යන නිර්දේශිත තාල පද ප්‍රස්තාර කිරීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- නිර්දේශිත තාල පදවල සංඥා විස්තර කරයි.
- තාල සංඥා අනුව තාල පද අතින් නිරූපණය කරයි.
- නිර්දේශිත තාල පද තබ්ලාවෙන් වයනවිට නම් කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- තාලපද ප්‍රස්තාර කරන ලද දෘශ්‍ය උපකරණය
- තබ්ලාව.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම් සඳහා උපදෙස් :**

මේ වන විට සිසුන් හින්දුස්ථානි තාලපද පිළිබඳ මූලික අවබෝධයක් ලබාගෙන ඇත. මෙම තාලපද අතින් නිරූපණය කිරීමත් තබ්ලාවෙන් වාදනය කොට හඳුනා ගැනීමත් මෙම පාඩම තුළින් අපේක්ෂිතය. දාදරා, ත්‍රිතාල්, කෙහෙර්වා ජප්තාල්. දීප්චන්දි, බෙම්ටෝ යන තාල නිර්දේශිතය. හින්දුස්ථානි තාල පද්ධතිය තුළ ලාවනී යනුවෙන් තාල පදයක් දක්නට නොමැති වුවත් **මාත්‍රා දෙක** බැගින් වූ විභාග සහිත ගීත බොහෝමයක් පාසල් පද්ධතිය තුළ භාවිතා වන නිසාත් දේශීය තිත් රූපවලත් බටහිර තාලවලත් මාත්‍රා දෙක බැගින් වූ තාල පද ඇති නිසාත් ලාවනී තාලය පාසල් පද්ධතියට නිර්දේශ කෙරේ.

**පියවර 01**
- තාලපද ප්‍රස්තාර කරන ලද පත්‍රිකාව ප්‍රදර්ශනය කරන්න.
- එම තාලපදවල මාත්‍රා යේකාව හා අනෙකුත් තාල සංඥා පිළිබඳ සාකච්ඡාවක් කරන්න.
- එක් එක් තාලපදය අතින් නිරූපණය කිරීමට සිසුන් යොමු කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- ඒකල හා සාමූහික වශයෙන් තාලපද අතින් නිරූපණය කරන්න.
- තාල පදවල එන අක්ෂර පැහැදිලිව උච්චාරණය කිරීම සඳහා සිසුන් යොමු කරන්න.

(මිනිත්තු 30)

**පියවර 03**
- තාලපද එකින් එක තබ්ලාවෙන් වාදනය කරන්න.
- වාදනය කරන තාල පදය හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න.

(මිනිත්තු 40)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පැවරුම** තාල පද ප්‍රායෝගිකව පුහුණු වීමට උපදෙස් දෙන්න.

අතිරේක උදව් :-

තබ්ලාව - විජේරත්න රණතුංග, තාලදීපනී - - ඩී. ආර්. පීරිස්

තබ්ලාව - - රංග පෙරේරා

8 ශ්‍රේණිය - - ගුරු මාර්ගෝපදේශය (ජාතික අධ්‍යාපන ආයතනය) -

# සබරගමු වන්නම් - කෝකිල වන්නම

**නිපුණතාව 4.0** : දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 4.1** : සබරගමු සහ පහතරට වන්නම්වල ස්වභාවය විමසමින් ගායනය කරයි. අගය කරයි.

**ක්‍රියාකාරකම** 6.1.1 : සබරගමු වන්නම් - කෝකිල වන්නම්

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 02 යි

**ඉගෙනුම් පල** :
- සබරගමු වන්නම් ගායනය කරයි.
- සබරගමු වන්නම්වල ස්වභාවය විමසයි.
- මෙම සම්ප්‍රදායේ වන්නම් ගයමින් නර්තනයේ යෙදීම අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- වන්නම ලියූ දෘශ්‍යාධාරකය
- සර්පිනාව, දවුල, තාලම්පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම් සඳහා උපදෙස් :**

පහත සඳහන් ශීර්ෂ ඔස්සේ වන්නම්වල ස්වභාවය විමසමින්, වන්නම ගායනය ඉගැන්වීම මින් අපේක්ෂා කෙරේ.

- සබරගමු වන්නම් පිළිබඳ නිර්වචනයන්
- වන්නම් රචකයින්
- වන්නමක කොටස්
- වාදනය වන අවනද්ධ භාණ්ඩ
- නාමිකව හා භාවිතයේ යෙදෙන වන්නම් ගණන
- මෙම වන්නම තිත් දෙකකට ගායනය වන බව

**පියවර 01**
- ගුරුවරයා කෝකිල වන්නම ගායනය කරන්න.
- සිසු ප්‍රතිචාර අනුව සාකච්ඡාවක් මෙහෙයවන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- කෝකිල වන්නම ලියන ලද දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න.
- වන්නමේ තානම ගායනය කරන්න.
- තානමේ නාද මාලාව තහවුරු වනතෙක් කිහිප වරක් ගායනය කරවන්න.
- තානම තිත් දෙකකට ගැයෙන බව අවබෝධ කර දෙන්න.
- තානමේ නාද මාලාව අනුව කවිය සිසුන්ට ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- දී ඇති ශීර්ෂ ඔස්සේ වන්නමේ ස්වභාවය විමසමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

(මිනිත්තු 30)

**පියවර 03**
- තානමේ ස්වර ප්‍රස්තාරය කිහිප වරක් ගායනය කරවන්න.
- තනි තනිව, යුගල වශයෙන්, කණ්ඩායම් වශයෙන් පද මාලාව හා නාද මාලාව ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- කණ්ඩායම් අතර ස්වර හා පද මාරු කරමින් විවිධ ක්‍රම ශිල්ප යොදා ගනිමින් ගායනයට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

- තිත් දෙකට අදාළව ස්වර ශ්‍රැති හා තාල පිළිබඳ අවබෝධයෙන් යුතුව වන්නම ගායනය කිරීම පිළිබඳ අගයන්න.

(මිනිත්තු 10)

**පැවරුම**

- සබරගමු සම්ප්‍රදායට අයත් තිසරා වන්නම, ආනන්ද වන්නම වැනි වන්නම් වල නාද රටා විමසීමට යොමු කරන්න.
- සබරගමු වන්නම්වල ස්වභාවය පිළිබඳව, අභ්‍යාස පොතේ සටහනක් ගොඩනැගීමට යොමුකරන්න.

**අතිරේක උදව් ඃ-**

- 2008 - 11 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශය
- සිංහල නර්තන කලාව - මුදියන්සේ දිසානායක
- නර්තනය - බුද්ධි කළ්‍යාණි මුතුකුමාරණ

# ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ වාදනය

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයන් හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : වාදන දක්ෂතා ප්‍රසංගාත්මකව ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම 2.1.1** : ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ වාදනය

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 04 යි

**ඉගෙනුම් පල** :

- Chords සමග ස්වර පුවරුවෙන් ගීත වාදනය කරයි
- ප්‍රාසංගිකව ගීත වාදනය කරයි.
- පෞද්ගලික ජීවිතය රසවත් කර ගැනීමට හැකියාවක් ලබයි
- පාසලේ සියලු උත්සවයන් හි කැපී පෙනෙන සිසුවකු බවට පත්වෙයි.
- වෘත්තීය වාදකයෙකුට අවශ්‍ය මූලික අඩිතාලම ළඟා කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්:**

- Chords වාදනය හුරු කළ හැකි ක්‍රියාකාරකමෙහි දෘශ්‍යාධාර
- ඔබ විසින් සපයා ගත් Chords සහිත ගීත ප්‍රස්තාර
- ස්වර පුවරු සංගීත භාණ්ඩ
- ස්වර පුවරු වාදන ඇතුළත් D V D තැටි
- DVD Player

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම් සඳහා උපදෙස් :**

මෙම පාඩමේ දී වමතින් Chords වාදනය කරමින්ම ගීත වාදනය කිරීමේ හැකියාව සිසුන්ට ලබා දීම අපේක්ෂිතයි. මෙම පාඩම් සැලසුම් කිරීමේදී 2009 වසරේ සිට ක්‍රියාත්මක වූ 12 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ 125 සිට 127 පිටු තුළින් ආදර්ශ සපයා ගත හැක. පළමුවෙන් C Major scale හා සමග Chords වාදනය කිරීමේ හැකියාව ලැබෙන පරිදි ක්‍රියාකාරකම සැලසුම් කරන්න. C/F/G යන Chords තුන සමග පහසු ගීත දෙකක් වාදනය කිරීමේ හැකියාව ලබාදීම ප්‍රමාණවත්ය. සිසුන්ගේ දක්ෂතාවය අනුව නිල් අහස් තලේ, රොනට වඩින, මල් පිපෙයි දෙනෙත්, අයන්න කියන්න වැනි ගීත හෝ වෙනත් ගීත යොදා ගත හැක. ගීත තෝරා ගැනීමේ නිදහස ඔබ සතුය. කාලච්ඡේද 4 ට ගැළපෙන ලෙස දෙවන පියවර සැලසුම් කර ගන්න.

**පියවර 01**

- ස්වර පුවරු වාදන ඇතුළත් DVD තැටි වාදනය කර නැරඹීමට සලස්වන්න. (පහසුකම් නොමැති විට ඔබ විසින් ස්වර පුවරුවෙන් Chords සමග ගීතයක් වයා පෙන්වන්න.)
- ස්වර පුවරු වාදනයන්ගේ ස්වභාවය හා අභ්‍යාස කළ යුතු පිළිවෙළ පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කරන්න.

මිනිත්තු- 10 යි

**පියවර 02**

- ඔබ විසින් නිර්මාණය කළ C Major Scale සමග Chords වාදනය ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවා, අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- Chords සහිත ගීත ප්‍රස්තාර ලබා දී වාදනයට හුරුකර වන්න.
- තාලානුකූල බව පවත්වාගෙන chords මාරු කරමින් වාදනය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් නිරතුරුව ලබා දෙන්න.

මිනිත්තු- 30 යි

- තෝරාගත් ගීතයක් Chords සමග වාදනය පුහුණු කර ගන්න.

(මිනිත්තු 40)

- තෝරාගත් දෙවන ගීතයේ Chords සමග වාදනය පුහුණු කර ගන්න.

(මිනිත්තු 40)

**පියවර 03**

- තනි තනිව හෝ කණ්ඩායම් කර වාදනය කරවා අගයන්න.
- සදොස් තැන් ඇතොත් නිදොස් කරවන්න.
- තෝරාගත් 3 වන ගීතය Chords සමග වාදනය.

(මිනිත්තු 40)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- විශේෂයෙන් Chords සමග වාදනය ඇගයීමට ලක් කරන්න.

පැවරුම :

- පාසල් ගීතය හා ජාතික ගීතය ඇතුළත්ව සිසුනට ගැළපෙන ගීත ලබාදී දිනපතා පුහුණුවීමට උපදෙස් දෙන්න.

**අතිරේක උදව් :** Chords සමග ඇති ගීත ප්‍රස්තාර සහිත පොත්

**ක්‍රියාකාරකම් 07**

# තෝරාගත් වාද්‍ය භාණ්ඩ වාදනය

**නිපුණතාව 2.0** : වාද්‍ය භාණ්ඩයන් හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : වාදන දක්ෂතා ප්‍රසංගාත්මකව ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** 2.1.2 : තෝරා ගත් වාද්‍ය භාණ්ඩ වාදනය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :
- තෝරා ගත් වාද්‍ය භාණ්ඩයෙන් ප්‍රාසංගිකව ගීත වාදනය කරයි.
- මානසික සතුට ඇතිකර ගනියි.
- වෘත්තීය වාදකයෙකු ට අවශ්‍ය මූලික අඩිතාලම ළඟා කරගනියි.

**ගුණාත්මක යෙදවුම්:**
- තෝරා ගත් ගීත ප්‍රස්තාර සහිත දෘශ්‍යාධාර
- සිසුන් විසින් සපයා ගත් සංගීත භාණ්ඩ
- ගී අනුවාදන ඇතුළත් DVD/CD තැටි
- DVD Player

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම් සඳහා උපදෙස් :**

තෝරා ගත් වාද්‍ය භාණ්ඩයෙන් 11 ශ්‍රේණියට අයත් ගීතයක් ප්‍රාසංගිකව වාදනය කරවීම මෙම පාඩමින් අපේක්ෂිතය. අ.පො.ස (සා.පෙළ) සඳහා පෙනී සිටින සිසුවාගේ ප්‍රායෝගික පරීක්ෂණයට කරනු ලබන පෙර සූදානමක් ලෙස මෙම පාඩම සංවිධානය කරගත හැකිය. කාලච්ඡේද සංඛ්‍යාව 04 බැවින් ගීත 2 ක් වාදනය කරවිය හැකිය. ඔබ පන්තියට ගැළපෙන ලෙස ගීත තෝරා ගත හැකිය. කාලසටහනට අනුව ගැළපෙන පරිදි ක්‍රියාකරකම් සැලසුම් සකසා ගන්න.

**පියවර 01**
- ගී අනුවාදන ඇතුළත් DVD/CD තැටි වාදනය කර නැරඹීමට / ඇසීමට සලස්වන්න. (පහසුකම් නොමැතිවිට ඔබ විසින් වාද්‍ය භාණ්ඩයකින් ගීතයක් වයා ඇසීමට සලස්වන්න.
- ගී අනුවාදනයන්හි ස්වභාවය හා අභ්‍යාස කළ යුතු පිළිවෙළ පිළිබඳව ළමුන් දැනුවත් කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- තෝරා ගත් ගීත ප්‍රස්තාර සහිත දෘශ්‍යාධාර ලබා දී වාදනයට සිසුන් යොමු කරවමින් අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- නිවැරදිව ප්‍රස්තාරය කියවීම, නිවැරදි ස්වර ස්ථාන භාවිත කරමින් වාදනය කිරීම, නිවැරදි ඉරියව් භාවිතය වැනි කරුණු පිළිබඳව සැලකිලිමත් වීමට උපදෙස් දෙන්න.
- තෝරාගත් ගීත වාදනය පුහුණු කරන්න.

(මිනිත්තු 30)

**පියවර 03**
- තනි තනිව හෝ කණ්ඩායම් කර වාදනය කරවා අගයන්න.
- සදොස් තැන් ඇතොත් නිදොස් කරවන්න.

(මිනිත්තු 40)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිවැරදි ප්‍රස්තාරය කියවීම, නිවැරදි ස්වර ස්ථාන භාවිත කරමින් වාදනය කිරීම, නිවැරදි ඉරියව් භාවිතය, ප්‍රාසංගික බව වැනි කරුණු ඇගයීමට ලක්වන පරිදි ඇගයීම් හා තක්සේරුකරණය සකසා ගන්න.

**පැවරුම** විෂය නිර්දේශයට අයත් සරල ගී, ජන ගී, චිත්‍රපට ගී ආදිය ලබා දී පුහුණුවීමට උපදෙස් දෙන්න.

අතිරේක උදව් :- ගීත ප්‍රස්තාර සහිත පොත

# භෛරවී යමන් යන රාගවල මධ්‍යලය ගීත නැවත අභ්‍යාස

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : රාගධාරී සංගීතයට අදාළව අධ්‍යයනය කළ ගායන සහ වාදන හැකියා ප්‍රසංගාත්මකව ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** : භෛරවී යමන් යන රාගවල මධ්‍යලය ගීත අභ්‍යාස කිරීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :
- රාගවලට අයත් ආරෝහණ අවරෝහණ ගායනා කරයි.
- රාගාංග ඇතුළත් ස්වර සංගති පැහැදිලි කරයි.
- මධ්‍යලය ගීත ස්ථායි අන්තරා වශයෙන් තාලානුකූලව ගායනය/වාදනය කරයි.
- රාගවලට අයත් විකෘති ස්වර, විවාදී ස්වර නම් කරයි.
- නියමිත ශ්‍රැතිය මත ගීතය රසවත්ව ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්:** හාර්මෝනියම් / තබ්ලාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

භෛරවී සහ යමන් රාග දෙකට අයත් මධ්‍යලය ගීත නැවත අභ්‍යාස කරවමින් නිවැරදිව තාලානුකූලව ගායනය/වාදනය කිරීමේ හැකියාව වර්ධනය කිරීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂා කෙරේ. 1 වැනි වාරයට නියමිත බිලාවල්, භූපාලි, කාෆි යන රාගයන්හි මධ්‍යලය ගීත අභ්‍යාස කිරීම සඳහා යොදාගත් සැලසුම් මේ සඳහා ක්‍රියාත්මක කරන්න.

**පියවර 01**
- නිර්දේශිත රාගයන්හි මධ්‍යලය ගී පාදයන් හෝ ස්වර සංගති, අහඹු ලෙස ගායනා කරමින් එම රාග පිළිබඳව සිසුන්ගෙන් විමසන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- භෛරවී රාගයේ මධ්‍යලය ගීතය අභ්‍යාස කිරීමට පෙර එම රාගයෙහි ආරෝහණ සහ අවරෝහණ නිවැරදිව ගායනයට පුහුණු කරවන්න. විකෘති ස්වර පිළිබඳව සැලකිලිමත් වෙමින්, අවශ්‍ය පරිදි වාදනය කර දක්වමින් ස්වර ස්ථාන තහවුරු කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 03**
- භෛරවී රාගයේ මධ්‍යලය ගීතය තාලයට අනුගත වන සේ ගායනයට/වාදනයට යොමුකරවන්න. කිහිප වාරයක්, අභ්‍යාස කරවමින්, නිවැරදි නාද මාලාව තහවුරු වී ඇතිදැයි සොයා බලන්න. ගීතයේ ස්ථායී, අන්තරා වෙන් වෙන් වශයෙන් තනි තනිවම සිසුන්ට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- මීට පෙර පළමුවැනි වාරයේදී රාග අභ්‍යාස කළ ආකාරයට ක්‍රියාකාරකම ක්‍රියාත්මක කරන්න.
- ඒ අයුරින්, යමන් රාගයද, නැවත අභ්‍යාස කිරීම සඳහා ඉහත ආකාරය යොදා ගන්න.

(මිනිත්තු 40)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

- නිර්දේශිත රාගයන්හි ආරෝහණ/ අවරෝහණ ගායනයට/ වාදනයට සලස්වා අගයන්න.
- ගායනයෙහි සදොස් තැන් නිදොස් කරන්න.
- මධ්‍යලය ගීතයෙහි ස්ථායී කොටස ගායනා කරවන්න.
- මධ්‍යලය ගීතයෙහි අන්තරා කොටස ගායනා කරවන්න.
- නිවැරදි ශ්‍රැතිය සහ තාලය මත ගැයෙන අයුරු අගයන්න. .

**පැවරුම** භෛරවී සහ යමන් රාග ආශ්‍රිත සරල ගීත රැස් කිරීමට උපදෙස් දෙන්න.

**අතිරේක උදව් ඃ-** 2008 - 11 ශ්‍රේණිය - ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය.

# භෛරවී යමන් යන රාගවලින් එක් රාගයකට අදාළ තානාලංකාර ගායනය/වාදනය

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : රාගධාරී සංගීතයට අදාළව අධ්‍යයනය කළ ගායන සහ වාදන හැකියා ප්‍රසංගාත්මකව ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** : භෛරවී සහ යමන් රාග වලින් එක් රාගයකට අදාළ වන සේ තානාලංකාර ගායනය/වාදනය කිරීම

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- තෝරාගත් රාගයට අයත්වන සේ තානාලංකාර නිර්මාණයට පෙළඹෙයි.
- ගීතයට අනුගත වන අයුරින් තානාලංකාර විවිධ ක්‍රම යොදා ගායනය වාදනය කිරීම අගය කරයි.
- ශිල්පීය දක්ෂතා මත ප්‍රාසංගිකව ගායන වාදන ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- හාර්මෝනියම් / තබ්ලාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

**පියවර 01** භෛරවී හෝ යමන් රාගයට අයත් මධ්‍යලය ගීතය කිහිපවරක් ගායනා කරවන්න. එම රාගයට අදාළ ස්වර අභ්‍යාස කිහිප වාරයක් ගායනය/ වාදනය කරවන්න. ස්වර සංගති මතුකර දක්වමින් ස්වර අභ්‍යාස ඇසුරෙන් තානාලංකාර ගොඩනගන ආකාරය දැනුවත් කරන්න. පළමුවැනි වාරයේ ක්‍රියාත්මක කළ ආකාරය අනුගමනය කරන්න.

(මිනිත්තු 05)

**පියවර 02**
- සිසුන් විසින් නිර්මාණය කරන ලද තානාලංකාර විකෘති ස්වර පිළිබඳව අවධානය යොමු කරමින්, ගායනය / වාදනය කරවන්න.

(මිනිත්තු 15)

**පියවර 03**
- මධ්‍යලය ගීතයට අදාළව තාලානුකූලව තානාලංකාර ප්‍රසංගාත්මකව ඉදිරිපත් කිරීමට අවස්ථාව සලස්වන්න.

යමන් රාගයද ඉහත සඳහන් ආකාරයට ක්‍රියාත්මක කරන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- තානාලංකාර නිර්මාණය කරයි.
- නිවැරදිව තානාලංකාර ගායනය/වාදනය කරයි.
- මධ්‍යලය ගීතය සමග තානාලංකාර ඉදිරිපත් කරයි.
- ශිල්පීය දක්ෂතා මතුකරමින් ගායනය / වාදනය කරයි.

(මිනිත්තු 10)

**පැවරුම** භෛරවී සහ යමන් රාග ආශ්‍රිත සරල ගීත සොයා බැලීමට උපදෙස් දෙන්න.

අතිරේක උදව් :- 2008 - 11 ශ්‍රේණිය - ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය.

# රාගාශ්‍රිත සරල ගී

**නිපුණතාව 3.0** : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳී මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරුවෙයි.

**නිපුණතා මට්ටම 3.1** : ව්‍යවහාරික සංගීතාංග ලෙස නිර්මාණය වී ඇති ගායන වාදන පිළිබඳ සාකච්ඡා කරමින් ප්‍රායෝගිකව රසාස්වාදයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම** : රාගාශ්‍රිත සරල ගී රස විඳියි.
**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- රාගධාරී සංගීතයේ ඇතුළත් ශිල්ප ක්‍රම, සෘජුව යොදාගත් සරල ගීත සොයයි.
- සරල ගීතයෙහි ඇතුළත් රාගධාරී ශිල්ප ක්‍රම නම් කරයි.
- රාගාශ්‍රිත සරල ගීතය ගායනා කරමින් රස විඳියි.
- ගායනයට සහ වාදනයට ශාස්ත්‍රීය සංගීතයෙන් ලද අභ්‍යාසය විස්තර කරයි.
- රාගාශ්‍රිත සරල ගීතයක් සහ වෙනත් ගීතයක් අතර ඇති වෙනස සංසන්දනාත්මකව අගය කරයි.
- ගීතයෙහි ඇතුළත් රාගධාරී ශිල්ප ක්‍රම නම් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- තෝරාගත් ගීතය ඇතුළත් ශ්‍රව්‍ය පටය
- ස්වර වාද්‍ය භාණ්ඩයක්/තාල වාද්‍ය භාණ්ඩයක්.

**ක්‍රියාකාරකම් ක්‍රියාවලිය සඳහා උපදෙස්** :

ශාස්ත්‍රීය සංගීතයේ ශිල්ප ක්‍රම සෘජු ව උපයෝගී කරගෙන නිර්මාණය කර ඇති ගීත මෙම ක්‍රියාකාරකම සඳහා යොදා ගැනීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා නිර්දේශිත සරල ගීත යොදා ගන්න. මේ සඳහා 2008 11 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 42 සිට 50 දක්වා පිටු පරිශීලනය කරන්න.

**පියවර 01**

නිර්දේශිත රාගාශ්‍රිත සරල ගීතය ඇතුළත් ශ්‍රව්‍ය පටය සිසුන්ගේ ශ්‍රවණයට යොමු කරවන්න. එම ගීතයෙහි ඇතුළත් විවිධ රාගධාරී ශිල්ප ක්‍රම, එනම් ආලාප, තානාලංකාර, අවනද්ධ පද, තිහායි, චක්‍රධාර් වැනි ශිල්ප ක්‍රම, මීන්ඩ්, ගමක්, මූර්කි වැනි ශිල්ප ක්‍රම, ශාස්ත්‍රීය ශෛලියට අනුව ගායනා කරන අයුරු සිසුන් සමග සාකච්ඡා කරන්න. නැවත නැවත ශ්‍රවණයට සලස්වා එම සංගීතාංග හඳුනා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 15)

**පියවර 02**

- ගීතයේ පද මාලාව සහ නාදමාලාව සුසංගත වී ඇති ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ගායකයාගේ කටහඬ, තනු නිර්මාණය, යොදාගෙන ඇති සංගීත භාණ්ඩ ආදිය පිළිබඳව සාකච්ඡා කරන්න.
- රාගධාරී සංගීත ශිල්ප ක්‍රම සරල ගීතය සඳහා යොදා ගැනීමේ දී සිදු වී ඇති වෙනස් කම් පිළිබඳව සාකච්ඡා කරන්න.

(මිනිත්තු 25)

**පියවර 03**

- ස්වර වාද්‍ය භාණ්ඩයක් යොදා ගනිමින් ගීතය සිසුන් සමග ගායනය කරන්න. ශාස්ත්‍රීය ශෛලියට අනුව කටහඬ යොදා ගන්නා අයුරු ප්‍රායෝගිකව පෙන්වා දෙමින් ශාස්ත්‍රීය අංග උද්දීපනය වන ලෙස සිසුන් සමග ගායනා කරන්න.

(මිනිත්තු 35)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සරල ගීතයෙහි ඇති රාගධාරී ශිල්ප ක්‍රම නම් කරයි.
- සරල ගීතයට, ශාස්ත්‍රීය සංගීතයෙන් ලද ආභාසය විස්තර කරයි.
- සරල ගීතයක සහ රාගාශ්‍රිත සරල ගීතයක ඇති වෙනස් කම් සංසන්දනය කරයි.
- රාගාශ්‍රිත සරල ගී රසවින්දනයෙහි යෙදේ.

(මිනිත්තු 05)

**පැවරුම**

ශාස්ත්‍රීය ශිල්ප ක්‍රම යොදා නිර්මාණය කර ගත් ගීත එකතුවක් සහිත පොතක් සමඟ CD තැටියක් සාදන්න.

**අතිරේක උදව් :-** 2008 - 11 ශ්‍රේණිය - ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය.

## පහතරට සිංදු වන්නම් - නළු ගීතිකා තාලය

**නිපුණතාව 4.0** : රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින්, සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 4.1** : සබරගමු හා පහතරට වන්නම් වල ස්වභාවය විමසමින් ගායනය කරයි. අගය කරයි.

**ක්‍රියාකාරකම** : පහතරට සිංදු වන්නම් - නළු ගීතිකා තාලය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- පහතරට වන්නම් ගායනය කරයි.
- පහතරට වන්නම් වල ස්වභාවය විමසයි.
- පහතරට සම්ප්‍රදායට අයත් වන්නම් ගායනය කරමින්, නර්තනයේ යෙදීම අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්**:
- වන්නම් ලියූ දෘශ්‍යාධාරකය
- සර්පිනාව, පහතරට බෙරය, තාලම්පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

ඇමුණුම අංක 1 හි අනුව වන්නම්වල තොරතුරු හා ස්වභාවය විමසමින්, සිංදු වන්නම් ඉගැන්වීම මෙයින් අපේක්ෂා කෙරේ.

:

**පියවර 01**
- ගුරුවරයා සිංදු වන්නම ගායනය කරන විට, ශ්‍රවණය කිරීමට, සිසුන්ට අවස්ථාව සලසා දෙන්න.
- ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදී, සාකච්ඡාවක් මෙහෙයවන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- පහතරට සිංදු වන්නම ලියන ලද දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න.
- තානමේ නාදමාලාව තහවුරු වනතෙක් කිහිප වරක් ගායනය කරවන්න.
- තානම ගැයූ නාදමාලාව අනුව කවිය ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පියවරෙන් පියවර කවියේ පාද ගායනය කරවන්න.
- දෙන ලද ආකෘතිය ඔස්සේ සිංදු වන්නම් වල ස්වභාවය සිසුන් සමග සාකච්ඡා කරන්න.

(මිනිත්තු 30)

**පියවර 03**
- තානමේ ස්වර ප්‍රස්තාරය ගායනය කිරීමට පුහුණු කරන්න.
- සිසුන් කණ්ඩායම් වලට බෙදා ගීත ස්වර ප්‍රස්තාරය ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිංදු වන්නම් පිළිබඳව ගුරුවරයා ඉගැන්වූ තොරතුරු අනුව සිසු අභ්‍යාස පොතේ සටහනක් සකස් කිරීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 35)

- පහතරට සිංදු වන්නමේ තානම හා කවිය, ශ්‍රැතිය, ස්වර හා තිත පිළිබඳ අවබෝධයෙන් යුතුව මිහිරිව ගායනය කිරීම අගයන්න.

(මිනිත්තු 05)


**පැවරුම**

- පහතරට සිංදු වන්නමක් ලියා සුවිශේෂ ලක්‍ෂණ ද ඇතුළත් කරමින්, බිත්ති පුවත්පතක් සකස් කිරීමට යොමු කරවන්න.

අතිරේක උදව් :- 2008 - 11 ශ්‍රේණිය - ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය.

ඇමුණුම අංක 01

පහතරට සිංදු වන්නම් වල සුවිශේෂ ලක්‍ෂණ දැක්වෙන රටාවක් පහත දැක්වේ.




මෙම තොරතුරු ආකෘතියට ඇතුළත් කරුණු ඔස්සේ වන්නම්වල ස්වභාවය විමසමින් සිංදු වන්නම ඉගැන්වීම මෙයින් අපේක්ෂා කෙරේ.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- පහතරට සිංදු වන්නමේ තානම හා කවිය, ශ්‍රැතිය, ස්වර හා තිත පිළිබඳ අවබෝධයෙන් යුතුව මිහිරිව ගායනය කිරීම අගයන්න.

(මිනිත්තු 05)

**පැවරුම** • පහතරට සිංදු වන්නමක් ලියා, සුවිශේෂ ලක්‍ෂණ ද ඇතුළත් කරමින්, බිත්ති පුවත්පතක් සකස් කිරීමට යොමු කරවන්න.

**අතිරේක උදව්** :- 2008 - 11 ශ්‍රේණිය - ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය.

# නාට්‍ය ගීත

**නිපුණතාව 3.0** : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්වයන් ළඟාකර ගැනීමට හුරුවෙයි.

**නිපුණතා මට්ටම 6.2** : ව්‍යවහාරික සංගීතාංග ලෙස නිර්මාණය වී ඇති ගායන / වාදන පිළිබඳව සාකච්ඡා කරමින් ප්‍රායෝගිකව රසාස්වාදයේ යෙදෙයි.

ක්‍රියාකාරකම 6.2.1 : නාට්‍ය ගීත ගායනය

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 02 යි

**ඉගෙනුම් පල** :
- නව නාට්‍ය ගීත පිළිබඳව විමසයි.
- එම ගීත ගායනයේ උනන්දු වෙයි.
- නාට්‍ය ගීත ගයයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ලැයිස්තුවේ දක්වා ඇති නාට්‍ය ගීතයන්හි පද මාලා සහ ස්වර රචනා
- ලැයිස්තුවේ දක්වා ඇති නාට්‍ය ගීත පටිගත කර ඇති CD. පට
- ස්වර පුවරු සංගීත භාණ්ඩයක්
- තාල වාද්‍ය භාණ්ඩයන්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම් සඳහා උපදෙස් :**

නූර්ති ගීත, නාඩගම් ගීත, සොකරි ගීත, කෝලම් ගීත ගායනා කර ඇති සංගීතය හදාරන සිසු/සිසුවියන්ට වත්මන් නාට්‍ය ගීත ගායනය සඳහා යොමු කර ගැනීම සඳහා මෙම පාඩම යොදා ගත හැක. පහත දැක්වෙන්නේ ගීත ලැයිස්තුවයි. ඉන් එක් ගීතයක තෝරා ගන්න.

- අන්දරේලා - රස බොජුනක් සේ ......
- කුස පබාවතී - රතඳර නිමල කොමළ .....
- තාරාවෝ ඉගිලෙති - සෝබාව දේ .....
- රතු හැට්ටකාරී - යස ඉසුරු ......
- මී පුර වැසියෝ - කාටත් බැරි කුණු කන්දල් .....
- තටු - අපි කිරිල්ලියෝ ......
- මධුර ජවනිකා - නෙයිනගෙ සුදුව ......
- අබුද්දස්ස කෝලම - අප මුණි සඳ ......

පාඩම සංවර්ධනයඃ

**පියවර 01** • තෝරා ගත් ගීතය ශ්‍රවණයට සලස්වන්න. ගීතය /නාට්‍ය පිළිබඳ කෙටි සාකච්ඡාවක් කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- ඔබ තෝරා ගත් ගීතයේ පද මාලාව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එය රසවත්ව ගායනය කර පෙන්වන්න. ගායනය හුරු කරන්න.
- ගීතයේ ස්වර ප්‍රස්තාරය ඉදිරිපත් කරන්න.
- වාදන හැකියා ඇති සිසුන් වාදනය සමඟ හවුල් කරගෙන ගීතය සිසුන් සමඟ නැවත නැවත ගායනය කරන්න.

(මිනිත්තු 30)

**පියවර 03**

- සිසුන් කැමති නව නාට්‍ය ගීත නම් කරවන්න.
- තවත් එක් ගීතයක් තෝරා ගන්න.
- සිසුන් සමග එක්ව ගයන්න.
- රංගනය සමග ගායනයේ යෙදෙන සිසුවෙකුට හෝ කණ්ඩායමකට පුහුණු ගීතයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව දී අගයන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- කේවලව ගායනයට සලස්වා සියලු සිසුන් උපස්ථම්භනය කරමින් වඩාත් නිවැරදිව ගීත ගායනය කරන ශිෂ්‍ය / ශිෂ්‍යාව අගයන්න.
- ඇමුණුමේ සඳහන් නෙයිනගේ සූදුව කියවා එම කතාව සිසුන්ගේ බසින් ඉදිරිපත් කිරීමට යොමුකර අගයන්න.

(මිනිත්තු 10)

**පැවරුම** ඉතිරි නාට්‍ය ගීත ගායනය කිරීමට යොමු කරන්න.

## අබුද්දස්ස කෝලම

| | | |
|---|---|---|
| **කවියා** | : | අපෙ මුනි සඳ ඉර්දි බලෙන් දඹදිව සිට නැග අහසට<br>මහියංගන පුරවරයට බැස්සයි රන් රුව විලසට |
| **පඬිතුමා** | : | ඔන්න සුදනනේ අසනුය බින්න නැත අනේ<br>ඔහොම එහි බනේ විස්තර බලනු තොරණිනේ |
| **කවියා** | : | එදා යකුන් රැස්වුණ තැන සම්කඩ අතුරා ඊ පිට<br>සවණක් රැස් විහිදුවමින් දෙසුවයි ධර්මය ඔවුනට |
| **පඬිතුමා** | : | ඔන්න සුදනනේ ........ |
| **කවියා** | : | අපෙ මුනි සඳ දෙසුව දහම<br>උන්ගේ අනුවණ මොළයට<br>තේරුම් ගන්නට බැරිවිය<br>පූරුවෙ කළ කරුමයකට |
| **පඬිතුමා** | : | ඔන්න සුදනනේ ........ |
| **කවියා** | : | බුදුන් එසඳ සම්කඩ සිට ගිනිදැල් විහිදා හනිකට<br>එහැම යකුන් පලවා හැරියයි ගිරි දිවයින පුරයට |
| **දෙදෙනාම** | : | තන්න - නානෙ - තන්න - නානෙ<br>තන නා තන // |

**11 ශ්‍රේණිය**

## Xiii නෙයිනගෙ සූදුව

**දුවන ගිරියක් තල්ලු කරගෙන වම් පසින් ඇතුල්වෙන රෝස නෝනා සහ ජැංඩිසිංකෝ සබාවෙන් අවසර ගෙන රබන් වයමින් විරිදු කියති)**

| | | | |
|---|---|---|---|
| **ජැංඩිසිංකෝ** | : | පළමුව මම වැන්ද බුදුන් සිහි කරගෙන ඒ ගුණ ක | ඳ |
| **රෝසනෝනා** | : | දෙවනුව සද්ධර්මේ උතුම් මුදුනත් කර මෙන්න වැන් | ද |
| **ජැංඩිසිංකෝ** | : | තෙවනුව මහ සංඝ රත්නෙ වැඳ සුරන්ට පින්දී සො | ඳ |
| **දෙදෙන** | : | කියනව අපි නෙයින ගෙ සූදුව කවියෙන් කර ප්‍රබන් | ද |
| | | | |
| **ජැංඩිසිංකෝ** | : | සිරින් සපිරි අපෙ ලක්දිව අසුවුනි ඉංග්‍රිස් රජුන් | ට |
| | | කෙළින් ඉන්න නොදී අපිට බලේ ගන්න ඔවුන් අත | ට |
| | | පිටින් ආපු හම්බ හෙට්ටි හැත්ත පිරුණ කොළොම් පුර | ට |
| | | ඔවුන් අතර හිටිය නෙයින තම්බි කියල කෙනෙක් ජය | ට |
| | | | |
| **රෝසනෝනා** | : | සොඳින් මසන් ගස් හන්දියෙ නෙයින උන්නු ගෙයි විස්ත | ර |
| | | න ගි න් ට එහි තට්ටු හතයි යටටත් ඒ තරම් විත | ර |
| | | ත දි න් ම සූදුව එතනයි නිලධාරින් ඇවිත් නිත | ර |
| | | ප නි න් ට බෑ අල්ලන්නට ආණ්ඩුවත් බයයි මිතු | ර |
| | | | |
| **ජැංඩිසිංකෝ** | : | මෙකලා වීරයෙක් උන්න කොතලාවල කියල සොඳ | ට |
| | | සි ත ලා වැඩ කරන එතුම ජෝන් නමින් පුරසිද්දෙ | ට |
| | | ලැ බි ලා ගුරු තනතුරකුත් පසුව ගියා රේල්ලුව | ට |
| | | එ ක ලා ඔහු කළ දස්කම් කියනව මං පෙළින් පෙළ | ට |
| | | | |
| **රෝසනෝනා** | : | අල්ලස් දී පොලීසියට කොස්ගස් හංදියේ ජය | ට |
| | | නෙයින තම්බි සූදු කෙළිය කාටත් බෑ අල්ලන්න | ට |
| | | ආණ්ඩුවත් සතුටු වෙලා රජෙක් වගේ උන්නු මැති | ට |
| | | සාජන් මේජර් කෙරුවා කොටහේනේ පොලීසිය | ට |
| | | | |
| **ජැංඩිසිංකෝ** | : | එක්ක ගොසින් පොලිස් හටයො දොළොස් දෙනෙක් මරදාන | ට |
| | | ඉක්මන් කර කම්බ සරොන් පට ලේන්සු දී අඳින් | ට |
| | | සල්ලි දීල ඔවුන් අතට යන්න කිව්ව සූදු පොළ | ට |
| | | ඊට පස්සෙ සිද්ධ වෙච්ච දේ පුදුමයි අහන් ඉන් | ට |
| | | | |
| **රෝසනෝනා** | : | ඇඳගෙන සුදු වේට්ටියක් ජටාවකුත් බැඳ හිස ව | ට |
| | | ගාගෙන තුන්නූරු ටිකක් දෙමළ හෙට්ටියෙක් විලස | ට |
| | | අර ගත්තා බෑග් එකක් නෝට්ටු කොළ දැම්ම ඊ | ට |
| | | නැගගත්තා රික්ෂෝවක අපෙ මැතිඳා යයි විජහ | ට |
| | | | |
| **ජැංඩිසිංකෝ** | : | දකිමින් මේ හෙට්ටි අයිය නෙයින සලං දැම්ම හොඳ | ට |
| | | එන්න කාරියම් වන්දදු සන්ගදි සොල්ලුම්ගෝ ම | ට |
| | | නාම වන්දදු විලයාට්ටු තුපන්කාර ඔන්ග කීට් | ට |
| | | ඔන්න ඉතින් වාවා කියල එක්ක ගියා ගේ ඇතුළ | ට |

**රෝසනෝනා** : තට්ටු හතක් නැග්ග කලට නෙයිනගෙ ඒ සුදු පොළ ට
ගොනෙක් වගේ එළුවෙක් විත් පැන්නයි මැතිඳුට අනින් ට
බාසෙන් කිව්වා නෙයිනා එළුව ගියා දුන්න අන ට
දැන ගෙන මේ රහස් සියළු මැතිඳා යයි ඔට්ටු පෙළ ට

**ජැංඩිසිංඤෝ** : බලන්ඩ පුදුමයි මහතුනි නෙයිනගෙ ඒ සුදු පිටි ය
එතෙන්ඩ චන්ඩියා තමයි සේදවත්තෙ ජෝන් ගොයි ය
දිනන්ඩ අත ගත්තු ගමන් මැතිඳුට ඔහු ඔරව හිටි ය
කොහෙන් ආපු දෙමළෙක් දැයි කියල ජෝන් නැගිට හිටි ය

**රෝසනෝනා** : කුට්ටම හා සල්ලි මුදල් අරගෙන මැතිඳා එම වි ට
ඇතුන් මැදට වන් කෙසරෙක් සිංහනාද කරන ලෙස ට
දැනගල්ලා මෙතන ඉන්නෙ කොතලාවල කිව්ව කල ට
තනියෙන්මයි අල්ල ගත්තෙ විස්සක් අත් අඩංගුව ට

**ජැංඩිසිංඤෝ** : පැන්න කලට චන්ඩි ජෝන් පිහියක් අරගෙන අනින් ට
දුන්න මැතිඳ පයින් එකක් බිව් රංකිරි කටින් එන් ට
ඉන්න හිටින්නත් බැරිවුනි මල මුත්තර පිටවු කල ට
ඔන්න එවිට ආව එළුව පැනගෙන මැතිඳුට අනින් ට

**රෝසනෝනා** : කාගෙන් බේරුනත් බැරිය එළුවාගෙන් මාරු වෙන් ට
වේගෙන් පැන්නා මැතිඳා ඒ උනාට ඉදිරි පිට ට
උඹද මිතුරෙ හතර ගාතෙ චන්ඩිය කියමින් මෙතෙන් ට
දුන්නා වම් පයින් එකක් පස්ස ගාතෙ කැඩිල යන් ට

**ජැංඩිසිංඤෝ** : ඉතින් අම්මේ ඉදල මොටද කියල නෙයින පැන විජහ ට
අතින් පයින් නෙමේ ඔන්න කානු හතයි පිස්තෝලෙ ට
ගනින් මේක කිව්ව නමුත් පත්තු නූනි මැතිඳු පින ට
මුණින් වැටුනි නෙයින තම්බි මැතිඳු දුන්නු මරු පාර ට

**රෝසනෝනා** : නෙයිනට රුපියල් දාහයි දහය බැගින් අනිත් අය ට
ගෙව්වයි දඩ බොහෝ දෙනෙක් බැරිවුණි තව හත් දෙනෙකු ට
හැත්තෑවක් ගෙවල මැතිඳු ගත්ත ඔවුන් හැම එළිය ට
ඇත්තයි අපි මල් පුදන්ට ඕනෑ ඔහොම වීරයින් ට

**ජැංඩිසිංඤෝ** : එක්ක ඇවිත් ඒ හත් දෙන කෙහෙල්වත්තෙ පිට්ටනිය ට
පි යෙ ක් ලෙසට ඔවදන් දී දුසිරිතයෙන් වළකින්න ට
දෙ ක ක් පාර බැගින් දුන්නෙ මිතුරෙනි එම මතක් වෙන් ට
කොතෙක් රිදුන නමුත් ඔවුන් මැතිඳුට වැඳ ගියයි යන් ට

**දෙදෙන** : එතුමා කළ දස්කම් නම් එක කටකට බැහැ කියන් ට
හැමදාමත් මතක් වෙන්ට ඉතිහාසෙත් තියෙයි හොඳ ට
හිටියා නම් අද වෙනතුරු රජ කරනව ලංකාව ට
එතුමා සුර පුර වැඩියේ අපේ තියෙන අහේතුව ට

# මොසාර්ට්, බීතෝවන් යන සංගීතඥයින් පිළිබඳ තොරතුරු

**නිපුණතාව 3.0** : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ වින්දනීය අවස්ථා හා බැඳි මානසික තත්වයන් ලඟා කරගැනීමට හුරුවෙයි.

**නිපුණතා මට්ටම 3.2** : බටහිර සම්භාව්‍ය සංගීතයේ **සංධ්වනි** වල ස්වභාවය විමසමින් රසාස්වාදයේ යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

බටහිර සංගීත ස්වර ප්‍රස්තාරකරණය, ශිල්ප ක්‍රම හා බටහිර ගීත, පිළිබඳව පන්ති කාමරයේ දී ඉගෙන ගැනීමට අමතරව රූපවාහිනිය, ගුවන් විදුලිය ජන මාධ්‍ය හා C.D, D.V.D, කැසට්පට, මගින් ද සිසුන් දැනුවත් වී ඇත.

බටහිර සංගීතයේ **සංධ්වනි** නිර්මාණකරුවන් වන මොසාර්ට්, බීතෝවන් යන සංගීතඥයින් හඳුන්වා දී ඔවුන්ගේ නිර්මාණ ශ්‍රවණයට සලැස්වීම හා **සංධ්වනියක** ස්වභාවය පිළිබඳව ප්‍රායෝගිකව දැනුවත් කිරීමට ගුරුවරයා සූදානම් විය යුතුය. (මේ සඳහා **මොසාර්ට්ගේ** G Minor සිම්පනිය සහ බීතෝවන් ගේ Fur Elise-piano sonata **ශ්‍රවණය සඳහා** යොදා ගන්න.) මෙම නිර්මාණ දැනටමත් විවිධ මාධ්‍ය ඔස්සේ ශ්‍රවණය කළ හැකිය.

**ඉගෙනුම් පල** :

- අදාළ සංගීතඥයින් දෙපළ පිළිබඳව තොරතුරු රැස් කර ගනියි.
- ඔවුන් විසින් නිර්මාණය කර ඇති **සංධ්වනි** වෙන් කර හඳුනා ගනියි.
- තෝරා ගත් **සංධ්වනි** ශ්‍රවණය කරමින් රසාස්වාදයේ යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්** :

- මොසාර්ට්, බීතෝවන් යන සංගීතඥයින් පිළිබඳ තොරතුරු ඇතුළත් කියවීම් පත්‍රිකා අංක 01
- ඔවුන්ගේ ඡායාරූප ඇතුළත් රූප සටහන.
- එම සංගීතඥයින් විසින් නිර්මාණය කරන ලද **සංධ්වනි** කිහිපයක C.D තැටි හා එම යන්ත්‍ර.

D.V.D **ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

**පියවර 01**

- මොසාර්ට්, බීතෝවන් යන සංගීතඥයින්ගේ ඡායාරූප ඇතුළත් සටහන පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- මොසාර්ට් හා බීතෝවන් වෙන්කර හඳුන්වා දී සාකච්ඡාවක් මෙහෙය වන්න.

(මිනිත්තු 10)

**පියවර 02**

- ඔවුන් පිළිබඳ තොරතුරු ඇතුළත් කියවීම් පත්‍රිකා අංක 01 හි පිටපතක් සිසුන් අතර බෙදා දෙන්න.
- එක් එක් සංගීතඥයා විසින් කරන ලද ඔවුන්ගේ නිර්මාණ හා ජීවන තොරතුරු පිළිබඳ සටහනක් සිසුන්ට ගොඩනගා ගැනීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 30)

**පියවර 03** : 

- මොසාර්ට්, බීතෝවන් යන සංගීතඥයින් විසින් නිර්මාණය කරන ලද සංධ්වනි ඇතුළත් CD තැටිය සිසුන්ට ශ්‍රවණය කර රස විඳීමට අවස්ථාව ලබා දෙන්න.
- සංධ්වනිවල ස්වභාවය පිළිබඳව සාකච්ඡාවක් කරන්න.
- මෙම සංධ්වනීන්ගෙන් වැඩි වශයෙන්, වරින් වර ඇසුණ වාද්‍ය ඛණ්ඩ කොටසක් ගුරු සහාය ඇතිව 'ල' කාරයෙන් හෝ 'අ' කාරයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. (අමුණා ඇත.)
- සංධ්වනි සඳහා යොදාගත් සංගීත භාණ්ඩ ලැයිස්තුවක් සකස් කරවන්න.

(මිනිත්තු 40)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සංගීතඥයින් දෙදෙනාගේ ජීවන තොරතුරු හා නිර්මාණ ඇතුළත් සටහන හා ගායනය කළ වාද්‍ය ඛණ්ඩය, කණ්ඩායම් වශයෙන් අගයන්න.
- සංගීත භාණ්ඩ ලැයිස්තුවේද නිවැරදි බව අගයමින්, කණ්ඩායම් වශයෙන් ප්‍රබලතා සහ දුබලතා පෙන්වා දෙන්න.

පැවරුම : 

- බටහිර සංගීතයේ සංධ්වනි නිර්මාණකරුවන් නම් කර කැමති සංධ්වනියක් අන්තර් ජාලය හරහා එකතු කිරීමට යොමු කරන්න.

**අතිරේක උදව්** : 

- 2008 - 11 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය
- 2010 - 13 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය

| විස්තරය | වුල්ෆ්ගැන්ග් අමදියෙස් මොසාර්ට් | ලුඩ්විග් වැන් බීතෝවන් |
|---|---|---|
| උපත | • ක්‍රි:ව: 1756 ජනවාරි 27 වන දා | • ක්‍රි:ව: 1770 දෙසැම්බර් 17 |
| උපන් ප්‍රදේශය | • බටහිර අවුස්ත්‍රියාවේ සැල්ස්බර්ග් නුවර | • ජර්මනියේ බොන් නුවර |
| ජීවන තොරතුරු සැකෙවින් | • වයස අවු: හයේදී ප්‍රසිද්ධ සංගීත ප්‍රසංග පැවැත්වීම<br>• අවු: නවයේදී ප්‍රථම සිම්ෆනියද අවු: එකොළහේ දී ප්‍රථම ඔරටෝරියද, වයස දොළහේදී ප්‍රථම ඔපෙරාවද ප්‍රබන්ධ කිරීම.<br>• 1791 දෙසැ. 05 ඔස්ට්‍රියාවේ වියානා නුවරදී මියගොස් ඇත. | • අවසාන කාලයේ දී ශ්‍රවණාභාධිත තත්වයට පත්විය.<br>• 1827 මාර්තු 26 ඔසිට්‍රියාවේ වියානා නුවරදී මියගොස් ඇත. |
| ඉටු කළ නිර්මාණ | • ප්‍රාග්, ජුපිටර්, ද මැජික් ෆ්ලූට්, සිම්පනි නො 41.............. | • එරොයිකා, පැස්ටරෝල් ඇතුලු සිම්පනි 9 ක්, පියානෝ කොන්සර්ටෝ 5 ක්, පියානෝ සොනාටා 32 ක්, ස්ට්‍රිං ක්වාර්ටට් 16 ක් |

# යානි සංගීතඥයා

| | | |
|---|---|---|
| **නිපුණතාව** | : | සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්වයන් ළඟා කර ගැනීමට හුරුවෙයි. |
| **නිපුණතා මට්ටම** | : | බටහිර සම්භාව්‍ය සංගීතයේ සංධ්වනිවල ස්වභාවය විමසමින් රසාස්වාදයේ යෙදෙයි. |
| **ක්‍රියාකාරකම** | : | සංගීතඥ යානි |
| **කාලච්ඡේද** | : | 01 |
| **ඉගෙනුම් පල** | : | • වත්මනෙහි ජනප්‍රිය සංගීත කෘති රස විඳියි.<br>• නූතන ලෝකයේ ප්‍රසිද්ධ යානි නම් සංගීතඥයාගේ නිර්මාණ රසවිඳියි.<br>• සමූහ වාදන අංගයන්හි ඇති මිහිරිතාවය පිළිබඳ විමසයි. |
| **ගුණාත්මක යෙදවුම්** | : | • යානි සංගීතඥයා සහ ඔහුගේ වාදක මණ්ඩලයේ පින්තූරයක්.<br>• ඔහුගේ සංගීත ඛණ්ඩ ඇතුළත් CD තැටි හා D.V.D තැටි<br>• මොසාර්ට් ගේ අංක 40 G මයිනර් හා බීතෝවන් ගේ අංක 9 කෝරල් සංධ්වනිවල ස්වර ප්‍රස්තාර කිහිපයක්. |

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

Yani යනු නූතන ලෝකයේ Symphony orchestra සඳහා ප්‍රචලිත සංගීතඥයෙකි. ප්‍රසන්න පෙනුමකින් යුත් ඉතාලි ජාතික මෙම සංගීතඥයා අතින් නිර්මිත සමූහවාදන නිර්මාණ රාශියක් ලෝකයේ ප්‍රචලිතව පවතී. Acropolis, Tribute නිර්මාණ අප රට තුළ ද ඉතා ජනප්‍රියය. 2014 අප්‍රේල් මාසයේ 10 දින ශ්‍රී ලංකාවට පැමිණ කොළඹ සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගණයේ දී මෙරට රසිකයන් සඳහා සමූහ වාදන ප්‍රසංගයක් පවත්වා ඇත. මේ සංගීතඥයා පිළිබඳ කෙටි හැඳින්වීමක් ප්‍රමාණවත් නොවන අතර නිදහස් කාල වලදී අන්තර්ජාලය ඇසුරෙන් වැඩිදුර සොයා බැලීමට සිසුන් යොමු කිරීමට අවධානය යොමු කරන්න.

**පියවර 01**

- යානි සංගීතඥයා සහ ඔහුගේ වාදක මණ්ඩලයේ පින්තූරයක් පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- ඔහුගේ සංගීත ඛණ්ඩ ඇතුළත් CD තැටිය හෝ D.V.D තැටිය සිසුන්ට ප්‍රදර්ශනය කිරීමට හෝ ශ්‍රවණය කිරීමට සලස්වන්න.

(මිනිත්තු 10)

**පියවර 02**

- යානි සංගීතඥයාගේ නිර්මාණාත්මක සංගීතයේ විශේෂතා පිළිබඳව පහත සඳහන් මාතෘකා ඔස්සේ සිසු අදහස් විමසමින් සාකච්ඡාවක යෙදෙන්න.
  (එහි ඇතුළත් සංගීත භාණ්ඩ, තාල ක්‍රම (7/8) හා පෙරදිග සංගීත අංග, සංගීත ශිල්පීන්, ශ්‍රී ලාංකික බේස් ගිටාර් ශිල්පී, ඉන්දියානු බටනලා ශිල්පී, පෙරදිග බටනලාව, ගැන සිසුන් සමග කෙටි සාකච්ඡාවක යෙදෙන්න.)

(මිනිත්තු 20)

**පියවර 03**

- යානි සංගීතඥයාගේ නිර්මාණ පිළිබඳව සාකච්ඡා කළ කරුණු සිසුන්ගේ සටහන් පොත්හි ඇතුළත් කර ගැනීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- යානි සංගීතඥයාගේ නිර්මාණයන්හි තමන් රස විඳි කොටස් පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට සිසුන් ට අවස්ථාවක් දෙන්න.
- ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන සිසුන් අගයන්න.

**පැවරුම** අන්තර්ජාලය මගින් යානි සංගීතඥයාගේ වෙනත් නිර්මාණ හා ඔහුගේ තොරතුරු රැස් කිරීමට යොමු කරන්න.

# කෝඩ්ස් සංකල්පය ඉගෙන ගනිමු

**නිපුණතාව 1.0** : සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදාබැලීම් කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ව්‍යවහාරික සංගීතයේ ස්වභාවය හඳුනාගනිමින් ඒ හා සම්බන්ධ සරල නිර්මාණයක යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 01 යි.

**ඉගෙනුම් පල** :
- Chords සංකල්පය පිළිබඳ විස්තර කරයි.
- මෙය බටහිර සංගීත සංකල්පයක් වුවද ව්‍යවහාරික සංගීතයේ දී බහුලව යොදා ගන්නා බව පිළිගනියි.
- Major , Minor කෝඩ්ස් ගොඩනගයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ඇමුණුම අංක 01 ඇතුළත් දෘශ්‍ය උපකරණ .
- කාර්ය පත්‍රිකා අංක 1 හා 2 හි ඡායාපිටපත්.
- මෙලෝඩිකාවක්.
- සර්පිනාව හෝ ග්ලොකන්ස්පීල්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම් සඳහා උපදෙස් :**

- විද්‍යුත් ස්වර පුවරුවක ගීතයක් වාදනයේ දී වම් අතින් ගැළපෙන කෝඩ්ස් වාදනය කළහැකි බව.
- ඒවාට අදාළ නාමය එහි Display පුවරුවේ පෙන්වන බව.
- සරල තනුවක් වුවද ගැළපෙන කෝඩ්ස් යොදා ගැනීමෙන් එහි මිහිරිතාවය වැඩිවන බව.
- සරල සංගීතයේ දී බහුල ලෙස කෝඩ්ස් (Chords) භාවිත වන බව.

**පියවර 01**
- සිසුවෙකු ලවා සරල ගීතයක් ගායනයට යොමු කර ඒ මත සුදුසු භාණ්ඩයකින් කෝඩ්ස් වයා පෙන්වන්න. නැතහොත් ගිටාරයකින් හෝ විද්‍යුත් ස්වර පුවරුවකින් හෝ සර්පිනාවකින් කොටස් කිහිපයක් වයා පෙන්වන්න.

(මිනිත්තු 05)

**පියවර 02**
- කෝඩ් එකක ස්වර කිහිපයක් එකවර වාදනය වන බවත්, එහිදී වැඩි මිහිරි තාවයකින් යුක්ත වන බවත් සාකච්ඡා කරන්න. මුලින් සඳහන් කළ කරුණු කෙරෙහි ද අවධානය යොමු කරමින් කෝඩ්ස් යන්න පිළිබඳ ව සාකච්ඡාවක් කරන්න.
- ශුද්ධ ස්වර ඇතුළත් ප්‍රස්තාරයක් ප්‍රදර්ශනය කරමින් ඊට අදාළව තාලානුකූලව කෝඩ්ස් වාදනය වන අයුරු පැහැදිලි කරන්න.

(මිනිත්තු 20)

**පියවර 03**
- කෝඩ්ස් වර්ග කෝඩ්ස් නාම, කෝඩ්ස් වාදනය කළ හැකි සංගීත භාණ්ඩ ආදිය පිළිබඳ සිසුන්ගේ අදහස් විමසන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- වාචික ප්‍රශ්න කිහිපයක් යොදා ගනිමින් කෝඩ්ස් සංකල්පය විමසන්න.

(මිනිත්තු 05)

**පසු අභ්‍යාස :**
- නිදහස් කාල වලදී කෝඩ්ස් ඇතුලත් කර ඇති ගීත ප්‍රස්තාර සෙවීමට පොළඹවන්න.

**අතිරේක උදව් :**
- සංගීත ස්වර ලිපි සහිත පොත්.

# Major , Minor කෝඩ්ස් ඉගෙන ගනිමු

**නිපුණතාව 1.0** : සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ව්‍යවහාරික සංගීතයේ ස්වභාවය හඳුනාගනිමින් ඒ හා සම්බන්ධ සරල නිර්මාණයක යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- Chords සංකල්පය තුළ ඇති විවිධතා පැහැදිලි කරයි.
- පෙරදිග සංගීතය හදාරන අයෙකුට වුවද කෝඩ්ස් පිළිබඳ ඉගෙනුම අවශ්‍ය බව පිළිගනියි.
- Major , Minor කෝඩ්ස් ගොඩනගයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම අංක 01 ඇතුළත් දෘශ්‍ය උපකරණය.
- කාර්යපත්‍රිකා අංක 1 හා 2 හි ඡායාපිටපත්.
- මෙලෝඩිකාවක්
- සර්පිනාව හෝ ග්ලොකන්ස්පීල්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

Chords සංකල්පය මීට පෙර පාඩමේ දී සිසුන් සමග සාකච්ඡා කර ඇත. මෙම පාඩමේ දී Major , Minor කෝඩ්ස් ගොඩනැගීමට සිසුන්ට උපකාර කිරීම අපේක්ෂිතය. විශේෂයෙන් 11 ශ්‍රේණියට නිර්දේශිත C.Major, F.Major , G.Major ගොඩ නැගෙන අයුරු සහ C.Minor, F.Minor , G.Minor ගොඩ නැගෙන අයුරු හා ඒ ආශ්‍රිත නිර්මාණ පිළිබඳ සාකච්ඡා කිරීම මෙම පාඩමින් බලාපොරොත්තු වේ.

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- සිසුවෙකු ලවා සරල ගීතයක් ගායනයට යොමු කර ඒ මත සුදුසු භාණ්ඩයකින් කෝඩ්ස් වයා පෙන්වන්න. නැතහොත් ගිටාරයකින් හෝ විද්‍යුත් ස්වර පුවරුවකින් හෝ සර්පිනාවකින් කෝඩ්ස් කිහිපයක් වයා පෙන්වන්න. මුලින් සඳහන් කළ කරුණු කෙරෙහිද අවධානය යොමු කරමින් කෝඩ්ස් යන්න පිළිබඳ ව සාකච්ඡාවක් කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- ඇමුණුමේ සඳහන් වගුව ප්‍රදර්ශනය කරන්න. ඒ අනුව Major , කෝඩ්ස් ගොඩ නැගෙන අයුරු පැහැදිලි කර සිසුන් සමග හැකි ප්‍රමාණයක Major කෝඩ්ස් ගොඩ නගන්න.

(මිනිත්තු 25)

- ඒ අනුව Minor , කෝඩ්ස් ගොඩ නැගෙන අයුරු පැහැදිලි කර සිසුන් සමග හැකි ප්‍රමාණයක Minor , කෝඩ්ස් ගොඩ නගන්න.

(මිනිත්තු 25)

**පියවර 03**
- සර්පිනාවක් හෝ විද්‍යුත් ස්වර පුවරුවක් යොදා ගනිමින් ගුරුවරයා නම් කරන කෝඩ් එකක් සිසුන්ට වාදනය කිරීමට හැකිදැයි විමසන්න.


(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- වාචික ප්‍රශ්න කිහිපයක් යොදා ගනිමින් Major , Minor **කෝඩ්ස් වලට අයත් ස්වර විමසන්න.**

(මිනිත්තු 10)

**පසු අභ්‍යාස** : නිදහස් කාල වලදී පහත දැක්වෙන ගිටාර් කෝඩ්ස් තුන වාදනයට සිසුන් පොළඹවන්න.





**අතිරේක උදව්** : පුවත් පත් සඟරා ආදියේ දක්වා ඇති ගීත ප්‍රස්තාර මත ඇති කෝඩ්ස් ඉගෙනීමට යොමු කරන්න.

## කාර්ය පත්‍රිකාව 01.

# **Major chords** හඳුනා ගනිමු.

පහත දැක්වෙන ස්වර පුවරුව අධ්‍යනය කරන්න. එහි සප්තකයේ ස්වර 12 ට, 1 සිට 12 දක්වා අංක යොදා ඇත. ඒවා අර්ධ ස්වර 12 ක් නැතහොත් Semitone 12 ක් වශයෙන් ද හැඳින්විය හැකිය. (මෙම ක්‍රියාකාරකමේ දී එතරම් අවශ්‍ය නොවුනත් සම්පූර්ණ ස්වරයක (Tone) හඬක් වීමට අර්ධ ස්වර (Semitone) දෙකක් තිබිය යුතුය යන කාරණය මතකයේ රඳවා ගන්න. ස ස්වරයේ සිට රි ස්වරයට දුර ටෝන් (Tone) එකකි.නැතහොත් Semitone 2 කි.




පහත වගුව ඔබේ සටහන් පොතේ පිටපත් කර ගන්න. එහි හිස්තැන් පුරවමින් Chords සෑදෙන ආකාරය ඉගෙන ගන්න. ඒවා ස්වර පුවරුවේ වාදනය කර බලන්න. එකිනෙක නම් කරන අයුරු ඉගෙන ගන්න.

| | Major Chords ( 1+5+8+) | | | | |
|---|---|---|---|---|---|
| | ආරම්භක ස්වරය | 1st Note | නම් කිරීම | ආරම්භක ස්වරය 1 ලෙස ගත්කළ 1, 5, 8, අංක වලට හිමි ස්වර (පෙරදිග නමින් | අපරදිග නමින් |
| 1 | ස | C | C Major | ස + ග + ප | C+E+G |
| 2 | රි | D | D Major | රි + ම/ + ධ | D+ F# +A |
| 3 | ග | E | | | |
| 4 | ම | F | | | |
| 5 | ප | G | | | |
| 6 | ධ | A | | | |
| 7 | නි | B | | | |
| 8 | රි | C# | | | |
| 9 | ග | Eb | | | |
| 10 | ධ | Ab | | | |
| 11 | නි | Bb | | | |
| 12 | ම/ | F# | | | |

## කාර්ය පත්‍රිකාව 02.
## **Minor Chords** හඳුනා ගනිමු.

පහත වගුව ඔබේ සටහන් පොතේ පිටපත් කර ගන්න. එහි හිස්තැන් පුරවමින් Minor Chords සෑදෙන ආකාරය ඉගෙන ගන්න. ඒවා ස්වර පුවරුවේ වාදනය කර බලන්න. එකිනෙක නම් කරන අයුරු ඉගෙන ගන්න.

| ආරම්භක ස්වරය | 1st Note | නම් කිරීම | ආරම්භක ස්වරය 1 ලෙස ගත් කළ 1,4,8, අංක වලට හිමි ස්වර (පෙරදිග නමින්) | අපරදිග නමින් |
|---|---|---|---|---|
| ස | C | C Minor | ස + ග + ප | C + $E^b$ +G |
| රි | D | D Minor | රි + ම + ධ | D + F + A |
| ග | E | | | |
| ම | F | | | |
| ප | G | | | |
| ධ | A | | | |
| නි | B | | | |
| රි | $C^\#$ | | | |
| ග | $E^b$ | | | |
| ධ | $A^b$ | | | |
| නි | $B^b$ | | | |
| ම | $F^\#$ | | | |

# Harmony සිද්ධාන්ත මත නිර්මාණ කිරීමට ඉගෙන ගනිමු.

**නිපුණතාව 1** : සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ව්‍යවහාරික සංගීතයේ ස්වභාවය හඳුනා ගනිමින් ඒ හා සම්බන්ධ සරල නිර්මාණයක යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 02 යි

**ඉගෙනුම් පල** :
- Harmony සංකල්පය පැහැදිලි කරයි.
- පෙරදිග සංගීතය හදාරන අයෙකුට වුවද ස්වර සුසංගතවීම පිළිබඳ ඉගෙනුම අවශ්‍ය බව පිළිගනියි.
- Harmony වන ස්වර කොටස් ගොඩනගයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඇමුණුම අංක 01 ඇතුළත් දෘශ්‍ය උපකරණය.
- කාර්ය පත්‍රිකා අංක 1 හා 2 හි ඡායාපිටපත්.
- සර්පිනාව හෝ ස්වර වාද්‍ය භාණ්ඩයක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

Chords ගොඩනැගෙන අයුරු මේ වන විට සිසුන් අධ්‍යයනය කර ඇති නිසා මෙම පාඩමේ දී Harmony සිද්ධාන්තය සිසුන්ට අවබෝධ කිරීම අපේක්ෂිත ය. Harmony යනු සුසංගත වීම වශයෙන් හැඳින්විය හැකි ය. Chords ගොඩනැගෙන්නේ Harmony සිද්ධාන්තය ට අනුව නිසා එහි එකිනෙක ස්වර මිහිරිව සුසංගත වේ. කෝඩ් එකකට ස්වර තුනක් අවශ්‍ය වුවත් Harmony වීමට ස්වර දෙකක් පමණක් වුවද ප්‍රමාණවත් ය. මෙම සිද්ධාන්තය බටහිර සංගීතයට අදාළ සංකල්පයක් වුවත් නූතන ශ්‍රී ලාංකීය ව්‍යවහාරික සංගීතයේ සහ සරල සංගීතයේ දී බෙහෙවින් භාවිත වන්නකි. විශේෂයෙන් වේදිකා නාට්‍ය, ටෙලි නාට්‍ය, ගීත නාට්‍ය ආදියේ ගායන වාදනවල දී යොදා ගැනේ. පාසල් සංගීත ක්‍රියාකාරකම් වල දී ද Harmony යොදා ගන්නා අවස්ථා ඇත. සඩ්ජ පංචම භාවය, සඩ්ජ මධ්‍යම භාවය ආදී වශයෙන් පෙරදිග සංගීතයේ දී ද ස්වර සුසංගත වී ම පිළිබඳ ව සංගීතඥයින් අදහස් දක්වා ඇත. මෙම සංකල්පය ඉතා ගැඹුරු සංකල්පයක් වුවද සරල ව භාවිත කිරීම පමණක් මෙම වසරේ දී යොදා ගැනේ. 3rd Harmony, 5th Harmony ආදී වශයෙන් ඇමුණුම දක්වා ඇති විෂය කොටස් හා ක්‍රියාකාරකම් මේ සඳහා ඔබ ට උපකාරී වනු ඇත.

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- Harmony වන ස්වර කොටස් ඇතුළත් ගීතයක් හෝ වාදන කොටසක් සිසුන්ට ශ්‍රවණයට යොමු කරන්න. නැතහොත් සර්පිනාවක් මගින් ගීතයක කොටසක් Harmony ස්වර ඇතුළත් වනසේ වාදනය කර ශ්‍රවණයට සලස්වන්න. ස්වර සුසංයෝග වීම පිළිබඳ ව සාකච්ඡාවක් කරන්න.

පියවර 02 • ඇමුණුමේ කාර්ය පත්‍රිකා අංක 1 හි සඳහන් කොටස් ක්‍රියාත්මක කරන්න.

(මිනිත්තු 20)

• ඇමුණුමේ කාර්ය පත්‍රිකා අංක 2 හි සඳහන් කොටස් ක්‍රියාත්මක කරන්න.

(මිනිත්තු 25)

පියවර 03 • Harmony සිද්ධාන්තය අනුව ස්වර ආකාරයන් 3rd Harmony, 5th Harmony ආදී වශයෙන් ස්වර සුසංගත වන අයුරු පිළිබඳ සිසුන්ගෙන් අදහස් විමසන්න. ජන ගීවල දී වඩාත් සුදුසු Harmony ක්‍රමය පිළිබඳ අදහස් දැක්වීමට ඉඩ දෙන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

• ගුරුවරයා විසින් නිර්මාණය කළ සරල ස්වර ඛණ්ඩයක් හෝ ස්වර පාද දෙකක් සපයා ඒ මත Harmony කළ හැක. ස්වර ඛණ්ඩයක් ලිවීමට සිසුන්ට පවරන්න. එහි ඇති සදොස් තැන් නිදොස් කරන්න.

(මිනිත්තු 10)

**පසු අභ්‍යාස :**

• නිදහස් කාල වලදී Harmony කොටස් ඇතුළත් කර ඇති ගීත ප්‍රස්තාර සෙවීමට පොළඹවන්න.

**අතිරේක උදව් :** • Music Rudiments - Trinity College of Music

**කාර්ය පත්‍රිකා 01.**

පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න. පහත දැක්වෙන ස්වර කොටස ගායනයේ යොදවන්න.

1. පියවර - කණ්ඩායම් දෙකම එකවර - ස------ රි------ ග------
2. පියවර - කණ්ඩායම් දෙකම එකවර - ග------ ම------ ප------

(නිවැරදි ස්වර ස්ථාන ම සිසුන් ගායනයේ දී යොදා ගන්නා බවට වග බලා ගන්න)

3. පියවර - පළමු කණ්ඩායම් - ස------ රි------ ග------
4. පියවර - දෙවන කණ්ඩායම් - ග------ ම------ ප------
5. පියවර - එකවර - පළමු කණ්ඩායම් - ස------ රි------ ග------
   - දෙවන කණ්ඩායම් - ග------ ම------ ප------

(ස්වර පාද දෙක එකවර ගැයීමේ දී ස්වර සුසංගත වන බව Harmony වන බව සිසුන්ට පහදන්න. නැවත නැවත ගායනයේ යොදවන්න. ගයන අතරවාරයේ ශ්‍රවණයට ද යොමු කරන්න. ස්වර පාද දෙක කණ්ඩායම් දෙක අතර මාරු කොට ගායනයේ යොදවන්න. සාකච්ඡා කරන්න. ඕනෑම ස්වරයක සිට තුන්වන ස්වරය Harmony වන බව සිසුන්ට පහදන්න. එය 3rd Harmony වශයෙන් හැඳින්වේ.)

6 පියවර - කණ්ඩායම් දෙකම එකවර - ස- රි- /ග--- / ග- රි- /ස--- /

7. පියවර - කණ්ඩායම් දෙකම එකවර - ප- ධ- /නි--- / නි-ධ- /ප--- /

(නිවැරදි ස්වර ස්ථාන ම සිසුන් ගායනයේ දී යොදා ගන්නා බවට වග බලා ගන්න)

8. පියවර - පළමු කණ්ඩායම් - ස- රි- /ග--- / ග- රි- /ස--- /

9. පියවර - දෙවන කණ්ඩායම් - ප- ධ- /නි--- / නි-ධ- /ප--- /

10. පියවර - එකවර - පළමු කණ්ඩායම් - ස- රි- /ග--- / ග- රි- /ස--- /

- දෙවන කණ්ඩායම් - ප- ධ- /නි--- / නි-ධ- /ප--- /

(ස්වර පාද දෙක එකවර ගැයීමේ දී ස්වර සුසංගත වන බව Harmony වන බව නැවතත් සිසුන්ට පහදන්න. මුල් ක්‍රියාකාරකමේ දී සඩ්ජය සමග ගාන්ධාරය සුසංගත වූ බවද, මෙම ක්‍රියාකාරකමේ දී සඩ්ජය සමග පංචමය සුසංගත වූ බවද, සාකච්ඡා කරන්න. ඕනෑම ස්වරයක සිට තුන්වන ස්වරයත් පස්වන ස්වරයත් Harmony වන බව සිසුන්ට පහදන්න. පස්වන ස්වරය සුසංගතවීම 5th Harmony වශයෙන් හැඳින්වේ.)

කාර්ය පත්‍රිකා 02.

.

පහත දැක්වෙන ස්වර පද ගායනයේ යොදවන්න.

1. පියවර - පළමු කණ්ඩායම් Melody කොටස

- සසසරි/ ග---/මමමග/රි---/

නිනිනිස/රි---/ගගගරි/ස---/

2. පියවර - දෙවන කණ්ඩායම් Harmony කොටස

- ගගගම/ ප---/ධධධප/ම---/

රිරිරිග/ ම---/පපපම/ග---/

3. පියවර - කණ්ඩායමේ දෙකම එකවර

- |සසසරි/ ග---/මමමග/රි---/|
|ගගගම/ ප---/ධධධප/ම---/|

- |නිනිනිස/රි---/ගගගරි/ස---/|
|රිරිරිග/ ම---/පපපම/ග---/|

**කාර්ය පත්‍රිකා 03.**

ජන ගී ආශ්‍රිත නිර්මාණ වලදී ඉහත ක්‍රම දෙකටම වඩා සඩ්ජ මධ්‍යම භාවයේ ස්වර සුසංගත කිරීම වඩාත් රසවත් බව ඩබ්ලිව්. බී. මකුලොළුව ශූරීන්ගේ සහ සී. ද. එස්. කුලතිලක ශූරීන්ගේ නිර්මාණ මගින් රසිකයින් දැනුවත් කර ඇත. ඒ සම්බන්ධ අත්දැකීම් ලැබීමට පහත දැක්වෙන ජන ගී පද ගායනයේ යොදවන්න. ඕනෑම ස්වරයක සිට සිව්වන ස්වරයත් එකිනෙක සුසංගත වන බවත් Harmony වියහැකි බවත් සිසුන්ට පහදන්න. සිව්වන ස්වරය සුසංගතවීම 4th Harmony වශයෙන් අපට නම් කළ හැකිය)

1. පියවර - පළමු කණ්ඩායම (Melody) කොටස

+ නිස රි රි / රි - ගු රි /ස රිස රි ගුරි / ස - ස - /
+ බඹ වි ම / නෙව් දි සි/ ද ළ දා - / මැ දු ර ත/
+ දිය ව ඩ / නා - නිල / ය ද සො බා / නා - - - /

2. පියවර - දෙවන කණ්ඩායම (Melody) කොටස

+ ගම ප ප / ප - ධ ප / ම පම ප ධප / ම - ම- /
+ බඹ වි ම / නෙව් දි සි / ද ළ දා - / මැ දු ර ත/
+ දිය ව ඩ / නා - නි ල / ය ද සො බ / නා - - - /

3. පියවර - කණ්ඩායම් දෙකම එකවර (Melody) කොටස සහ Harmony කොටස ගායනයේ යොදවන්න.

(මිනිත්තු 10)

**අතිරේක උදව්** :

- 2007 - 9 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය අන්තර්ජාලය හරහා VCD / DVD යමන් මධ්‍යලය ගීත අඩංගු වීඩියෝ දර්ශන නරඹන්න.
- පිටු අංක 8 හි දැක්වෙන සංගීත ග්‍රන්ථ

# පෙරදිග ස්වර ප්‍රස්තාරය අපරදිග ක්‍රමයට ප්‍රස්තාර කිරීම

**නිපුණතාව 1** : සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ව්‍යවහාරික සංගීතයේ ස්වභාවය හඳුනා ගනිමින් ඒ හා සම්බන්ධ සරල නිර්මාණයක යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 01 යි

**ඉගෙනුම් පල** :
- අපරදිග ප්‍රස්තාර සංකේත පිළිබඳ අදහස් දක්වයි.
- අපරදිග ප්‍රස්තාර ක්‍රමය ඉගෙනීමේ ඇති වාසි පිළිබඳ තර්ක කරයි.
- අපරදිග ප්‍රස්තාරයක් අපරදිග ක්‍රමයට ප්‍රස්තාර කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- සර්පිනාව හෝ ස්වර වාද්‍ය භාණ්ඩයක්
- අපරදිග ප්‍රස්තාර කොටස්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම් සඳහා උපදෙස් :**

1) ශ්‍රේණියේ සිසුන් මේ වන විට අපරදිග ප්‍රස්තාරකරණය පිළිබඳ අත්දැකීම් ලබා ඇති අතර පෙරදිග ප්‍රස්තාරයක් අපරදිග ක්‍රමයටත්, අපරදිග ප්‍රස්තාරයක් පෙරදිග ක්‍රමයටත් පෙරළා ලිවීමේ හැකියාව ඇත. මෙම කාලච්ඡේදයේ දී විවිධ සංකේත සහිත පෙරදිග ප්‍රස්තාරයක් අපරදිග ක්‍රමයට ප්‍රස්තාර කිරීමට යොමු කිරීමෙන් ලබා ගත් අත්දැකීම් නැවත පුනරීක්ෂණය කිරීමට හැකියාව ඇත. මේ සඳහා සුදුසු ප්‍රස්තාරයක් ගුරුවරයා ට සපයා ගත හැකිය.

**පියවර 01** • අපරදිග ප්‍රස්තාර කොටස් ප්‍රදර්ශනය කරන්න. එහි ඇති විවිධ සංකේත පිළිබඳ නැවත හඳුන්වා දෙන්න.

(මිනිත්තු 05)

**පියවර 02** • ගුරුවරයා විසින් සපයන පෙරදිග ප්‍රස්තාරයක් අපරදිග ක්‍රමයට ප්‍රස්තාර කිරීමට යොමු කරන්න.

(මිනිත්තු 05)

**පියවර 03** • ප්‍රස්තාර කිරීමේ දී ඇති වූ අපහසුතා පිළිබඳ සිසුන් ගෙන් විමසන්න. එම කොටස් නිවැරදි කර ගැනීමට මග පෙන්වන්න.

(මිනිත්තු 10)


**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- අපරදිග ක්‍රමයට පෙරලූ ප්‍රස්තාරයේ සදොස් තැන් නිදෙස් කරන්න.

(මිනිත්තු 05)

**පසු අභ්‍යාස** :

- පහත දැක්වෙන ප්‍රස්තාර කොටස පෙරදිග ක්‍රමයට පෙරලා එක් එක් විභාගයට සුදුසු කෝඩ් එක හිස්තැන් මත ලියන්න.



1........ 2........... 3.......... 4........... 5........... 6............ 7........... 8...........

# නාඩගම් ගීත සහ නූර්ති ගීත අතර සංගීතයේ වෙනස

**නිපුණතාව 6.0** : රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින්, සංගීතමය ලක්‍ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 6.1** : නාඩගම් සහ නූර්ති සංගීතයේ ඇති වෙනස සංසන්දනාත්මකව ප්‍රායෝගිකව දක්වයි.

ක්‍රියාකාරකම 6.1.1 : නාඩගම් ගීත සහ නූර්ති ගීත අතර සංගීතයේ වෙනස

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 04 යි

**ඉගෙනුම් පල** :
- නාඩගම් සහ නූර්ති ශෛලීන්ගේ වෙනස අවබෝධ කරගෙන සංසන්දනයක් කරයි.
- නාට්‍ය ශෛලීන් දෙකෙහි සංගීතය, සංගීත ක්ෂේත්‍රයෙහි වර්ධනයට දායක වූ බව පිළිගනියි.
- නාඩගම් හා නූර්ති ගීත එකතු කිරීමට පෙලඹෙයි.

**ගුණාත්මක යෙදවුම්:**
- නාඩගම් හා නූර්ති ගීයක්
- සර්පිනාව, තබ්ලාව
- ඇමුණුම අංක 1 හි වගු සටහනක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම් සඳහා උපදෙස් :**

උරුට්ටුව හා දොහොරාව ඇතුළත් නාඩගම් හා නූර්ති ගීතයක් ගායනය කරන්න. නාඩගම් හා නූර්ති රංග සම්ප්‍රදායන්හි සංගීතමය වෙනස සංසන්දනය කිරීමට ඇමුණුම අංක 1 යටතේ වගුවක් පිළියෙල කර ඇත. එම වගුව සිසුන්ට බෙදා දී ලිපියක් සකස් කරවීම, මින් අපේක්‍ෂා කෙරේ.

**පියවර 01**
- නාඩගම් ගීතයක් හා නූර්ති ගීයක් සර්පිනාව වාදනය කරමින් ගායනා කරන්න.
- සිසුන් සමග මෙම ගීත පිළිබඳව සාකච්ඡාවක් මෙහෙයවන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- එම නාඩගම් සහ නූර්ති ගීත සිසුන් සමග ගායනය කරන්න.

(මිනිත්තු 30)

**පියවර 03**
- ඇමුණුම අංක 1 ට අදාළ වගුව පිටපත් කර සිසුන්ට බෙදා දෙන්න.
- වගුවේ තොරතුරු අධ්‍යයනය කර නාඩගම් හා නූර්ති සංගීතයේ වෙනස සංසන්දනය කරමින් ලිපියක් සකස් කරවන්න.

(මිනිත්තු 30)

**පියවර 04**
- කණ්ඩායම් වශයෙන් සකස් කළ ලිපිය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 40)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නූර්ති හා නාඩගම් යන ශෛලීන්වල වෙනස වගුවේ ඇතුළත් තොරතුරු ඇසුරින් සංසන්දනය, නිවැරදිව කිරීම අගයන්න. නූර්ති හා නාඩගම් ගීත ශ්‍රවණයට, තාලයට හා ස්වර ස්ථාන නිවැරදිව, දොහොරාව හා උරුට්ටුව ද සමග ගායනය කිරීම ඇගයීමට ලක්කරන්න.

(මිනිත්තු 10)

**පැවරුම** නාඩගම් හා නූර්ති පිළිබඳව නිර්මාණශීලී බිත්ති පුවත්පතක් සකස් කරවන්න.

**අතිරේක උදව් :-** • සිංහල ගැමි නාටකය - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර.

ඇමුණුම අංක 1 සඳහා ද ඇති වගුව භාවිතයට ගනිමින් ලිපියක් සකස් කරවන්න.

| අදාළ ශීර්ෂ | නාඩගම් | නූර්ති |
|---|---|---|
| සංගීත ශෛලීය | කර්නාටක | හින්දුස්ථානි |
| • තාල | • පසන් • චාපු<br>• තිර්ලානා<br>• වඩිමුඩි<br>• තංගපාඨ | • දාදරා • බෙම්ටෝ<br>• කෙහෙර්වා<br>• ජප්තාල්<br>• දීප්චන්දි |
| ගීත ආකෘති | ආකෘතියක් නැත | ස්ථායී / අන්තරා |
| සංගීත භාණ්ඩ | • සර්පිනාව<br>• හොරණෑව<br>• මද්දල් 2 (අඩුතාල හා වැඩි තාල සඳහා) | • සර්පිනාව<br>• තබ්ලාව<br>• වයලීනය |
| සුවිශේෂ අංග | උරුට්ටුව | දොහොරාව |
| සංගීතඥයින් | අලගනායිදු | • විශ්වනාත් ලව්ජි<br>• අබ්දුල් සතාර්<br>• අමීර් ඛාන්<br>• ජයා ශංකර් |
| ප්‍රචලිත නාට්‍ය | • ඉයුජින්, බැලසන්ත,<br>• වෙස්සන්තර, සුළඹාවතී | • රාමායනය<br>• ශ්‍රී වික්‍රම රාජසිංහ<br>• විධුර, පද්මාවතී |

**ක්‍රියාකාරකම් 20**

# නූර්ති සංගීතයේ රාගධාරී පසුබිම

**නිපුණතාව 6.0** : රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින්, සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 6.1** : නාඩගම් සහ නූර්ති සංගීතයේ ඇති වෙනස සංසන්දනාත්මකව ප්‍රායෝගිකව දක්වයි.

**ක්‍රියාකාරකම 6.1.2** : නූර්ති සංගීතයේ රාගධාරී පසුබිම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 02 යි

**ඉගෙනුම් පල** :
- නූර්ති ගීත ගායනය කරයි.
- නූර්ති ගීතවල රාගධාරී පසුබිම විස්තර කරයි.
- නූර්ති ගීතයට අදාළ රාගයේ විස්තර වගු ගත කරයි.
- රාග අංග ලියා දක්වයි.

**ගුණාත්මක යෙදවුම්:**
- නූර්ති ගීත ලියූ දෘශ්‍යාධාර
- සර්පිනාව, තබ්ලාව
- ඇමුණුම අංක 1 වගුව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම් සඳහා උපදෙස් :**

- අප ගුණසරු සිංහල භූපති - භෛරවී රාගය.
- රකිනු ඊශ්වරා - කාෆි රාගය
- සවන්දී පෙර රාම චරිතේ අසව් - බිලාවල් රාගය

යන ගීත ගායනය සඳහා යොදා ගන්න.

**පියවර 01**
- සවන් දී පෙර රාම චරිතේ අසව් නූර්ති ගීතය ගුරුවරයා ගායනය කර, සිසුන්ට ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ගීතය පාදක වූ රාගය හා රාග අංග පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- නූර්ති ගීත වල දෘශ්‍යාධාර ප්‍රදර්ශනය කරමින්, එක් ගීතයක් ගුරුවරයා ගායනා කරන්න.
- ගීතයේ නාදමාලා තහවුරු වනතෙක්, පාදයෙන් පාදය ගායනය කරවන්න.
- ස්වර ප්‍රස්තාරය ප්‍රදර්ශනය කරමින් එහි ඇතුළත් රාග අංග ගුරුවරයා ගයමින්, පැහැදිලි කර දෙන්න.
- ඇමුණුම අංක (1) වගු සටහන සිසුන්ට ලබාදී, සම්පූර්ණ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 30)

**පියවර 03**
- නූර්ති ගීත 3 නැවත වරක් ගායනය කරවන්න.
- කණ්ඩායම් වශයෙන් පිළිතුරු සැපයූ වගුව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 40)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නූර්ති ගීත, ශ්‍රැති, තාල හා ස්වර අනුව නිවැරදිව ගායන කිරීමත්, මිහිරිව ඉදිරිපත් කිරීමත්, අගයන්න.

(මිනිත්තු 10)

පැවරුම නූර්ති ගීත එකතුවක් කර එහි රාගධාරී පසුබිම පිළිබඳව පොත් පිංචක් සකස් කරවන්න.

ඇමුණුම අංක (01) වගුව සම්පූර්ණ කරන්න.

| ගීතය | රාගය | තාලය | ආරෝහණ -අවරෝහණ | ස්වර සංගති |
|---|---|---|---|---|
| (1) සවන්දි පෙර රාම චරිතේ අසව් | | | | |
| (2) රකිනු ඊශ්වරා | | | | |
| (3) අපගුණසරු සිංහල භූපති | | | | |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සිසුන්ට තාලපද ප්‍රස්තාර කිරීමට අවස්ථා ලබා දී සදොස් තැන් නිදොස් කරන්න.

(මිනිත්තු- 10 යි)

පැවරුම නිර්දේශිත තාල පද වගුවක් සකස් කරන්න.

**අතිරේක උදව් :-** • 8, 11 ශ්‍රේණි - ගුරු මාර්ගෝපදේශ - 2008

# රේඛාව චිත්‍රපටයේ සංගීතය සහ තෝරාගත් ගීත ගායනය

**නිපුණතාව 6.0** : සරල සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 6.1** : ශ්‍රී ලංකාවේ චිත්‍රපට ගීතවල නිර්මාණාත්මක අගය තර්කානුකූලව විමසමින් තෝරාගත් ගීත ගයයි.

**ක්‍රියාකාරකම 6.1.2** : රේඛාව චිත්‍රපටයේ සංගීතය සහ තෝරාගත් ගීත ගායනය.

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 01 යි

**ඉගෙනුම් පල** :
- රේඛාව චිත්‍රපටයේ සංගීතය පිළිබඳ විස්තර කරයි.
- රේඛාව චිත්‍රපටයේ ගීත නම් කරයි.
- රේඛාව චිත්‍රපටයේ ගීත ගයයි.

**ගුණාත්මක යෙදවුම්:**
- රේඛාව චිත්‍රපටයේ තෝරාගත් ගීතය ලියූ දෘශ්‍යාධාරය
- රේඛාව චිත්‍රපටයේ ගීත ඇතුළත් ශ්‍රව්‍ය පටිය.
- සර්පිනාවක්, තාල වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම් සඳහා උපදෙස් :**

මේ වන විට සිසුන් ග්‍රැමෆෝන් ගීත, නූර්ති ගීත, ආදී වශයෙන් විවිධ ගීත වර්ග රාශියක් පිළිබඳ අධ්‍යයනය කර ඇත. සිංහල චිත්‍රපට ඉතිහාසයේ ස්වාධීනව තනු නිර්මාණය කළ " රේඛාව" චිත්‍රපට ඉතිහාසයේ සුවිශේෂී ස්ථානයක් ගෙන ඇත. එම චිත්‍රපටයේ අධ්‍යක්ෂණය, පදරචනය, තනු නිර්මාණය හා සංගීතය පිළිබඳව විස්තරයක් කරමින් "සුදු සඳ එළියේ නල මත පොබයන " ගීතය ඉගැන්වීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂා කෙරේ.

පාඩම සංවර්ධනය :-

පියවර 01
- රේඛාව චිත්‍රපටයේ එන ගීතයක කොටසක් ගායනා කරමින් ඒ පිළිබඳව අදහස් විමසයි.

(මිනිත්තු 05)

පියවර 02
- රේඛාව චිත්‍රපටයේ ගීතය පිළිබඳව දී ඇති ශීර්ෂ ඔස්සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ගීතය ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කර එම ගීතය ගායනා කර සිසුන්ට ශ්‍රවණය කිරීමට අවස්ථාවක් ලබා දෙන්න.
- කණ්ඩායම් වශයෙන් නාද මාලාව තහවුරු වන තෙක් ගායනා කරවන්න.

(මිනිත්තු 20)

පියවර 03
- නූර්ති ගීත 3 නැවත වරක් ගායනය කරවන්න.

(මිනිත්තු 40)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- කේවලව හා කණ්ඩායම් වශයෙන් ගීතය නිවැරදිව ගැයූ සිසුන් තෝරා ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු- 05 යි.)

පැවරුම — රේඛාව චිත්‍රපටයේ ගීත එකතුවක් කර නිදහස් කාලච්ඡේද වලදී ගායනා කිරීමට යොමු කරවන්න.

**අතිරේක උදව් :-** • 2008 - 11 ශ්‍රේණිය - ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

**ක්‍රියාකාරකම් 22**

# සත්සමුදුර

**නිපුණතාව** : සරල සංගීත හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම** : ශ්‍රී ලංකාවේ චිත්‍රපට ගීතවල නිර්මාණාත්මක අගය තර්කානුකූලව විමසමින් තෝරා ගත් ගීත ගයයි.

**ක්‍රියාකාරකම** : සත්සමුදුර චිත්‍රපටයේ සංගීත නිර්මාණය

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 01 යි

**ඉගෙනුම් පල** :
- චිත්‍රපට සංගීතය පිළිබඳව අදහස් දක්වයි.
- සත්සමුදුර චිත්‍රපටයේ සංගීතය පිළිබඳව අදහස් දක්වයි.
- අනෙකුත් චිත්‍රපට හා සත්සමුදුර චිත්‍රපටියේ ගීත අතර වෙනස දක්වයි.

**ගුණාත්මක යෙදවුම්:**
- සත්සමුදුර චිත්‍රපටියේ ගීත ඇතුළත් C.D පටය.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම් සඳහා උපදෙස් :**

බටහිර සංගීතයේ බොහෝ ශිල්ප ක්‍රම ඇසුරු කොට ගෙන නිර්මාණය කර ඇති සත්සමුදුර චිත්‍රපටයේ සංගීතය පිළිබඳව සාකච්ඡා කිරීම මෙම පාඩමින් අපේක්ෂිතය. අනෙකුත් චිත්‍රපටවලට වඩා මෙම චිත්‍රපටයේ සංගීතයෙහි විශේෂත්වය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම ද අපේක්ෂිතය.

පියවර 01 • ගුරුවරයා විසින් සත් සමුදුර චිත්‍රපටය පිළිබඳව කෙටි සමාලෝචනයක් කරන්න. (කථා සාරය, තේමා වාදනය පිළිබඳ, නළු නිළියන්, පරිසරය, ආදිය ඉස්මතුවන පරිදි ගුරුවරයාගේ අදහස් ඉදිරිපත් කරන්න.

(මිනිත්තු 10)

පියවර 02 • චිත්‍රපටයේ තේමා වාදනය කිහිප වරක් ශ්‍රවණයට සලස්වන්න. ඇමුණුම අංක 01 හි වගුව සම්පූර්ණ කරන්න.

(මිනිත්තු 10)

පියවර 03 • ශ්‍රවණය කරන ලද තේම වාදනය පිළිබඳ සිසුන්ගේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- 3 වන සිය වසේ දී සිසුන් දැක්වූ අදහස් ද ගුරුවරයාගේ අදහස්ද සමග එකතු කරමින් පෝෂණය කරන්න. තව දුරටත් සංවර්ධනාත්මක විග්‍රහයක යෙදෙන්න.

(මිනිත්තු 10)

පැවරුම සත්සමුදුර චිත්‍රපටය නරඹන්න.

අතිරේක උදව් :- • 2008 11 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය පිටු අංක 122 - 125

ඇමුණුම අංක 01

| බටහිර සංගීත ශිල්ප ක්‍රම | යොදාගෙන ඇති භාණ්ඩ | යොදාගෙන ඇති තාල | ගායනය |
|---|---|---|---|
| | | | |

**ක්‍රියාකාරකම් 23**

# චිත්‍රපට ගීත ගායනය

**නිපුණතාව 5.0** : සරල සංගීත හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 5.1** : ශ්‍රී ලංකාවේ චිත්‍රපට ගීතවල නිර්මාණාත්මක අගය තර්කානුකූලව විමසමින් තෝරා ගත් ගීත ගයයි.

**ක්‍රියාකාරකම 5.1.1** : තෝරා ගත් චිත්‍රපට ගීතයක් ගායනය

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 02 යි

**ඉගෙනුම් පල** :
- චිත්‍රපට ගීතයක් ගායනය කරයි.
- විවිධ සංගීත ශෛලීන්ගෙන් නිර්මිත චිත්‍රපට ගීත නම් කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- නිර්දේශිත චිත්‍රපටියේ ගීත ඇතුළත් C.D පටයක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම් සඳහා උපදෙස් :**

ගායනය කිරීම සඳහා චිත්‍රපට 6 ක ගීත නිර්දේශ කර ඇත. මෙයින් එක් ගීතයක් තෝරාගෙන සිසුන් ගායනය සඳහා යොමු කරවීම. මෙම පාඩමෙන් අපේක්ෂිතය. සිසුන්ගේ ගායන කුසලතාවය අනුව සුදුසු ගීතයක් මේ සඳහා තෝරා ගන්න. කාලය ප්‍රමාණවත් වේ නම් එක් ගීතයකට වඩා ගායනය කිරීම ගුරුවරයාගේ අභිමතය පරිදි සිදුකළ හැකිය. නිර්දේශිත චිත්‍රපට ගීත පහත දැක්වේ.

| | | |
|---|---|---|
| රේඛාව | - | සුදුසඳ එළියේ |
| සැඩ සුළං | - | ඉදිරියටා යමු සැවො මා |
| රන්මුතු දූව | - | පිපී පිපී |
| ගැටවරයෝ | - | හාරිච්චි - බෝරිච්චි |
| සත්සමුදුර | - | සිනිඳු සුදු මුතු |
| එක්ටැම්ගේ | - | උන්මාද සිතුවම් |
| හුලවාලි | - | කුල ගෙදරින් |

පියවර 01
- තෝරා ගත් ගීතයට අදාළව ඇමුණුම අංක 01 සඳහන් තොරතුරු සිසුන් වෙත ඉදිරිපත් කරන්න.
- එම චිත්‍රපටය තිරගත වූ කාල වකවානුවේ ලංකාවේ සංගීතමය පරිසරය ගැන කෙටි සාකච්ඡාවක් කරන්න.

(මිනිත්තු 05)

පියවර 02
- තෝරාගත් චිත්‍රපට ගීතය ශ්‍රවණයට සලස්වන්න. නැතහොත් වාදනය සමගින් රසවත්ව ගායනය කරන්න.
- ගීතය කොටසින් කොටස ගායනයට හුරු කරවන්න.
- ස්වර පුවරුවක් හා තාල වාද්‍ය භාණ්ඩයක් සහිතව තව දුරටත් තනි තනිව හා සාමූහික වශයෙන් ගායනය පුහුණු කරවන්න.

පියවර 03
- රසවත් වූ ක්‍රමවේද භාවිත කරමින් ගීතය රසවත්ව ගායනයට හුරු කරන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය පිළිබඳ උපදෙස් :**

- තනි තනිව හෝ සාමූහික වශයෙන් ගායනය කරවා ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 10)

ඇමුණුම අංක 01

| චිත්‍රපටය හා තිරගතවූ වර්ෂය | අධ්‍යක්ෂණය | සංගීත අධ්‍යක්ෂ | ගී තනු නිර්මාණය | ගීත ප්‍රබන්ධය | ගායක ගායිකාවන් | ඇතුළත් වූ ගීත |
|---|---|---|---|---|---|---|
| සැඩ සුළං | ටී. සෝමසේකරන් | ඇස්. දක්ෂිණ මූර්ති | ආනන්ද සමරකෝන් | ආනන්ද සමරකෝන්<br>ඩී. ටී. ප්‍රනාන්දු | ජමුනා රානි<br>ඒ. එම්. රාජා<br>මොහිදීන් බෙග්<br>ධර්මදාස වල්පොල<br>කේ. රානි සරෝජා<br>පියදාස ගුණසේකර<br>ආනන්ද සමරකෝන්<br>සුනිල් ප්‍රේමසාද<br>ලතා මංගේෂ්කාර් | සිරි දැරූ හෙළදිව<br>ජීවනමේ ගමන<br>පෙම් කැකුළ පිපී<br>සැදැවත් උතුම්<br>ඕ එන්න ඕ එන්න<br>ප්‍රීතිවන්න<br>ඉදිරියටා යමු<br>සැවොමා<br>හිස්වී ගියේ ය. |
| රන්මුතුදූව | මයික් විල්සන් | W.D අමරදේව | W.D අමරදේව | චන්ද්‍රරත්න මානවසිංහ | නන්දා මාලිනී,<br>නාරද දිසාසේකර | ගලන ගඟකි<br>පිපී පිපී රේණු<br>පාරමිතා බල |
| ගැටවරයෝ | මයික් විල්සන් | W.D අමරදේව | W.D අමරදේව | මහගම සේකර | අමරදේව<br>නාරද දිසාසේකර<br>ලතා වල්පොල | ආරිච්චි බෝරිච්චි<br>සීන සතක් මැද |
| සත්සමුදුර | මහාචාර්ය සිරි ගුණසිංහ | සෝමදාස ඇල්විටිගල | සෝමදාස ඇල්විටිගල | මහගම සේකර | W.D අමරදේව | සිනිඳු සුදුමුතු<br>පිපුණු කුසුම |
| එක්ටැම්ගේ | සරත් දසනායක | සරත් දසනායක | | සුනිල් ආරියරත්න | ගුණදාස කපුගේ | උන්මාද සිතුවම් |
| හුලවාලි | සිරි කුලරත්න | වික්ටර් රත්නායක | වික්ටර් රත්නායක | ප්‍රේමකීර්ති ද අල්විස් | බන්දුල විජේවීර<br>සුනිල් එදිරිසිංහ<br>ලතා වල්පොල | කුල ගෙදරින්<br>කුඩාගමේ මද්දහනේ |

**ක්‍රියාකාරකම් 24**

# මා පිය ගුණවරුණ ඇතුළත් ගීත රසවිඳියි

**නිපුණතාව 5.2** : සරල සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම** : මව්පිය ගුණවරුණ සඳහන් ගීත ගායනය කරයි. රස විඳියි.

**කාලච්ඡේද** : 01 යි

**ඉගෙනුම් ඵල** :
- මව්පිය ගුණවරුණ ඇතුළත් වෙනත් ගීත සෙවීමට පෙළඹේ.
- එම ගීතවල පදමාලාවෙන් ප්‍රකාශවන අදහස් විස්තර කරයි.
- ගී පද මාලාව සහ තනුව සුසංගත වී ඇති අයුරු සාකච්ඡා කරයි.
- ගීතය නිවැරදිව ගායනය කරයි.
- මව්පිය සෙනෙහස පිළිබඳව අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ගීත ඇතුළත් ශ්‍රව්‍ය පට, දෘශ්‍ය ආධාරකය, හාර්මෝනියම් එක.

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

මව්පියන්ගේ ගුණ වර්ණනා කෙරෙන, මව්පිය සෙනෙහස පිළිබඳව රචනා වී ඇති ගීත රසාස්වාදයට යොමුකරවමින් සිසුන් තුළ යහපත් ආකල්ප, සාරධර්ම ගොඩ නැංවීම සඳහා නූතන ව්‍යවහාරික සංගීත ක්ෂේත්‍රයේ රචනා වී ඇති ජනප්‍රිය ගීත දෙකක් රසවින්දනයට යොමු කරවීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ. විශේෂයෙන් මෙම ගීත වලින් මතුවන අදහස සාකච්ඡා කිරීම වඩාත් වැදගත්ය. මේ සඳහා පහත දැක්වෙන ගීත අතුරින් ගීතයක් තෝරා ගන්න.

1 අන්දරයායේ වැව් තාවුල්ලේ - කරුණාරත්න දිවුල්ගනේ
2 අම්මාවරුනේ - නන්දා මාලිනී
3 ගමට කලින් හිරු - කරුණාරත්න දිවුල්ගනේ

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- තෝරාගත් ගීතය ශ්‍රව්‍ය පටයක් මගින් සිසුනට ශ්‍රවණයට සලස්වන්න, නැවත නැවත කිහිප වාරයක් ශ්‍රවණයට සලස්වා ගී පදමාලාවෙන් පිළිබිඹු වෙන අර්ථය පිළිබඳ සාකච්ඡා කරන්න. අර්ථ රසය උද්දීපනය වන ලෙස යොදා ඇති තනුව, ගායකයාගේ කටහඬ, ගීතයට යොදාගෙන ඇති සංගීත භාණ්ඩ, රිද්මය, යන කරුණු ඔස්සේ සාකච්ඡාව මෙහෙයවන්න.

(මිනිත්තු 30)

**පියවර 02**
- ස්වර වාද්‍ය භාණ්ඩය උපයෝගී කර ගනිමින් ගීතය රසවත් ලෙස ගයා වයා දක්වන්න. සිසුන් සමග ගීතය ගායනා කරන්න. කණ්ඩායම් වශයෙන්, යුගල සහ ඒකල වශයෙන් කාලය යෙදෙන අයුරු බලා ඇගයීම සිදු කරන්න.

(මිනිත්තු 30)

**ඇගයීම් හා තක්සේරුකරණය.**

- මව්පිය සෙනෙහස පිළිබඳව අගය කරමින් අදහස් දක්වයි.
- ගීතය නිවැරදිව ගායනය කරයි.
- තේමාවට අදාළව ලියැවී ඇති ගීත එක්රැස් කරයි.
- මව්පිය ගුණ වරුණ අගයමු යන මාතෘකාවට අදාළ ව බිත්ති පුවත්පතට ලිපියක් සකස් කරයි.

# සොකරි

**නිපුණතාව 6.0** : රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම ලබයි.

**නිපුණතා මට්ටම 6.2** : සොකරි රංග සම්ප්‍රදාය හඳුනා ගනිමින් ගීත ගායනය.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01 යි

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

ශ්‍රී ලංකාවේ ප්‍රචලිත රංග සම්ප්‍රදායන් අතුරින්, දේශීය අනන්‍යතාවය පැහැදිලිව පෙන්නුම් කෙරෙන ගැමි නාට්‍යය ලෙස සොකරි හැඳින්විය හැකිය.

- සොකරි කථා ප්‍රවෘත්තිය ලුහුඩින්, හා එහි ඇතුළත අංග හා එහි විශේෂතා පැහැදිලි වනසේ කියවීම් පත්‍රිකාවක් සකස් කරන්න. ගායනය සඳහා ගීත කිහිපයක් යොදා ගන්න.

**ඉගෙනුම් පල** :

- ලංකාවේ ගැමි නාටක අතරින් සොකරි නාටකයේ සාම්ප්‍රදායික තොරතුරු විමසයි.
- සොකරි ගීත ගායනය කරයි.
- නාට්‍ය ගීත අතරින් සොකරි ගීත වෙන් කොට හඳුනා ගනියි.

**ගුණාත්මක යෙදවුම්:**

- සොකරි නාට්‍ය පිළිබඳ තොරතුරු ඇතුළත් කියවීම් පත්‍රිකාවක්.
- සොකරි ගීත කිහිපයක පද මාලා හා ස්වර රචනා ලියූ දෘශ්‍යාධාරයක්.
- ස්වර පුවරු සංගීත භාණ්ඩයක්, ගැට බෙරයක්.
- කොළපතකින් සාදා ගත් වෙස් මුහුණක්.

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**

- ස්වර පුවරුව ආධාර කරගෙන සොකරි ගීතයක් රසවත්ව ගායනය කරමින් පාඩමට පිවිසෙන්න.
- ගායනයට සිසු/ සිසුවියන්ද හවුල් කර ගන්න.

(මිනිත්තු 05)

**පියවර 02**

- ඔබ විසින් සාදා ගත් කියවීම් පත්‍රිකාව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- ඒ ආධාරයෙන් සොකරි කථාව ලුහුඩින් විස්තර කරන්න.
- චරිත හැඳින්වීමේදී කොළපතකින් සාදා ගත් වෙස් මුහුණද, උපයෝගි කරගන්න.
- සොකරි ගීතය පාදයෙන් පාදය ගායනය කරවන්න.

(මිනිත්තු 35)

**පියවර 03**

- සොකරි කථාවේ කොටසක් රංගනය කිරීමට ඉදිරිපත් වන සිසුන්ට ඊට අවස්ථාව ලබා දෙන්න.
- සොකරි කථාවේ පසුබිම තුළින් එහි ශාන්ති කර්ම අංග හා විශේෂ ලක්ෂණ පිළිබඳව විස්තරයක් සිසු අභ්‍යාස පොතේ ලිවීමට උපදෙස් දෙන්න.
- සොකරි ගීත රසවත්ව ගායනය කිරීමට අවස්ථාව ලබාදෙන්න.

(මිනිත්තු 40)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- අභ්‍යාස පොතේ ලියූ විස්තරය ඇගයීමට ලක්කරන්න.
- ගායනයෙන් හා රංගනයෙන් දක්ෂතාවය දක්වන සිසුන් අගය කරන්න.

**පැවරුම :**

- සම්පූර්ණ කථා ප්‍රවෘත්තිය සපයා ගෙන වාර අවසාන විවිධ ප්‍රසංගය සඳහා සිසු/සිසුවියන්ට සූදානම් වීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 05)

**අතිරේක උදව් :**

- මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර - ගැමි නාටකය
- 2009 - 12 ශ්‍රේණිය ගුරුමාර්ගෝපදේශය - පිටු අංක 176 - 177

# මධ්‍යමය ශ්‍රැති කරගනිමින් ආරෝහණ අවරෝහණ ස්වර පිහිටන අයුරු සහ ප්‍රස්තාරකරණය.( F Major/Minor Scale )

**නිපුණතාව 6.0** : රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්‍ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම ලබයි.

**නිපුණතා මට්ටම 6.2** : විවිධ ස්වර ශ්‍රැති කර ගනිමින් ප්‍රස්තාර කරණයේ යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 02 යි.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

C Major ගොඩනැගෙන අයුරු මේ වන විට සිසුන් අධ්‍යයනය කර ඇති නිසා මෙම පාඩමේ දී F major Scale සහ F minor Scale පිළිබඳ සිසුන්ට අවබෝධ කිරීම අපේක්‍ෂිතය. Scale යනු කිසියම් සිද්ධාන්තයකට අනුව පෙළ ගසා ගත් අවම ස්වර පහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක ආරෝහණ අවරෝහණ ස්වරූපය වශයෙන් හැඳින්විය හැකිය. Major Minor Scale ගොඩනැගෙන්නේ සිද්ධාන්තයක ට අනුව නිසා එය හඳුන්වා දීම වඩාත් ඵලදායි වේ. මේ පිළිබඳ වැඩි විස්තර අතිරේක කියවීම් පොතට ඇතුළත් කර ඇත.

**ඉගෙනුම් පල** :
- Major , Minor සංකල්ප පැහැදිලි කරයි.
- පෙරදිග සංගීතය හදාරන අයෙකුට වුවද, Scale පිළිබඳ ඉගෙනුම අවශ්‍ය බව පිළිගනියි.
- F major, F minor Scale ගොඩනගයි.

**ගුණාත්මක යෙදවුම්**:
- ඇමුණුම අංක 01 ඇතුළත් දෘශ්‍ය උපකරණ
- කාර්යපත්‍රිකා අංක 1 හා 2 හි ඡායා පිටපත්.
- සර්පිනාව හෝ ස්වර වාද්‍ය භාණ්ඩයක්

**පාඩම සංවර්ධනය** :

පියවර 01
- C major Scale යට අයත් ගීතයක් හෝ වාදන කොටසක් සිසුන්ට ශ්‍රවණයට යොමු කරන්න. නැතහොත් සර්පිනාවක් මගින් ගීතයක කොටසක් C Major Scale යට ඇතුළත් වනසේ වාදනය කර ශ්‍රවණයට සලසන්න. '' ස '' ස්වරය ශ්‍රැතිය ලෙස යොදාගත් අයුරු සාකච්ඡාවක් කරන්න. එම ගීතයම F major Scale යට අයත් ලෙස ට වාදනය කර ශ්‍රවණයට සලසන්න.'' ම '' ස්වරය ශ්‍රැතිය ලෙස යොදාගත් අයුරු සාකච්ඡාවක් කරන්න

(මිනිත්තු - 10)

පියවර 02
- ඇමුණුමේ කාර්ය පත්‍රිකා අංක 1 හි සඳහන් කොටස් සිසුන් ලවා ක්‍රියාත්මක කර Major ස්කේලයේ සිද්ධාන්තය පැහැදිලි කරන්න.

(මිනිත්ත 25)

- ඇමුණුමේ කාර්ය පත්‍රිකා අංක 2 හි සඳහන් කොටස් සිසුන් ලවා ක්‍රියාත්මක කර Minor ස්කේලයේ සිද්ධාන්තය පැහැදිලි කරන්න.

(මිනිත්තු - 25)

පියවර 03 • Major Minor සිද්ධාන්තය ට අනුව ස්කේල ගොඩ නැගෙන ආකාරයත් පිළිබඳ සිසුන්ගෙන් අදහස් විමසන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ගුරුවරයා විසින් නිර්මාණය කළ ශුද්ධ ස්වර ඇතුළත් ස්වර ඛණ්ඩයක් සහ කෝමල ගධනි ඇතුළත් ස්වර පාද දෙකක් සපයා එය F major සහ F Minor Scale වලට පෙරළා ලිවීමට සිසුන්ට පවරන්න. එහි ඇති සදොස් තැන් නිදොස් කරන්න.

(මිනිත්තු 10)


පැවරුම : • නිදහස් කාල වලදී F Major- F Minor ස්කේලයන්ට අදාළව සකස්කර ඇති ගීත ප්‍රස්තාර සෙවීමට පොලඹවන්න.


අතිරේක උදව් : • Music Rudiments – Trinity College of Music

ඇමුණුම 01

**කාර්ය පත්‍රිකා අංක 01.**

1. පහත දැක්වෙන කොටස් කියවමින් රූප සටහන අධ්‍යයනය කරන්න.
2. එහි C Major ස්කේලයට අයත් ස,රි,ග,ම,ප,ධ,නි,ස, යන ආරෝහණයේ එක් එක් ස්වර අතර ඇති පරතරය වටහා ගන්න.
3. Tone එකක් සම්පූර්ණ ස්වරයක් වශයෙන් හැඳින්වේ. Tone එකකට අර්ධ ස්වර (Semi Tone) දෙකක ප්‍රමාණයේ පරතරයක් ඇත. රූප සටහනේ ස්වර 12 තුළ දැක්වෙන සුදු කලු යතුරු මගින් මෙය දැක ගත හැකිය.
4 ස-රි අතර Tone එකක් , රි-ග අතර Tone එකක් ඹ ග-ම අතර Semi Tone එකක්, ම-ප අතර Tone එකක් ප-ධ අතර Tone එකක්, ධ-නි අතර Tone එකක් සහ නි-ස අතර Semi Tone




එකක් වශයෙන් ස්වර සප්තකය පිහිටයි. එහි C Major ස්කේලයට අයත් ස,රි,ග,ම,ප,ධ,නි,ස, යන ආරෝහණයේ Tone+Tone+Semi Tone + Tone+Tone+Tone+Semitone යන සිද්ධාන්තයේ ස්වර පිහිටයි. එම සිද්ධාන්තය අංක මගින් පැහැදිලි කළොත් මෙසේ දැක්විය හැකි ය.1+1+½+1+1+1+½ පහත රූප සටහනේ හෝ ස්වර පුවරුවක ශුද්ධ ස්වර සප්තකය දෙස මැනවින් බැලුවොත් සුදු සහ කලු යතුරු මගින් මෙම සිද්ධාන්තය ඔබට මැනවින් පෙනේවි. ග-ම අතරත් නි-ස අතරත් වෙනත් ස්වරයක් නැත. ඒ අනුව ඕනෑම Major ස්කේලයකට අයත් ස්වර වල 3-4 ස්වර අතරත්, 7-8 ස්වර අතරත් වෙනත් ස්වරයක් නැත.

5. ඉහත රූප සටහනේ C Major ස්කේලයට අයත් ස,රි,ග,ම,ප,ධ,නි,ස, යන ආරෝහණ ස්වර F Major ස්කේලයට අනුව පරිවර්තනය වීමේ දී ම,ප,ධ,නි,ස,රි,ග,ම, වශයෙන් සෑදෙන අයුරු අධ්‍යයනය කරන්න. F Major ස්කේලයට අයත් ස්වර අතර ද, Tone+Tone+Semi Tone + Tone+Tone+Tone+Semitone යන සිද්ධාන්තය පිහිටයි. පහත වගුව බලන්න.

T = Tone
ST= Semitone

| සිද්ධාන්තය | T | T | ST | T | T | T | ST | |
|---|---|---|---|---|---|---|---|---|
| සිද්ධාන්තය | 1 | 1 | ½ | 1 | 1 | 1 | ½ | |
| C Major | C | D | E | F | G | A | B | C |
| | ස | රි | ග | ම | ප | ධ | නි | ස |
| F Major | F | G | A | Bb | C | D | E | F |
| | ම | ප | ධ | නි | ස | රි | ග | ම |

6. ඔබ දන්නා ස්වර ස්ථාපන ගීතයක් (කඳුපෙළ අතරේ, කඳු නඳු නැගෙනා, ඈත ඈදී යළි වැනී ) C Major ස්කේලයට අයත් ලෙස ප්‍රස්තාර කරන්න.
7. එම ප්‍රස්තාරය F Major ස්කේලයට අයත් ලෙස පෙරළා ප්‍රස්තාර කරන්න.

**කාර්ය පත්‍රිකා අංක 02.**

1. පහත දැක්වෙන කොටස් කියවමින් ඉහත රූප සටහන අධ්‍යයනය කරන්න.
2. C Minor ස්කේලයට අයත් ස,රි,ග,ම,ප,ධ,නි,ස, යන ආරෝහණයේ ග,ධ,නි, යන ස්වර කෝමළ වේ. එක් එක් ස්වර අතර ඇති පරතරය වටහා ගන්න.
3. ස්වර පුවරුවේ දළ රූප සටහනක් ඇඳ C Minor ස්කේලයට අයත් ස,රි,ග,ම,ප,ධ,නි,ස, යන ස්වර ලකුණු කරන්න.
4. C Minor ස්කේලයට අයත් ස,රි,ග,ම,ප,ධ,නි,ස, යන ආරෝහණයේ Tone+SemiTone+ Tone + Tone+SemiTone+Tone+Tone යන සිද්ධාන්තයේ ස්වර පිහිටයි. එම සිද්ධාන්තය අංක මගින් පැහැදිලි කළොත් මෙසේ දැක්විය හැකියි.1+½+1+1+½+1+1
   ස Tone රි SemiTone ග Tone ම Tone ප SemiTone ධ Tone නි Tone සී
   ස රිග ම පධ නි ස
   C D$E^{b}$ F G$A^{b}$ $B^{b}$ C
5. ඉහත සිද්ධාන්තය අනුව F Minor ස්කේලයට අයත් ස්වර ගොඩනගන්න.
6. C Minor ස්කේලයට අයත් ගුරුවරයා සපයන ස්වර ප්‍රස්තාරය F Minor ස්කේලයට අයත් ලෙස පෙරළා ප්‍රස්තාර කරන්න.

**ඇමුණුම 02**

**කාර්ය පත්‍රිකා අංක 02.**

1. ඕනෑම ස්වරයක් ශ්‍රැති ස්වරය කර ගෙන Major' Minor ස්කේල සෑදිය හැකි ය. ඒ අනුව සංගීතයේ Major , Minor ස්කේල 12 බැගින් සෑදේ. ඒවා C Major , $C^{\#}$ Major, D Major , $E^{b}$ Major " C Minor, C# Minor ආදී වශයෙන් නම් කෙරේ.
2. කෝමළ නි ශ්‍රැති ස්වරය කරගෙන, පංචමය ශ්‍රැති ස්වරය කරගෙන Major; Minor ස්කේල සැකසීමට සිසුන් යොමු කරන්න.

# කෝමළ නිෂාදය ශ්‍රැති කරගනිමින් ආරෝහණ අවරෝහණ ස්වර පිහිටන අයුරු සහ ප්‍රස්තාර කරණය. ( $B^b$ Major/Minor Scale )

**නිපුණතාව 7** : සංගීත නිර්මාණකරණයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 7.2** : විවිධ ස්වර ශ්‍රැති කර ගනිමින් ප්‍රස්තාරකරණයේ යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 02 යි.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

F Major, F Minor Scale ගොඩනැගෙන අයුරු මේ වන විට සිසුන් අධ්‍යයනය කර ඇති නිසා මෙම පාඩමේ දී B Flat major Scale සහ B Flat minor Scale පිළිබඳ සිසුන්ට අවබෝධ කිරීම අපේක්ෂිතය. Major Minor Scale ගොඩනැගෙන සිද්ධාන්තය ට අනුව B Flat major Scale සහ B Flat minor Scale ගොඩනගන්න. මේ පිළිබඳ වැඩි විස්තර අතිරේක කියවීම් පොතට ඇතුළත් කර ඇත. මේ සඳහා මීට පෙර පාඩමේ දක්වා ඇති ක්‍රියාකාරකම් සැලසුම අනුව මෙම පාඩමට සුදුසු ලෙස ක්‍රියාකාරකම ගොඩ නගා ගන්න. අවශ්‍ය ඇමුණුම් මීට පෙර පාඩමේ දක්වා ඇති අයුරින් සකසා ගන්න.

**ඉගෙනුම් පල** :

- B flat Major , B Flat Minor සංකල්ප පැහැදිලි කරයි.
- සංගීතය හදාරන අයෙකුට $B^b$ Scale පිළිබඳ ඉගෙනුම නිර්මාණකරණයේ දී අවශ්‍ය බව පිළිගනියි.
- B Flat major, B Flat minor Scale ගොඩනගයි.
- B Flat major, B Flat minor Scale ගොඩනගයි.

**ගුණාත්මක යෙදවුම්**:

- මීට පෙර දක්වා ඇති පරිදි සකසා ගත් ඇමුණුම අංක 01 ඇතුළත් දෘශ්‍ය උපකරණ
- සකසා ගත් කාර්ය පත්‍රිකා අංක 1 හා 2 හි ඡායාපිටපත්
- සර්පිනාව හෝ ස්වර වාද්‍ය භාණ්ඩයක්

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**

- C major Scale යට අයත් ගීතයක් හෝ වාදන කොටසක් සිසුන්ට ශ්‍රවණයට යොමු කරන්න. නැතහොත් සර්පිනාවක් මගින් ගීතයක කොටසක් C Major Scale යට ඇතුළත් වනසේ වාදනය කර ශ්‍රවණයට සලසන්න.'' ස '' ස්වරය ශ්‍රැතිය ලෙස යොදාගත් අයුරු සාකච්ඡාවක් කරන්න. එම ගීතයම $B^b$ major Scale යට අයත් ලෙස ට වාදනය කර ශ්‍රවණයට සලසන්න. '' <u>නි</u> '' ස්වරය ශ්‍රැතිය ලෙස යොදාගත් අයුරු සාකච්ඡාවක් කරන්න

(මිනිත්තු - 10)

පියවර 02 • ඔබ විසින් සකසා ගත් කාර්ය පත්‍රිකා අංක 1 හි සඳහන් කොටස් සිසුන් ලවා ක්‍රියාත්මක කර $B^b$ Major ස්කේලය ගොඩනගන්න.

(මිනිත්ත 25)

• ඔබ විසින් සකසා ගත් කාර්ය පත්‍රිකා අංක 2 හි සඳහන් කොටස් සිසුන් ලවා ක්‍රියාත්මක කර $B^b$ minor ස්කේලයේ සිද්ධාන්තය පැහැදිලි කරන්න.

(මිනිත්තු - 25)

පියවර 03 • Major Minor සිද්ධාන්තය ට අනුව ස්කේල ගොඩනැගෙන ආකාරයත් පිළිබඳ සිසුන්ගෙන් අදහස් විමසන්න.

(මිනිත්තු - 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

• ගුරුවරයා විසින් නිර්මාණය කළ ශුද්ධ ස්වර ඇතුළත් ස්වර ඛණ්ඩයක් සහ කෝමළ ගධනි ඇතුළත් ස්වර පාද දෙකක් සපයා එය Bb major සහ Bb Minor Scale වලට පෙරලා ලිවීමට සිසුන්ට පවරන්න. එහි ඇති සදොස් තැන් නිදොස් කරන්න.

(මිනිත්තු 10)

**පසු අභ්‍යාස** නිදහස් කාල වලදී Bb Major- Bb Minor ස්කේලයන්ට අදාළව සකස්කර ඇති ගීත ප්‍රස්තාර සෙවීමට පොලඹවන්න.

**අතිරේක උදව් :-** Music Rudiments – Trinity College of Music

**ඇමුණුම :**

1. C Major ස්කේලයට අයත් ස,රි,ග,ම,ප,ධ,නි,ස, යන ආරෝහණ ස්වර Bb Major ස්කේලයට අනුව පරිවර්තනය වීමේ දී නි,ස,රි,ග,ම,ප,ධ,නි වශයෙන් සැදෙන අයුරු අධ්‍යයනය කරන්න. Bb Major ස්කේලයට අයත් ස්වර අතර ද, Tone+Tone+Semi Tone + Tone+Tone+Tone+Semitone යන සිද්ධාන්තය පිහිටයි. පහත වගුව බලන්න.
T = Tone

ST= Semitone

| සිද්ධාන්තය | *T* | *T* | *ST* | *T* | *T* | *T* | *ST* | |
|---|---|---|---|---|---|---|---|---|
| සිද්ධාන්තය | 1 | 1 | ½ | 1 | 1 | 1 | ½ | |
| C Major | C | D | E | F | G | A | B | C |
| | ස | රි | ග | ම | ප | ධ | නි | ස |
| $B^b$ Major | $B^b$ | C | D | $E^b$ | F | G | A | $B^b$ |
| | නි | ස | රි | ග | ම | ප | ධ | නි |

2 ඔබ දන්නා ස්වර ස්ථාපන ගීතයක් ( කඳුපෙළ අතරේ, කඳු නඳු නැගෙනා, ඇත ඇදී යළි වැනී ) C Major ස්කේලයට අයත් ලෙස ප්‍රස්තාර කරන්න.

3 එම ප්‍රස්තාරය Bb Major ස්කේලයට අයත් ලෙස පෙරළා ප්‍රස්තාර කරන්න.

4. Bb Minor ස්කේලයට අනුව පරිවර්තනය වීමේ දී නි,ස,රි,ග,ම, ම/, ධ, නි වශයෙන් සැදෙන අයුරු අධ්‍යයනය කරන්න. Bb Major ස්කේලයට අයත් ස්වර අතර ද, Tone+Semi Tone +Tone+ Tone+Tone+SemiTone+Tone යන සිද්ධාන්තය පිහිටයි. පහත වගුව බලන්න.

T = Tone
ST= Semitone

| සිද්ධාන්තය | *T* | *ST* | *T* | *T* | *ST* | *T* | *T* | |
|---|---|---|---|---|---|---|---|---|
| සිද්ධාන්තය | 1 | ½ | 1 | 1 | ½ | 1 | 1 | |
| C Minor | C | D | $E^b$ | F | G | $A^b$ | $B^b$ | C |
| | ස | රි | ග | ම | ප | ධ | නි | ස |
| $B^b$ Major | $B^b$ | C | $D^b$ | $E^b$ | F | $F^\#$ | $A^b$ | $B^b$ |
| | නි | ස | රි | ග | ම | ම/ | ධ | නි |

5. ඉහත සිද්ධාන්තය අනුව $B^b$ Minor ස්කේලයට අයත් ස්වර ගොඩනගන්න.
6. මෙහිදී ස්වර පුවරුවේ සියලුම කලු පැහැති ස්වර එක් වන බව පෙන්වා දෙන්න.
7. C Minor ස්කේලයට අයත් ගුරුවරයා සපයන ස්වර ප්‍රස්තාරය $B^b$ Minor ස්කේලයට අයත් ලෙස පෙරළා ප්‍රස්තාර කරන්න.

# පංචමය ශ්‍රැති කරගනිමින් ආරෝහණ අවරෝහණ ස්වර පිහිටන අයුරු සහ ප්‍රස්තාර කරණය. ( G Major/Minor Scale )

**නිපුණතාව 6.0** : විවිධ ස්වර ශ්‍රැති කර ගනිමින් ප්‍රස්තාරකරණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම 6.2 :** විවිධ ස්වර ශ්‍රැති කර ගනිමින් ප්‍රස්තාරකරණයේ යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 02 යි.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

F Major, F Minor, Bb Major, Bb Minor Scale ගොඩනැගෙන අයුරු මේ වන විට සිසුන් අධ්‍යයනය කර ඇති නිසා මෙම පාඩමේ දී G major Scale සහ G minor Scale පිළිබඳ සිසුන්ට අවබෝධ කිරීම අපේක්ෂිතය. Major Minor Scale ගොඩනැගෙන සිද්ධාන්තය ට අනුව G major Scale සහ G minor Scale ගොඩනගන්න. මේ පිළිබඳ වැඩි විස්තර අතිරේක කියවීම් පොතට ඇතුළත් කර ඇත. මීට පෙර ක්‍රියාකාරකම් වලදී යොදා ගත් පිළිවෙළ මේ සඳහා ද යොදා ගත හැකිය. F Major, F Minor, Bb Major, Bb Minor ආදී පාඩම් වල දක්වා ඇති ක්‍රියාකාරකම් සැලසුම අනුව මෙම පාඩමට සුදුසු ලෙස ක්‍රියාකාරකම ගොඩ නගාගන්න. අවශ්‍ය ඇමුණුම් මීට පෙර පාඩමේ දක්වා ඇති අයුරින් සුදුසු ලෙස සකසා ගන්න.

**ඉගෙනුම් පල** :

- G Major , G Minor සංකල්ප පැහැදිලි කරයි.
- සංගීතය හදාරන අයෙකුට G- Scale පිළිබඳ ඉගෙනුම නිර්මාණකරණයේ දී අවශ්‍ය බව පිළිගනියි.
- G major, G minor Scale ගොඩනගයි.
- සර්පිනාවෙන් මෙම ස්කේල වාදනය පුහුණු වෙයි.
- ප්‍රස්තාරයක් G major, G minor Scale වලට පෙරලා ප්‍රස්තාර කිරීමේ හුරුව ලබයි

**ගුණාත්මක යෙදවුම්:**

- මීට පෙර දක්වා ඇති පරිදි සකසා ගත් ඇමුණුම අංක 01 ඇතුළත් දෘශ්‍ය උපකරණ
- මීට පෙර දක්වා ඇති පරිදි සකසා ගත් කාර්යපත්‍රිකා අංක 1හා 2 හි ඡායාපිටපත්.
- සර්පිනාව, හෝ ස්වර වාද්‍ය භාණ්ඩයක්

**පාඩම සංවර්ධනය :**

පියවර 01

- C major Scale යට අයත් ගීතයක් හෝ වාදන කොටසක් සිසුන්ට ශ්‍රවණයට යොමු කරන්න. නැතහොත් සර්පිනාවක් මගින් ගීතයක කොටසක් C Major Scale යට ඇතුළත් වනසේ වාදනය කර ශ්‍රවණයට සලසන්න. '' ස '' ස්වරය ශ්‍රැතිය ලෙස යොදාගත් අයුරු සාකච්ඡාවක් කරන්න.එම ගීතයම G major Scale යට අයත් ලෙස ට වාදනය කර ශ්‍රවණයට සලසන්න. ''පංචම '' ස්වරය ශ්‍රැතිය ලෙස යොදාගත් අයුරු සාකච්ඡාවක් කරන්න.

(මිනිත්තු - 10)

පියවර 02 • ඔබ විසින් සකසා ගත් කාර්යපත්‍රිකා සිසුන් ලවා ක්‍රියාත්මක කර G Major ස්කේලය ගොඩ නගන්න.

(මිනිත්ත 25)

• ඔබ විසින් සකසා ගත් කාර්යපත්‍රිකා කොටස් සිසුන් ලවා ක්‍රියාත්මක කර G minor ස්කේලයේ සිද්ධාන්තය පැහැදිලි කරන්න.

(මිනිත්ත 25)

පියවර 03 • Major Minor සිද්ධාන්තය ට අනුව G major, Minor Scale ස්කේල ගොඩ නැගෙන ආකාරයත් පිළිබඳ සිසුන්ගෙන් අදහස් විමසන්න.

• සපයා ගත් සරල ස්වර ප්‍රස්තාරයක් G major, Minor Scale ස්කේල වලට පෙරළා ප්‍රස්තාර කරවන්න.

(මිනිත්තු - 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

• ගුරුවරයා විසින් නිර්මාණය කළ ශුද්ධ ස්වර ඇතුළත් ස්වර ඛණ්ඩයක් සහ කෝමළ ගධනි ඇතුළත් ස්වර පාද දෙකක් සපයා එය F major සහ F Minor Scale වලට පෙරළා ලිවීමට සිසුන්ට පවරන්න. එහි ඇති සදොස් තැන් නිදොස් කරන්න.

(මිනිත්තු 10)

**පසු අභ්‍යාස** • නිදහස් කාල වලදී F Major- F Minor ස්කේලයන්ට අදාළව සකස්කර ඇති ගීත ප්‍රස්තාර සෙවීමට පොලඹවන්න.

**අතිරේක උදව් :-** Music Rudiments – Trinity College of Music

**ඇමුණුම:**

1. C Major ස්කේලයට අයත් ස,රි,ග,ම,ප,ධ,නි,ස, යන ආරෝහණ ස්වර G Major ස්කේලයට අනුව පරිවර්තනය වීමේ දී **ප, ධ,නි,ස,රි,ග,ම/, ප,** වශයෙන් සැදෙන අයුරු අධ්‍යයනය කරන්ත. G Major ස්කේලයට අයත් ස්වර අතර ද, Tone+Tone+Semi Tone + Tone+Tone+Tone+Semitone යන සිද්ධාන්තය පිහිටයි. ගුරුවරයා ඉදිරිපත් කරන වගුව බලන්න.
2. (ඉහත පාඩම් වල ලබා දී ඇති උපදෙස් පරිදි මෙම පාඩම සඳහා ද සුදුසු ලෙස වගුවක් ගුරුවරයා විසින් සකසා ලබා දෙන්න )
3. C Major ස්කේලයට අයත් ගුරුවරයා සපයන ස්වර ප්‍රස්තාරය G Major ස්කේලයට අයත් ලෙස පෙරළා ප්‍රස්තාර කරන්න.
4. C Minor ස්කේලයට අයත් ස,රි,ග,ම,ප,ධ,නි,ස, යන ආරෝහණ ස්වර G Minor ස්කේලයට අනුව පරිවර්තනය වීමේ දී **ප,ධ,නි,ස,රි,ග,ම, ප,** වශයෙන් සැදෙන අයුරු අධ්‍යයනය කරන්න.
5. ස්වර පුවරුවක රූප සටහනක් ඇඳ පැහැදිලි කරන්න.
6. C Minor ස්කේලයට අයත් ගුරුවරයා සපයන ස්වර ප්‍රස්තාරය G Minor ස්කේලයට අයත් ලෙස පෙරළා ප්‍රස්තාර කරන්න.

# සංගීතය පටිගත කර ගබඩා කර ගන්නා සහ පටිගත කළ සංගීතය නැවත ශ්‍රවණය සඳහා ගන්නා උපකරණ.

**නිපුණතාව 9.0** : සංගීතයේ තාක්ෂණික මෙවලම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

**නිපුණතා මට්ටම 9.1** : සංගීතය පටිගත කිරීමේ ක්‍රම ශිල්ප හඳුනා ගැනීම සඳහා ධනාත්මක විචාරයක යෙදෙයි.

**ක්‍රියාකාරකම** 9.1.1 : සංගීතය පටිගත කර ගබඩා කර ගන්නා සහ පටිගත කළ සංගීතය නැවත ශ්‍රවණය සඳහා ගන්නා උපකරණ.

(CD, DVD, Blue Ray Disk, MD, Hard Disks, Audio Cassets, pool tapes, Memery chips (Micro, SD) Pendrive, iPOD, DV,VHS

**කාලච්ඡේද** සංඛ්‍යාව : කාලච්ඡේද 01 යි.

**ඉගෙනුම් පල** :
- සංගීතය පටිගත කරන හා ගබඩා කරන උපකරණ හඳුනා ගනී. (තැටි, පටි)
- ඒ එක් එක් උපකරණය පිළිබඳව වෙන් වෙන්ව විස්තර කිරීමේ කුසලතාව ලබයි.
- මෙම උපකරණ මත සංගීතය පටිගත වන ආකාරය අවධාරණය කරයි. (තැටි, පටි)
- පටිගත කිරීම අත්හදා බැලීමට පෙලඹෙයි

**ගුණාත්මක යෙදවුම්:**
- කැසට් පටයක්
  CD, DVD, Blue Ray , Pendrive,
  Memery chip — Micro / SD කොටස්
  DVD Player එකක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම් සඳහා උපදෙස් :**

- මෙය පාඩම සාර්ථකව නම් කිරීමට පරිගණක විද්‍යාගාරය සහ පාසලේ IT ගුරුවරයාගේ සහාය ලබාගත යුතුයි.
- මෙය පූර්ණ වශයෙන් පටිගත කිරීමේ තාක්‍ෂණය පිළිබඳ පාඩමකි.
- මෙය සැලසුම් කිරීමේ දී ගුරුවරයා ඉතා උනන්දුවෙන් කරුණු සපයා නිවැරදිව දැනුවත් විය යුතුමය.
- මෙම තාක්ෂණික කරුණු පිළිබඳ දැනුවත් වීමේ දී අන්තර් ජාලය හා විවිධ පතපොත පරිශීලනය අත්‍යවශ්‍යය.

පාඩම සංවර්ධනය

**පියවර 01**
- ගුරුවරයා විසින් එක් එක් උපකරණ පෙන්වා ඒවා පිළිබඳව දරුවන් සමඟ සාකච්ඡා කරන්න.
- මේවායේ විශේෂත්වය, වැදගත්කම, දියුණු බව තාක්‍ෂණය පිළිබඳ සාකච්ඡා කරන්න, විමසන්න, එක් එක් උපකරණ පරීක්ෂා කිරීමට ඉඩ ලබා දෙන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- ඇමුණුම අංක 01 පත්‍රිකාව බෙදා දී කියවීමට උපදෙස් ලබා දෙන්න.

(මිනිත්තු 30

පියවර 03
- එම කරුණු වලට අදාළව ප්‍රශ්න අසන්න.
- විස්තර කිරීමට කාලය ලබා දෙන්න.
- අදහස් විමසන්න.
- ග්‍රැමෆෝන් තැටියේ සිට වර්තමානය දක්වා පත් වී ඇති දියුණුව පිළිබඳ විමසන්න.
- කෙටියෙන් සටහන් කරන ලෙසට උපදෙස් දෙන්න.

(මිනිත්තු 40)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- එක් එක් උපකරණය පිළිබඳව තනිතනිව විස්තර කිරීමට අවස්ථාව ලබා දී අගයන්න.

(මිනිත්තු 10)

**පසු අභ්‍යාස** මේ එක් එක් උපකරණ වර්ග පිළිබඳව ගැඹුරින් කරුණු සොයා (අන්තර්ජාලයෙන්) රූප සටහන් පින්තූර සමග පොත් පිංචක් නිර්මාණය කරන්න.

**ගුරුවරයාට උදව් :-** 2008 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 10, 11 කියවන්න. අන්තර්ජාලය පිරික්සන්න.

ඇමුණුම අංක 01

අද ලෝකය පුරා ව්‍යාප්ත වන තාක්‍ෂණික තරගකාරිත්වය තුළ සංගීතය පටිගත කිරීම, ගබඩා කිරීම, ශ්‍රවණය ආදිය සඳහා විවිධ උපකරණ ඇත. විවිධ iPOD (අයිපොඩ්) වර්ග MP3 Player) Head phones ආදිය නිදසුන්ය. අද හෙඩ්පෝනය තුළ සංගීතය ගබඩා කර ශ්‍රවණය කළ හැකි අයුරින් නිර්මාණය වී තිබේ.

මීට ශතවර්ෂයකට පෙර සිට මෙසේ සංගීතය ගබඩා කොට ශ්‍රවණය කිරීමේ උපකරණ ලෙස ග්‍රැමෆෝන් තැටිය හා ග්‍රැමෆෝනය සමාජය තුළ ජනප්‍රිය විය. ඉන් පසු චුම්බක පට තුළ සංගීතය පටිගත වීම හා වාදනය වීම ඇරඹිණි. DAT එහි ප්‍රධාන ස්ථානය ගනී. MD පට (Mini DISK) ඉන් පසුව විවිධ නිර්මාණ උපකරණ ලොව පුරා ව්‍යාප්ත විය.

පහත දැක්වෙන පින්තූර බලා මෙම එක් එක් උපකරණ හඳුනාගන්න.
ඔබ ඉගෙන ගත් දෑ ඇසුරෙන් මෙම වගුව සම්පූර්ණ කරන්න.

| Disk | Tapes | Microchips |
|---|---|---|
| | | |

# Music DISKS and TAPES

## TAPES




Pool Tape




MD Player




MD



Cassett




DV Cassett



VHS Cassett & Player




Digital Audio Tape (DAT)

DISKS






ග්‍රැමෆෝන් තැටිය




Hard Disk

ග්‍රැමෆෝනය




SD Chip




Micro SD Chip



CD




DVD



Blue Ray Disk




Mini Disk



Pendrive

# Music Recording Using Multi track

**නිපුණතාව** : අතීතයේ තාක්ෂණික මෙවලම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

**නිපුණතා මට්ටම 9.1.1** : සංගීතය පටිගත කිරීමේ ක්‍රම ශිල්ප ගනිමින් සංසන්දනාත්මක විචාරයක යෙදෙයි.

ක්‍රියාකාරකම : Multi Track Recording

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 01 යි.

**ඉගෙනුම් පල** :
- පරිගණකය ඇසුරෙන් සංගීතය පටිගත කළ හැකි බව වටහා ගනී.
- සංගීතය පටිගත කළහැකි මෘදුකාංග කිහිපයක් හඳුනා ගනී.
- Multi Track යනු හඳුනා ගනියි.
- පරිගණක ඇසුරෙන් සංගීත පටිගත කිරීමට පෙලඹෙයි.

**ගුණාත්මක යෙදවුම්:**
- පරිගණකයක් (speakers සමග ) මෘදුකාංග තැටි කිහිපයක ඡායාරූප හෝ තැටි පරිගණක සංගීත ආශ්‍රයෙන් නිර්මාණය කළ ගීතයක් හෝ සංගීත ඛණ්ඩයක් සංගීත පටිගත කිරීම් මෘදුකාංගයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම් සඳහා උපදෙස් :**

- මෙම පාඩම සර්ථකව කිරීමට නම් ගුරුවරයා පරිගණක සංගීත පිළිබඳ යම් අවබෝධයක් ලබා තිබිය යුතුයි. නැතහොත් මේ පිළිබඳ දන්නා සම්පත් පුද්ගලයකු උදව් කර ගනිමින් කරගත හැක. මෙම පාඩමෙන් අපේක්ෂා කෙරන්නේ දරුවන්ට පරිගණක භාවිත කිරීම හඳුන්වා දීමත් ඒවා උපයෝගී කරගෙන නිර්මාණ කාර්යයේ යෙදීමට පෙලඹවීමක් ලබා දීමත්ය.

**පාඩම සංවර්ධනය :-**

**පියවර 01** • පරිගණක භාවිත කරමින් පරිගණකය ඇසුරින් නිර්මිත ගීතය, වාදනය කරන්න. මෙහි අන්තර්ගතය පිළිබඳ පැහැදිලි කරන්න. මේවා සජීවී භාණ්ඩ වාදනය නොකර (සාම්පල් හා සවුන්ඩ් ෆොන්ට්) ලෙස නිර්මාණය වී ඇති බව පවසන්න. ඇමුණුම් අංක 01 කියවන්න. Multi Track පිළිබඳව සාකච්ඡා කරන්න. ඒවා පටිගත කරන ආකාරය පිළිබඳ දළ පැහැදිලි කිරීමක් කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02** • පරිගණක මෘදුකාංග තැටි ප්‍රදර්ශනය කරන්න. පරිගණක තුළ ස්ථාපිත කර ඇත්නම් එය විවෘත කරන්න. එයින් Multi Track වලින් ගීතයක් නිර්මාණය වන අයුරු පෙන්වන්න. (ඇමුණුම් අංක 02) ඇමුණුම් අංක (1) සහ (2) දරුවන්ට කියවීමට ලබා දෙන්න.

(මිනිත්තු 30)

**පියවර 03** • සජීවී එකවර වාදනය කරමින් පටිගත කිරීමට වඩා Multi Track Recording හි ඇති වාසි අවාසි පිළිබඳ සිසුන් හා සාකච්ඡා කරන්න. සියළු Track පටිගත කිරීමෙන් අනතුරුව මේවා නාද සංයෝජනය කරගත යුතු බව හා විවිධ ආටෝපයන් FX (EFFECTS) යොදා ගත යුතු බවත් ඉතා සූක්ෂම ආකාරයෙන් මේවා සංයෝජය කළයුතු බවත් පැහැදිලි කරමින් සිසුන් සමග එම ක්‍රියාවන්හි නිරත වන්න.

(මිනිත්තු 40)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- Multi Track Recording පිළිබඳ පැහැදිලි කිරීමක් කිරීමට එක් සිසුවෙක් ඉදිරියට කැඳවන්න.
- කණ්ඩායම් දෙකකට බෙදා මෙහි වාසි අවාසි පිළිබඳව විවාදයක් ගොඩ නගන්න.

**පසු අභ්‍යාස** පරිගණකයක් මගින් මෙම මෘදුකාංගයක් ස්ථාපිත කරමින් නිර්මාණය කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න. YouTube ඇසුරින් මාර්ගෝපදේශනය ලබා ගත හැකි බව පවසන්න.

**ගුරුවරයාට උදව් :-** 2008 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි මේ පිළිබඳව ලියවී ඇති පාඩම කියවන්න.

අන්තර්ජාලයට පිවිස YouTube හි මෙයට අදාළ දේවල් සොයා නරඹන්න.

ඇමුණුම අංක 01

## Sample හා Sound fonts

යම් කිසි භාණ්ඩයක නාදය (ස. රි .ග. ම. ........) ආදී වශයෙන් හෝ තාල වාද්‍ය භාණ්ඩයක නම් විවිධ නාද ස්ථාන පටිගත කර සංගීත නිර්මාණයන් සඳහා ප්‍රතිනිර්මාණය කොට ගත හැකි අයුරින් සැකසීම Sample sound fonts යනුවෙන් හැඳින්වේ. නියම භාණ්ඩයෙන් නිකුත් වන හඬම නිසා ඉහළ ගුණාත්මක භාවයකින් යුතුව නිර්මාණ සඳහා යොදා ගත හැක. මේවා /VA+ Pluguins ලෙස හා Refils ලෙස ද නිකුත් වී ඇත. සමහර Workstation Softwear සඳහා Vst පරිගණකයේ ස්ථාපිත කර භාවිතයට ගත යුතුය.

Sound font හා Reflls බොහෝ විට භාවිත කරනු ලබන්නේ Reason and fruity Loops මෘදුකාංග සමඟයි. Piano Refils, Sonc Refils, Refils, Hollwood drum groovc ආදී වශයෙන් විශාල Refils සංඛ්‍යාවක් දක්නට ඇත.

Halion, verfual, Giutar, Real, Giutar, Nexus, Editrall, Ocastya, ආදිය හඳුන්වා දිය හැක.

ඇමුණුම අංක 02

Multi Track Recording සඳහා යොදා ගත හැකි මෘදුකාංග බොහොමයකි. 2013 Sony Music ආයතනය මගින් කරන ලද සමීක්ෂණයට අනුව බහුලවම භාවිත වන මෘදුකාංග වන්නේ Logicpvo cubage යන මෘදුකාංගයි. මීට අමතරව Reason, Sonar ආදී මෘදුකාංග පටිගත කරීමට නොව ගීත ගොඩනැගීම සඳහා පමණක් නිර්මාණය වී ඇත. ඉහත නම්වල මෘදුකාංග වලින් ගීත, සංගීත ඛණ්ඩ නිර්මාණය මෙන්ම, පටිගත කිරීම, සංයෝජනය, මාස්ටර් කිරීම යන සියළු කාර්යයන් කළහැකි මෘදුකාංග වේ.

Multi Track Recording

එක් එක් භාණ්ඩය වෙන වෙනම පටිගත කිරීමයි. උදාහරණයක් ලෙස

| | |
|---|---|
| Kick | Rhythm Guitar |
| Snear | Leadguitar |
| HiHats | Percutions |
| Toms | Flute |
| Cymbles | Violin |

ආදී වශයෙන් වෙන වෙනම ඇසිය හැකි සංස්කරණ කළහැකි හඬ අඩුවැඩි කළ හැකි අයුරින් පටිගත කිරීමයි. මෙය එක් වරම සියල්ලන් වාදනය කරමින් හෝ තනි තනිව Track එකින් එක වාදනය කරමින් හෝ යන දෙයාකාරයෙන්ම පටිගත කළ හැක. එනම් මුලින්ම Drums Track එක වාදනය කොට පටිගත කර ඉන් පසුව අනිකුත් භාණ්ඩ වාදනය කළ හැක. ඉන් පසුව තවත් සංගීත භාණ්ඩයක් වශයෙන් වෙන් වෙන්ව පටිගත කිරීම Multi Track Recording යනුවෙන් හැඳින්වේ. තව දුරටත් විස්තර සෙවීමට Google හි සෙවුම් කවුළුව මත What is Multi Track Recording යනුවෙන් සටහන් කර පිරික්සා බලන්න.

# අන්තර්ජාලය භාවිතයෙන් සංගීතය අධ්‍යයනය.

**නිපුණතාව 0.9** : සංගීතයේ මෙවලම් භාවිතය සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වර්ධනය කර ගැනීම.

**නිපුණතා මට්ටම 0.9.2** : පරිගණකය උපයෝගී කර ගනිමින් විවිධ සංගීත ක්ෂේත්‍ර ඇසුරු කිරීමේ හුරුව ලබයි.

**ක්‍රියාකාරකම** 0.9.1.1 : අන්තර්ජාලය හා සංගීතය (ඉන්දියානු හා ලෝක සාගීතය)

**කාලච්ඡේද සංඛ්‍යාව** : කාලච්ඡේද 02

**ඉගෙනුම් පල** :
- අන්තර්ජාලය තුළින් සංගීතය දැනුම ලබා ගතහැකි බව වටහා ගනී.
- තමන්ට අවශ්‍ය දැනුම තිබෙන තැන් සොයා ගැනීමට ක්‍රම හඳුනා ගනී.
- නිවැරදි දැනුම සොයා ගත හැකි අයුරු සහ ඒවා ලබා ගත හැකි අයුරු පිළිබඳ අවබෝධ කොට ගනී.
- ලොව ඕනෑම සංගීත ක්‍රමයක් පිළිබඳ අවබෝධය ලබා ගැනීමට අන්තර්ජාලය තුළින් හැකි බව පිළිගනී.

**ගුණාත්මක යෙදවුම්:**
- අන්තර් ජාලය සම්බන්ධ පරිගණකයක් හෝ පරිගණක විද්‍යාගාරය.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම් සඳහා උපදෙස් :**

- අන්තර්ජාලය යනු ඔබ දන්නා අයගේ විශ්වීය දැනුමට පිවිසිය හැකි මාර්ගයයි. ඕනෑම පුද්ගලයකුට ඇවැසිනම් ඕනෑම කාරණයක් පිළිබඳව හැදෑරීමට අන්තර්ජාලය මගින් පුළුවන. සංගීතයට ද එය පොදුය. අවශ්‍ය වන්නේ නිවැරදිව දැනුම තිබෙන ස්ථාන හඳුනා ගැනීමටත්, ඒවා පරිශීලනය කරන අයුරු හඳුනා ගැනීමටත්ය. අද ලංකාවේ ප්‍රවීණ වෘත්තීය මට්ටමේ සමහර ගිටාර් වාදකයන් පවා ගිටාර් වාදනය කිසිම ගුරුවරයෙකුගෙන් හදාරා නොමැත. ඔවුන් ගිටාර් වාදනය ඉගෙනගෙන ඇත්තේ අන්තර්ජාලය ඇසුරෙන් පමණි. ඔබට පෙරදිග ප්‍රස්තාර මෙන්ම බටහිර සංගීත ප්‍රස්තාර ද මැනවින් කියවමින් වාදනය කළ හැකිය.

පාඩම සංවර්ධනය

**පියවර 01** • පරිගණකයෙන් අන්තර් ජාලයට පිවිසීම පිණිස www.google.lk යනුවෙන් Link Adress එක ඇතුළු කොට google Search කොටුවට පිවිසෙන්න. How to Train my voice - youtube යනුවෙන් සටහන් කරන්න. එවිට කටහඬ පුහුණු කරන අයුරු කියැවෙන වීඩියෝ විශාල ප්‍රමාණයක් ඔබට පෙන්නුම් කරයි. මේවා කිහිපයක් දරුවන්ට නැරඹීමට සලස්වන්න. නැවතත් google.lk වෙත පිවිස How to play key board යනුවෙන් Type කොට එන වීඩියෝවන් කිහිපයක් දරුවන්ට පෙන්වන්න. දරුවන් සමඟ මේවා පිළිබඳ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02** • ඉහත ආකරයෙන් අපට සංගීතය පිළිබඳ බොහෝ දේ අන්තර් ජාලය තුළින් ඉගෙනගත හැකි බව දරුවන් සමඟ සාකච්ඡා කොට පහත වැකි අන්තර්ජාලය තුළ සෙවීමට උපදෙස් ලබා දෙන්න.

1. Gazal
2. Opera
3. Rag Bhoopali chota kheyal
4. Symphony
5. Swan lake (Ballet)
6. Tumri
7. How to play guitar
8. How to play violin

(මිනිත්තු 30)

පියවර 03 : You tube හි සමහර පාඩම් 1, 2, 3, ....... ආදී අනුපිළිවෙලින් ඇත. මේවා You tube Downloder වැනි මෘදුකාංගයන් භාවිත කොට පරිගණකයකට ගබඩා කර ගැනීමට (Download කර ගැනීමට) පවසන්න. ඔවුන් සොයා ගත් කරුණු පිළිබඳව අදහස් විමසන්න. සාකච්ඡා කරන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- අන්තර් ජාලය සංගීත අධ්‍යාපනයට යොදා ගතහැකි ආකාරය පිළිබඳ තමන් සොයා ගත් කරුණු ඉදිරියට පැමිණ පැවසීමට අවස්ථාව ලබා දී අගයන්න.

**පසු අභ්‍යාස** අන්තර්ජාලයෙන් කරුණු සොයා (යම් කිසි භාණ්ඩයක් නිර්මාණය කරන ආකාරය) පොතක් සෑදීමට උපදෙස් දෙන්න.

**ගුරුවරයාට උදව් :-** අන්තර් ජාලය පිරික්සන්න.
I.T ගුරුවරයාගෙන් උපදෙස් ලබා ගන්න.

# වාර්ෂික විවිධ ප්‍රසංගය

**නිපුණතාව 3.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන හා ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.4** : ලබා ගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසංගික ව ඉදිරිපත් කරමින් සතුට ලබයි.

**ගුණාත්මක යෙදවුම්:**

- එක් එක් ප්‍රාසංග අංකයට ගැළපෙන ලෙස සකස් කර ගත් ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ
- වාද්‍ය භාණ්ඩ

**ඉගෙනුම් පල:**

- ප්‍රාසංගික අත්දැකීම් ලබමින් සතුටු වෙයි.
- සංගීත විෂය ඉගෙනීමෙන් තෘප්තිමත් වෙයි.
- වේදිකාව පරිහරණය පිළිබඳ අත්දැකීම් ලබයි.
- විවිධ පෞරුෂ ගුණාංග වර්ධනය කර ගනියි.
- ගායන වාදන තනි ව ඉදිරිපත් කිරීමට පෙලඹෙයි.
- මෙතෙක් උගත් ගායන වාදන හැකියා ප්‍රාසංගික ව ප්‍රදර්ශනය කරයි.
- ඉදිරිපත් වීම, සංවිධානය හා මෙහෙයවීම වැනි ගුණාංග ප්‍රගුණ කරයි.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

පාසල් වේදිකාවේ ප්‍රාසංගික අවස්ථාවකට සහභාගී වීමට සිසුහු කැමැත්තක් දක්වති. එයින් ඔවුන් තුළ පෞරුෂ ගුණාංග රාශියක් වර්ධනය වනු ඇත. එබැවින් සෑම විට ම විශේෂ තෝරා ගැනීමක් නොකර සියලු ම සිසුන්ටද සහභාගී වීමට අවස්ථාව ලැබෙන පරිදි පාසල් විවිධ ප්‍රසංගය සැලසුම් කර ගැනීම ගුරුවරයාගේ වගකීමකි. පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ සටහනට ගැළපෙන ලෙස කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ලකුණු පිරිනැමීමක් ද කළ හැකි ය. මෙහි දී මහා පරිමාණයේ විවිධ ප්‍රසංගයක් පැවැත්වීම ම අරමුණු කර නැත. එබැවින් පහත දැක්වෙන කරුණු ඔබට මේ සඳහා උපකාර වනු ඇත.

- මෙතෙක් 10 වන ශ්‍රේණිය දක්වා පෙරදිග සංගීතය විෂය නිර්දේශයෙහි උගත් ක්‍රියාකාරකම් ඇසුරෙන් විවිධ ප්‍රසංගයට සුදුසු ප්‍රාසංග අංක පුහුණු කළ හැකි ය.

- ශ්‍රේණි මට්ටමින් වෙන වෙනම විවිධ ප්‍රසංගය පැවැත්වීම හෝ සියලු පන්ති සහභාගී කර ගනිමින් එක් විවිධ ප්‍රසංගයක් පාසල තුළ පැවැත්වීම.

- වේදිකාවේ ප්‍රාසංගික අත්දැකීම් ලැබෙන පරිදි අවම වශයෙන් පාසල් නිල ඇඳුමින් හෝ ගායන, වාදන, රංගන අයිතමවලට සිසුන්ට ඉදිරිපත් වීමට අවස්ථාව ලබාදීම.

- කාලය, ඉඩකඩ, පහසුකම් ප්‍රමාණවත් පරිදි වර්ෂය තුළ ලබාගත නොහැකි වූයේ නම් පාසල තුළ ඉඩකඩ ඇත. ස්ථානයක අනෙක් ගුරු භවතුන් සහ දෙමාපියන් ඉදිරියේ කේවල සහ සාමූහික ප්‍රසංග ලෙස කෙටි සංදර්ශනයක් පවත්වා සිසුන් අගය කිරීම සහ ධෛර්යමත් කිරීම කළ හැකි ය. සුදුසු පරිදි ළමුන් ප්‍රාසංගික අත්දැකීම් ලැබෙන අයුරින් මෙම විවිධ ප්‍රසංගය සැලසුම් කිරීමට උත්සාහ කරන්න.

- කාලච්ඡේද 5 ක් යනු සති දෙකක කාලයකි. සිසුන් පන්ති කාමරයේ දී උගත් සංගීතමය ප්‍රායෝගික අංග ඇසුරින් කිසියම් තේමාවකට ගැළපෙන ලෙස කණ්ඩායම් වශයෙන් හෝ ඒකල ව වේදිකාවේ රඟ දැක්වීමට සුදුසු ගායන, වාදන, නාට්‍ය, අංග කණ්ඩායම වශයෙන් පුහුණු කර ගැනීමටත්, විවිධ ප්‍රසංගය සැලසුම් කිරීමටත් මෙම කාලච්ඡේද 05 යොදා ගැනේ. වැඩි පිරිසක් යොදා ගැනීම වඩාත් සුදුසු ය. පහත දැක්වෙන කරුණු පිළිබඳ ගුරුවරයා සැලකිලිමත් විය යුතු වේ.

- 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සියලුම පන්ති එක් දිනක දී යොදා ගන්නේ නම් උපරිම අන්දමින් පැය දෙකහමාරක පමණ කාලයකට ගැළපෙන ලෙස ප්‍රසංගය සඳහා ප්‍රසංග අංක ලැයිස්තුවක් පිළියෙල කිරීමට සිසුන් දායක කර ගැනීම.

- එක් එක් ශ්‍රේණිවල සිසුන්ට වැඩ බෙදා දීම.

- පොදු වාදක මණ්ඩලයක් සෑම ප්‍රසංග අංකයක් සඳහා ම යොදා ගැනීම හා ගුරුභවතුන්ගේ සහාය ලබා ගැනීම.

- පන්ති කාමරයේ අධ්‍යයනය කළ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලට මුල් තැනක් ලබා දීම.

- බාහිර සම්පත් පුද්ගලයන් සහභාගී කර නොගෙන පාසලේ සිසු - ගුරු සම්පත්වලින් පමණක් සරල ව ප්‍රසංගය පැවැත්වීම.

- සරල ප්‍රසංග අංකවලින් ආරම්භ කිරීම.

- පාසල් වේදිකාව භාවිත කරන්නේ නම් ඒ සඳහා සුදුසු සැලසුමක් පිළියෙල කර වේදිකා පරිපාලනයට කණ්ඩායමක් යෙදවීම.

- ප්‍රේක්ෂක පිරිස පිළිබඳ අවධානය යොමු කරමින් අසුන් පැනවීම.

- පිළිගැනීම වැනි කාර්යයන් සඳහා ද සිසුන් යොමු කිරීම.

එක් එක් ශ්‍රේණියට ගැළපෙන ලෙස පන්ති කාමරයේ අධ්‍යයනය කළ කොටස් ඇසුරින් ප්‍රසංග අංක සැකසීම යන කාරණය පිළිබඳ වැටහීමක් ලබා ගැනීමට පහත දැක්වෙන ක්‍රියාකාරකම් ඔබට මග පෙන්වනු ඇත.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 01**
- විවිධ ප්‍රසංගයකට ඉදිරිපත් වීමෙන් ශිෂ්‍යයාට ලැබෙන වාසි පිළිබඳ ව සාකච්ඡා කරන්න. (මිනිත්තු 10)

**පියවර 02**
- තෝරාගත් ප්‍රසංග අංක පුහුණු කරන්න. (මිනිත්තු 30)
- තෝරාගත් ප්‍රසංග අංක පුහුණු කරන්න. (මිනිත්තු 40)

**පියවර 03**
- කණ්ඩායම් වශයෙන් හෝ කේවල ව වේදිකාවේ හෝ පන්ති කමරයේ සලස්වන්න. (මිනිත්තු 40)
- ස්වර නියමිත නාදස්ථාන අනුව ගායනයට යොමු කරන්න. සුදුසු අංග චලන ප්‍රාසංගික ව යොදා ගන්න. (මිනිත්තු 40)
- මෙම පන්තියට යෝජිත කොටසේ සමස්ත නිමාව ඉදිරිපත් කර අගයන්න. (මිනිත්තු 30)

**ඇගයීම් හා තක්සේරුකරණය :**

- කණ්ඩායම් ලෙස හෝ කේවල ව අගය කර ලකුණු ප්‍රදානය කරන්න.

(මිනිත්තු 10)

**පසු වැඩ :**

- විවිධ ප්‍රසංගයක දී ඉටු කළ යුතු වැඩ කොටස් ලැයිස්තුවක් සිසුන් ලවා පිළියෙල කරවන්න.
- මෙවැනි ප්‍රසංගයක් සාර්ථක ව ඉදිරිපත් කිරීමට තව දුරටත් කළ යුතු සංවිධානාත්මක වැඩ කණ්ඩායම් වශයෙන් සාකච්ඡා කරන්න.

**අතිරේක උදව් :**

- 2007 - 10 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

නිමි.